
# අපේ උත්තර පොත



‘විනයො නාම සාසනස්ස ච ආයු’

# උපසම්පදාව

# උපසම්පදාව

## ① උපසම්පදාව යනු කුමක්ද?

'නවකෝටිසහස්සානි නාදීනං ත්‍රිණාපඤ්ඤාසුපදානං අනෙක සහස්සානං සංවර විනයානං සමාදියිත්වා වත්තනෙන උපගන්තා අගොසන්තා සම්පදාති උපසම්පදා'

නවකෝටි සහස්සාදී යනාදීන් දක්වා ලද ප්‍රභේද ඇති අනේක සහස්‍ර සංවර විනයන් සමාදන්ව පැවැත්ම ශාසනයේ උසස් වූ අග වූ සම්පදාව උපසම්පදා-වයි.

## ② උපසම්පදා වර්ග කීයද? ඒ මොනවාද? ඒවා කවුරුන් උදෙසා පැනවූයේද?

08 යි.

| | |
|---|---|
| ඒහි භික්ෂු උපසම්පදාව | පස්වග මහණුන් උදෙසා |
| සරණාගමන උපසම්පදාව | රාහුල තෙරුන් වහන්සේ උදෙසා |
| ඕවාද පටිග්ගහණ උපසම්පදාව | මහා කාශ්‍යප තෙරුන් වහන්සේ උදෙසා |
| පඤ්හාව්‍යාකරණ උපසම්පදාව | සෝපාක තෙරුන් වහන්සේ උදෙසා |
| ගරුධම්ම පටිග්ගහණ උපසම්පදාව | ප්‍රජාපතී ගෝතමිය ඇතුළු 500 පිරිස උදෙ |
| දූතෙන උපසම්පදාව | අඩ්ඪකාසී ගණිකාව උදෙසා |
| අට්ඨවාචික උපසම්පදාව | භික්ෂුණී සංඝයා උදෙසා |
| ඤත්ති චතුත්ථ කම්ම උපසම්පදාව | වර්තමාන භික්ෂු සංඝයා උදෙසා |

## ③ උපසම්පදා වීමට අවශ්‍ය සුදුසුකම් මොනවාද?

* විසිවයස් සම්පූර්ණ වීම.
* ඒකාදශ අභව්‍ය පුද්ගලයකු නොවීම
* පරිපූර්ණ පාත්‍ර සිවුරු තිබීම.
* උපාධ්‍යායන් වහන්සේ නමක් සිටීම.
* දෝෂ රහිත පිරිසිදු සීමාවක් තිබීම.

* මධ්‍ය දේශයෙහි නම් විනයධරයන් ලබාගත් දසවර්ගික සංඝයාද, ප්‍රත්‍යන්ත දේශයක නම් විනයධරයන් ලබාගත් පංච වර්ගික සංඝයාද සිටිය යුතු අතර

සියලු කර්ම සාරයා පිළිබඳ උපෝසථය, ඇති අය බිය යුතුය.

* කර්ම මාතෘකා දොළොස් රත්නය පිළිබඳව නැවරදිව නිර්නාමය කළ යුතුය.

(04) <u>ජීනදත්ත අසාමාන්‍ය පුද්ගලයන් නම් කරන්න.</u>

පරකඩකො
ශ්‍රේෂ්ඨ සෙවකයො
තිරශ්චීන ජනකාන නෙකො
උපාසකොපාසකයනකො
මාතෘ පිතෘකො
මිත්‍ර ඥාතකො
ආර්ය ආනාක්‍රිකකො
නිමිත්ත පුත්‍රකො
ලොකිතශ්‍රද්ධකො
නිර්වාණතා

(05) <u>උපෝසථය පිළිබඳ අතුරු තැපැද්දිම සඳහන් කරන්න.</u>

පළමුව බුදුරජ ජීනයන කොට උපෝසථය අපේක්ෂකයා උපාසකයෝ විය කළ යුතු අනතුරුව අෂ්ටාංගික ධර්ම විචාරණ ලබා අතර බුද්ධ සරණාට වන්දනා කොට උත්තමයෝන් සිද, පහත වාක්‍ය සහ උපෝසථය පිළිගත යුතුය.

'සංඝං සරණං උපෝසථං යාචාමි උපලභතු, එං සරණං සංඝං අනුකම්පං උපාදාය'

'දුතියම්පි සරණං සංඝං උපෝසථං යාචාමි උපලභතු, එං සරණං සංඝං අනුකම්පං උපාදාය'

'තතියම්පි සරණං සංඝං උපෝසථං යාචාමි උපලභතු, එං සරණං සංඝං අනුකම්පං උපාදාය'

06 ඤත්ති චතුත්ථ කම්ම උපසම්පදාව හැඳින්වීම් කරන්න.

එක්වරක් ඤත්තියේ තැබීමෙන් අනතුරුව අනුසාවනය (කර්ම වාක්‍යය) තෙවරක් කීමෙන් සිදුකරනු ලබන උපසම්පදාව ඤත්ති චතුත්ථ කම්ම උපසම්පදාවයි.

මෙහිදී, වත්ථු සම්පත්ති, ඤත්ති සම්පත්ති, අනුසාවන සම්පත්ති, සීමා සම්පත්ති, පරිස සම්පත්ති යන පංචවිධ සම්පත්තීන්ගෙන් පරිපූර්ණ වන ලෙසට සිදුවිය යුතුය.

07 උපසම්පදාව 'කෝප්‍ය නොවේ' පහදන්න.

උපසම්පදාව අකෝප්‍ය වීම සඳහා වත්ථු සම්පත්ති, ඤත්ති සම්පත්ති, අනුසාවන සම්පත්ති, සීමා සම්පත්ති, පරිස සම්පත්ති යන පංචවිධ සම්පත්තීන්ගෙන් පරිපූර්ණ වන ලෙසට සිදුකල යුතුය. එනම්

* වත්ථු සම්පත්තිය.

විසි වසක් පිරුණු වූ, ඒකාදශ අභව්‍ය පුද්ගලයකු නොවූ, පාරාජිකාපන්නයකු නොවූ උපසම්පදාව අපේක්ෂක පුද්ගලයා සිටිය යුතුය.

* ඤත්ති සම්පත්තිය

වත්ථු අපරාමසන, සංඝ අපරාමසන, පුග්ගල අපරාමසන, ඤත්ති අපරාමසන, පච්ඡා ඤත්ති ඨපන අපරාමසන යන පංචවිධ අපරාමසනයන්ගෙන් මිදී, නිවැරදිව පිරිසිදුව ඤත්තිය කීර්තනය කල යුතුය.

* අනුසාවන සම්පත්තිය

වත්ථු අපරාමසන, සංඝ අපරාමසන, පුග්ගල අපරාමසන, සාවන හාපන අපරාමසන, අකාල සාවන අපරාමසන යන පංචවිධ අපරාමසනයන්ගෙන් විනිර්මුක්තව නිවැරදිව පිරිසිදුව අනුසාවන වාක්‍යය කීර්තනය කළ යුතුය.

* සීමා සම්පත්තිය

එකොළොස්විධ සීමා විපත්තීන් මිදී, පිරිසිදු ලෙස සම්මත කරගත් සීමාවක් තිබිය යුතුය.

* පරිස සම්පත්තිය

සංඝකර්මයට සුදුසු සංඛ්‍යා අන්තරට නොඑළඹීම, ඡන්දාහරණය නොකිරීම, රාජිකානු භික්ෂූන්ගේ ප්‍රතික්ෂේපනය යන ත්‍රිවිධ දෝෂයන්ගෙන් මිදුනු කර්මයට සුදුසු සංඛ්‍යා සිටිය යුතුය.

08 උපසම්පදාව ප්‍රතික්ෂේප කරන අයුරු පැහැදිලි කරන්න.

යම් මහණෙක් සාර සාසනයේ යම් උකටලී බවක් නොඇල්මක් කලකිරීමක් ඇති වූවහොත් ඔහුට උපසම්පදාව ප්‍රතික්ෂේප කල හැකිය. සඳහා චිත්ත, ඛෙත්ත, කාල, පයෝග, පුග්ගල, විජානන යන සය කරුණු සම්පූර්ණ වන ලෙස සිදුවිය යුතුය. එනම්

* චිත්ත

මුළු සිතින්ම උපසම්පදාව අතහරින සිත තිබිය යුතුය.

* ඛෙත්ත

ප්‍රතික්ෂේපයේ වචනයේ 14 ආකාරයන්ද දැරීම් වශයෙන් 08 ආකාරයන්ද යන දෙවිධ ක්ෂේත්‍රයන්ගෙන් එකකින් ප්‍රකාශ කිරීම.

* කාල

මෙය වර්තමාන කාලයෙන්ම කිය යුතුය.

* පයෝග

මෙය වචනයෙන්ම කිය යුතුය

* පුග්ගල

ප්‍රතික්ෂේප කරන්නා හා අසන්නා යන දෙදෙනාම පිරිමි සිහිය ඇති උම්මත්තක ආදී අය නොවිය යුතුය.

* විජානන

අසන්නා ප්‍රතික්ෂේපණය සහ අර්ථය දැනගත යුතුය.

# ප්‍රාතිමෝක්ෂය

## 01. ප්‍රාතිමෝක්ෂය යනු කුමක්ද ?

භික්ෂූවක් විසින් රක්නා ශීලය ප්‍රාතිමෝක්ෂය වන අතර සූය බුදුඝෝෂ හිමියන් විසින් ප+අතිමොක්ඛං, අතිපමොක්ඛං, අති උත්තමං, අති සෙට්ඨං ආදී ලෙස අර්ථ දක්වන ලදී. එනම් කුසල ධර්මයන්හි අති ප්‍රමුඛ අති උත්තම අති ශ්‍රේෂ්ඨ යන අර්ථයෙනි. මෙය ප්‍රධාන වශයෙන් ශීල ප්‍රාතිමෝක්ෂය හා ග්‍රන්ථ - ප්‍රාතිමෝක්ෂය ලෙස දෙවැදෑරුම් වේ.

'ආදිමෙතං, මුඛමෙතං, පමුඛමෙතං කුසලානං ධම්මානං තෙන වුච්චති පාතිමොක්ඛං'
ලෙස ශීල ප්‍රාතිමෝක්ෂය ද,

'උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති'
ලෙස ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය ද දක්වන ලදී.

## 02. ප්‍රධාන වශයෙන් ප්‍රාතිමෝක්ෂය කී වැදෑරුම්දැයි දක්වා පැහැදිලි කරන්න.

ප්‍රාතිමෝක්ෂය ප්‍රධාන වශයෙන් දෙවැදෑරුම් වේ. එනම් ශීල ප්‍රාතිමෝක්ෂය හා ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය ලෙසය.
'ආදිමෙතං, මුඛමෙතං, පමුඛමෙතං කුසලානං ධම්මානං තෙන වුච්චති පාතිමොක්ඛං'
යනාදි පැවසීම ශීල ප්‍රාතිමෝක්ෂය ද,
'උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති'
යනාදි පැවසීම ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය ද ප්‍රකට වේ.

ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය තවදුරටත් භික්ෂු ප්‍රාතිමෝක්ෂය හා භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය ලෙස දෙකට බෙදී යයි. භික්ෂු ප්‍රාතිමෝක්ෂය උද්දේස පහක් යටතේ ශික්ෂාපද 220 ක් ද, සමථ අධිකරණ සතක් ද සංග්‍රහිත වන අතර භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය උද්දේස සතරක් යටතේ ශික්ෂාපද 304 ක් හා සමථ අධිකරණ සතකින් සංග්‍රහ වේ.

තවද ප්‍රාතිමෝක්ෂය ඕවාද ප්‍රාතිමෝක්ෂය හා ආණා ප්‍රාතිමෝක්ෂය ලෙසද බෙදා දක්වනු ලැබේ. ඕවාද ප්‍රාතිමෝක්ෂය යනු මුල් යුගය තුළ 'සබ්බ පාපස්ස අකරණං', 'ඛන්ති පරමං තපො තිතික්ඛා', 'අනූපවාදො අනූපඝාතො'

යනාදී, ලෙස සංඝයා හට අවවාදාත්මක ලෙස දේශනා කරන ලද්දා වූ ගාථා යි. අන්‍ය ප්‍රාතිමෝක්ෂය යනු අවවාදාත්මක ශීලාචාරයෝන් බැහැරව ආඥා පැනවීම් වශයෙන් පසුව දේශනා කරන ලද සික්ඛාපද සමූහයයි.

(3) ප්‍රාතිමෝක්ෂය කී වැදෑරුම්ද, ඔවුන්ට අයත් සික්ඛාපද කොපමණද (වෙන වෙනම දක්වන්න.

දෙවැදෑරුම් වේ.

භික්ෂු ප්‍රාතිමෝක්ෂය

| | |
|---|---|
| සික්ඛාපද | 220 |
| සමථ අධිකරණ | 07 |
| | 227 |

භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය

| | |
|---|---|
| සික්ඛාපද | 304 |
| සමථ අධිකරණ | 07 |
| | 311 |

| | |
|---|---|
| සික්ඛාපද | 524 |
| සික්ඛාපද, සමථ, අධිකරණ සමග | 538 |

(4) භික්ෂු ප්‍රාතිමෝක්ෂයට අයත් උද්දේස මොනවා දක්වන්න.

නිදානුද්දේසය
පාරාජිකානුද්දේසය
සංඝාදිසේසුද්දේසය
අනියතුද්දේසය
විත්ථාරුද්දේසය.

05. භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ ඇති භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයේ නැති උද්දේශය නම් කරන්න.

අනියත උද්දේශය.

06. සම්මුති සංඝයා පස්වැදෑරුම් වේ. නම් කරන්න.

චතු වර්ගික සංඝයා
පංච වර්ගික සංඝයා
දස වර්ගික සංඝයා
විසති වර්ගික සංඝයා
අතිරේක විසති වර්ගික සංඝයා.

07. සතර සංවර සීලය නම් කරන්න.

ප්‍රාතිමෝක්ෂ සංවර සීලය
ඉන්ද්‍රිය සංවර සීලය
ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලය
ආජීව පාරිශුද්ධි සීලය.

08. ආදිබ්‍රහ්මචරියක සීලය හා ආභිසමාචාරික සීලය හඳුන්වන්න.

ආදිබ්‍රහ්මචරියක සීලය

සත්ත ආපත්තික්ඛන්ධ අතුරින් පාරාජිකා පාළියෙහි සහ පාචිත්තිය පාළියෙහි සඳහා උභය ප්‍රාතිමෝක්ෂයට අයත් පාරාජිකා, සංඝාදිසේස, ථුල්ලච්චය, පාචිත්තිය පාටිදේසනීය යන පංච ආපත්තික්ඛන්ධ යටතේ සඳහන් වන සික්ඛාපද සමූහය හෙවත් ප්‍රාතිමෝක්ෂය ආදිබ්‍රහ්මචරිය සීලය නම් වේ.

ආභිසමාචාරික සීලය.

සත්ත ආපත්තික්ඛන්ධ අතුරින් චුල්ලවග්ග පාළි, මහාවග්ග පාළි, පරිවාර පාළි යෙහි සඳහා උභය ප්‍රාතිමෝක්ෂයට අයත් නොවූ දුක්කට, දුබ්භාසිත යන

ආපත්තිස්කන්ධ දෙක යටතේ සඳහන් සිකපද සමූහය ආභිසමාචාරික සීලයයි

(අ) භික්ෂු පාතිමොක්ඛයෙහි ඇති සිකපද උද්දේශ ලෙස හා වර්ග ලෙස දක්වන්න.

| | | | | |
|---|---|---|---|---|
| | | | | නිදානුද්දේසය • |
| | | | | |
| පාරාජිකා | | | 04 | පාරාජිකානුද්දේසය |
| | | | | |
| සංඝාදිසේස | | | 13 | සංඝාදිසේසුද්දේසය |
| | | | | |
| අනියත | | | 02 | අනියතුද්දේසය |
| | | | | |
| නිසැගි පචිති | | | 30 | |
| | චීවර වර්ගය | 10 | | |
| | කෝසිය වර්ගය | 10 | | |
| | පත්ත වර්ගය | 10 | | |
| | | | | |
| ශුද්ධ පචිති | | | 92 | |
| | මුසාවාද වර්ගය | 10 | | |
| | භූතගාම වර්ගය | 10 | | |
| | භික්ඛුනෝවාද වර්ගය | 10 | | |
| | භෝජන වර්ගය | 10 | | |
| | අචේලක වර්ගය | 10 | | |
| | සුරාපාන වර්ගය | 10 | | විත්ථාරුද්දේසය |
| | සප්පාණක වර්ගය | 10 | | |
| | සහධම්මික වර්ගය | 12 | | |
| | රාජ වර්ගය | 10 | | |
| | | | | |
| පාටිදේශනීය | | | 04 | |
| | | | | |
| සේඛියා | | | 75 | |
| | පරිමණ්ඩල වර්ගය | 10 | | |
| | උජ්ජග්ගික වර්ගය | 10 | | |
| | ඛම්භකත වර්ගය | 10 | | |
| | සක්කච්ච වර්ගය | 10 | | |
| | කබළ වර්ගය | 10 | | |
| | සුරු සුරු වර්ගය | 10 | | |
| | පාදුකා වර්ගය | 15 | | |
| | | | | |
| අධිකරණ සමථ | | | 07 | |
| | | | **227** | |

# පුබ්බකරණ

# පුබ්බකිච්ච

# පත්තකල්ල

(01) පුබ්බකරණ, පුබ්බකිච්ච, පත්තකල්ල හඳුන්වා දෙන්න.

පුබ්බකරණ

උපෝසථය ඇරඹීමට පෙර සිදුකල කාර්යය සකාරණ වන ආකාර මෙවා පුබ්බකරණ නම් වේ.

සම්මජ්ජනී පදීපෝ ච - උදකං ආසනේන ච
උපොසථස්ස එතානි - පුබ්බකරණන්ති වුච්චති

සම්මජ්ජනී
උපෝසථාගාරය අතුගා හා පිටත ඇමඳ පිරිසිදු කල යුතුය.

පදීපෝ ච
උපෝසථය පවත්වනුයේ රාත්‍රියක නම් පහන් දැල්විය යුතුය.

උදකං
උපෝසථාගාරයට පැමිණෙන ආගන්තුක භික්ෂූන් සඳහා පානීය හා පරිභෝජනය සඳහා පැන් ගොටුත් තැබිය යුතුය.

ආසනේන ච
උපෝසථාගාරයට පැමිණෙන භික්ෂූන් සඳහා අසුන් පනවා තැබිය යුතුය.

පුබ්බකිච්ච

උපෝසථ කර්මයට භික්ෂූන් රැස්වූවායින් අනතුරුව ප්‍රාතිමෝක්ෂ සජ්ඣායනට පෙර සිදුකල යුතු කාර්යය පහත් වන ආකාර මෙවා පුබ්බකිච්ච නම් වේ.

ඡන්ද පාරිසුද්ධි උතුක්ඛානං - භික්ඛුගණනා ච ඔවාදො,
උපොසථස්ස එතානි - පුබ්බකිච්චන්ති වුච්චති

ඡන්ද පාරිශුද්ධි
කලින් උපෝසථය කර පැමිණි ආගන්තුක භික්ෂූන් වෙත් නම් ඔවුන්ගෙන්ද, ගිලන් හා ගිලානෝපස්ථාක වැනි [illegible] උදෙසීමට

සහභාගී විය නොහැකි භික්ෂූන්ගේද ඒ සඳහා ඡන්දය හා පිරිසිදු බව ගෙන ආ යුතුය.

ඍතු

පොහොය කරන අවස්ථාව වනවිට පවතින ඍතුවත් ඇති මුළු පක්ෂ (පොහොය) ගණනත් ඇති ගතවී ඇති සහ ඉදිරියට ඉතිරිවී ඇති පොහොය ගණනත් උදාවූ පොහොයත් සලකා ඇති බවත් ප්‍රකාශ කළ යුතුය.

භික්ෂු ගණනාව

උපෝසථාගාරයට රැස්වූ භික්ෂූන් ගණන නමින් උදෙසීම පළමුව ගණනය කළ යුතුය.

ඔවාදෝ

භික්ෂුණී සංඝයා විසින් අවවාද ලබාගැනීම සඳහා භික්ෂු සංඝයා වෙත කර ඇති ඉල්ලීම සැලකිරීම.

පත්තකල්ල

උපෝසථ කර්මයට සුදුසු කාලය අංග සතරකින් සමන්විත විය යුතු අතර එය පත්තකල්ල නම් වේ.

උපොසථො යාවතිකාව භික්ඛු කම්මපත්තා සභාගාපත්තියො ච න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති

උපොසථො

චාතුද්දසී පන්නරසී ආදී පොහොය දිනයක් සලකා තිබීම.

යාවතිකාව භික්ඛු

ප්‍රමාණවත් භික්ෂු පිරිසක් උපෝසථ කර්මයට පැමිණ සිටීම හා අන්වසම සලකා සිටීම.

කම්මපත්තා සභාගාපත්තියොච

කර්මප්‍රාප්ත සඟු සංඝයා වේද සභාගාපත්තියකට පැමිණ නොනිමි

න විජ්ජනති වජ්ජනීයාච පුග්ගලා

දුරු කළයුතු වර්ජනීය පුද්ගලයින් අවර්ජිත් නැගැරකොට තබම.

(02) නවවිධ උපෝසථය හැඳින්වීම කරන්න.

දින වශයෙන්

චාතුද්දසී
පන්නරසී
සාමග්ගී

චාතුද්දසී

පෑලවියෙහි පටන් තිථි තුදුසක් (14) ගෙනා චාතුද්දසිය සුදුසු. වර්ෂකට සෘතු 03ක් වන අතර සෑම සෘතුවකටම පොහොය අටක. ඉන් සෑම සෘතුවකම තුන්වන හා හත්වන පොහොය චාතුද්දසී වේ. එහෙයින් වර්ෂකට චාතුද්දසී පොහොය හයකි.

පන්නරසී

පෑලවියෙහි පටන් තිථි පසළොසක් ගතවන කල පන්නරසිය සුදුසි. චාතුද්දසී පොහොය හය හැරුණු විට ඉතිරි පොහොය 18 පන්නරසී වේ.

සාමග්ගී

යම් කලෙක භින්න සංඝයා සමඟ සමගිවන්නා වූ විට එම සමඟි වූ දිනයේ සිදුකරන උපෝසථය සාමග්ගී උපෝසථයයි.

පුද්ගල වශයෙන්.

සංඝ
ගණ
පුද්ගල

සංඝ

උපසම්පන්න භික්ෂූන් සතර නමක් හෝ ඊට වැඩි පිරිසක් උපෝසථාගාරයට රැස්ව සිදුකරනු ලබන උපෝසථයයි.

ගණ

උපෝසථ දින උපෝසථාගාරයට ප්‍රමාණවත් සංඝ පිරිසක් රැස් නොවුනිවෙක, භික්ෂූන් තෙනමක් හෝ දෙනමක් නම් සිදුකරනු ලබන උපෝසථයයි.

පුද්ගල

භික්ෂු නමක් තමාත් සිටිනවිට සිදුකරනු ලබන උපෝසථයයි.

ආකාර වශයෙන්

සුත්තුද්දේස
පාරිසුද්ධි
අධිට්ඨාන

සුත්තුද්දේස

සතර නමක් හෝ ඊට වැඩි සංඝ පිරිසක් රැස්ව පාමොක් උදෙසීම වශයෙන් සිදුකරනු ලබන උපෝසථය මෙයයි.

පාරිශුද්ධි.

චිත්තක්ලේශ යට ප්‍රඥාවත් සහ පිරිසිදු කෙලෙසුන්ට සිද්ධාන්තයේ කොතරම් හෝ දෙනමක් නම් පිරිශුද්ධිය ප්‍රඥාව කරගැනීම වශයෙන් සිදුකරනු ලබන උත්සාහය වෙයි. ඇතිවෙද්දී කොතෙක් නම් ශාන්තිය තබාද දෙනමක් නම් ශාන්තිය නොතබාද පිරිශුද්ධිය ප්‍රඥාව කරයි.

අධිෂ්ඨාන

යුක්ති සිතුවමක් කරන්නේ ඇත්ත විට්ක ප්‍රාර්ථනාව ආදී නමක හෙළිය ගතු සිතුන්ගේ තමන්ගම බලාපොරොත්තුව ඇති කරවන නොවෙනසේ නම් 'අද ඒතෙනය දිනයයි' යි මෙස අධිෂ්ඨාන කරගැනීම වශයෙන් සිදුකරනු ලබන උත්සාහය වෙයි.

⑧ ප්‍රව්‍රජ්‍යා වර්ජනීය පුද්ගලයින් නම් කරන්න.

ගලගණ්ඩ
කිලාසො
සිකාබෝගා
කාළකොරා
කාළකොරි
භික්ඛුනිං පබ්බජිතකාතකො
ආරක්ඛඋම්ම අප්පක්ඛජාතකො
ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො
ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො
පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො
පණ්ඩකො
ථෙය්‍යසංවාසකො
තිත්ථියපක්කන්තකො
උභතොබ්‍යඤ්ජනකො
මාතුඝාතකො
පිතුඝාතකො
අරහන්තඝාතකො
භික්ඛුනිදූසකො
ලොහිතුප්පාදකො
තිරච්ඡානගතො

04) වර්ෂයක පොහොය සටහන ලියා දක්වන්න.

<u>වසරක පොහොය සටහන</u>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| හේමන්ත | ඉල් | අව පක්ෂය | 01 | පණ්ණරසී | | මුළු වර්ෂය |
| | උඳුවප් | පූර පක්ෂය | 02 | පණ්ණරසී | | |
| | උඳුවප් | අව පක්ෂය | | චාතුද්දසී | 03 | |
| | දුරුතු | පූර පක්ෂය | 04 | පණ්ණරසී | | |
| | දුරුතු | අව පක්ෂය | 05 | පණ්ණරසී | | |
| | නවම් | පූර පක්ෂය | 06 | පණ්ණරසී | | |
| | නවම් | අව පක්ෂය | | චාතුද්දසී | 07 | |
| | මැදින් | පූර පක්ෂය | 08 | පණ්ණරසී | | |
| ගිම්හාන | මැදින් | අව පක්ෂය | 09 | පණ්ණරසී | | |
| | බක් | පූර පක්ෂය | 10 | පණ්ණරසී | | |
| | බක් | අව පක්ෂය | | චාතුද්දසී | 11 | |
| | වෙසක් | පූර පක්ෂය | 12 | පණ්ණරසී | | |
| | වෙසක් | අව පක්ෂය | 13 | පණ්ණරසී | | |
| | පොසොන් | පූර පක්ෂය | 14 | පණ්ණරසී | | |
| | පොසොන් | අව පක්ෂය | | චාතුද්දසී | 15 | |
| | ඇසල | පූර පක්ෂය | 16 | පණ්ණරසී | | |
| වස්සාන | ඇසල | අව පක්ෂය | 17 | පණ්ණරසී | | |
| | නිකිණි | පූර පක්ෂය | 18 | පණ්ණරසී | | |
| | නිකිණි | අව පක්ෂය | | චාතුද්දසී | 19 | |
| | බිනර | පූර පක්ෂය | 20 | පණ්ණරසී | | |
| | බිනර | අව පක්ෂය | 21 | පණ්ණරසී | | |
| | වප් | පූර පක්ෂය | 22 | පණ්ණරසී | | |
| | වප් | අව පක්ෂය | | චාතුද්දසී | 23 | |
| | ඉල් | පූර පක්ෂය | 24 | පණ්ණරසී | | |
| ඍතු 03 | මාස 12 | පක්ෂ 24 | | පණ්ණරසී | 18 | |
| | | | | චාතුද්දසී | 06 | මුළු පොහෝ 24 |

05. ඕවාද උපාසකයා විසින් අංග 08 කින් සමන්විත විය යුතුය. ඒ මොනවාද?


- අනුමාත්‍ර වරදෙහි බිය දක්නා සිල්වතෙකු වීම.
- ත්‍රිපිටක ධර්මය මනාව දත් බහුශ්‍රැතයකු වීම.
- උභය ප්‍රාතිමෝක්ෂයෙහි මනා අවබෝධය.
- යහපත් ප්‍රියශීලි වචන කථා කරන්නකු වීම.
- භික්ෂුණීන් බොහෝ සේ ප්‍රියමනාප අයකු වීම.
- භික්ෂුණීන්ට අවවාද දීමෙහි ශක්තිමත් ප්‍රතිබල ඇත්තෙකු වීම.
- මෙහෙණින් සමඟ ගරුක ආපත්තියකට නොපැමිණි අයකු වීම.
- විසිවස් හෝ අතිරේක විසිවස් ඇත්තකු වීම.

06. වස් එළඹීම වස් පවාරණය කඨිනාස්තරණය කඨින ආනිශංස ලැබීම කවර කාලසීමාවන්වලට අයත්වේදැයි දක්වන්න.

| | | |
|---|---|---|
| වස් එළඹීම | පෙරවස් | - ඇසළ පුර පෑලවිය දින |
| | පසුවස් | - නිකිණි පුර පෑලවිය දින |
| වස් පවාරණය | පෙරවස් | - වප් පුර පසළොස්වක පොහෝ දින |
| | පසුවස් | - ඉල් පුර පසළොස්වක පොහෝ දින |
| කඨිනාස්තරණය | | - වප් පුර පසළොස්වක සිට ඉල් පුර පසළොස්වක දක්වා ඇති සිවුර මාසය තුළ |
| කඨින ආනිශංස ලැබීම | | - කඨිනය ඇතිරූ දින සිට වස්සානයේ සිවුරු කාලය හා පස්මස කාලය |

# සීමා

01 සීමා පිළිබඳ ප්‍රභේද හැකිතාක් බෙදා දක්වන්න.




02 සීමාවක ඇති වැදගත්කම පහදන්න.

ශාසනයේ චිරස්ථිතිය උදෙසා සිදුකරනු ලබන උපසම්පදා විනය කර්මය සඳහා සංඝයාගේ පිරිසිදු බව පිණිස සිදුකරනු ලබන පිරිවෙන් චාරිත්‍ර අභිෂානන ආදී මෙන්ම අනෙකුත් විනයකර්මයන් ද සිදුකිරීමෙහිලා සීමාවක් වැදගත් වේ. සීමාවක් නොමැති-වීම විනයකර්මයන් වලදී සිදුකළ යුතු සියළු සංඝයාගේ ඡන්දය නොවීම අප්‍රසාද-ඇලලීම ආදී කාරණාවන් සඳහා අපහසු තත්ත්ව ගෙනෙන බැවින් සීමාවක් සම්මත කරගැනීමෙන් එම අපහසුතාවයන් මගහැරිය හැකිය.

(23) සීමා සම්මතයේ දී ආ ත්‍රිවිධ සම්පත්තීන් විස්තර කරන්න.

නිමිත්ත සම්පත්තිය.

පබ්බත නිමිත්ත, පාෂාණ නිමිත්ත, වන නිමිත්ත, රුක්ඛ නිමිත්ත, මග්ග නිමිත්ත, වම්මික නිමිත්ත, නදී නිමිත්ත, උදක නිමිත්ත යන අෂ්ටවිධ නිමිතිවලින් නිදර්ශනය වන ලෙස සම්මත කරගන්නා ලද සීමාවක් නිමිත්ත සම්පත්තියෙන් යුක්ත යැයි කියනු ලැබේ.

පරිස සම්පත්තිය

සම්බන්ධිත ගමයේ චාතුර්දිශික සංඝයා රැස්ව ඇම ගාම ක්ෂේත්‍රයෙහි බද්ධ සීමාවක් හෝ නදී සමුද්‍ර ජාතස්සර සීමාවක් හෝ ආශ්‍රිතය නොකොට සිටියා වූ සියලු භික්ෂූන් අත්පස කොටගෙන ඡන්දාහාරකයාට යෝග්‍ය භික්ෂූන්ගේ ඡන්දය ද ලබාගෙන සම්මත කරන ලද සීමාව පරිස සම්පත්තියෙන් යුක්ත යැයි කියනු ලැබේ.

කම්මවාචා සම්පත්තිය.

ඥප්ති ද්විතීය කර්ම වාක්‍යයෙන් පිරිසිදුව නිවැරදිව සම්මත කරගන්නා ලද සීමාව කම්මවාචා සම්පත්තියෙන් යුක්ත වේ.

(24) අෂ්ට විධ සීමා නිමිති නම් කරන්න.

පබ්බත නිමිත්ත
පාෂාණ නිමිත්ත
වන නිමිත්ත
රුක්ඛ නිමිත්ත
මග්ග නිමිත්ත
වම්මික නිමිත්ත
නදී නිමිත්ත
උදක නිමිත්ත

05 ජීවදය විශේෂ සීමා නම් කරන්න.

- අභිමුද්‍රිකා
- අපි මෙහෙ
- ධාරා සම්මිත
- ජාලා සම්මිත
- අසම්මිත
- බෙහිකිලෙ රේඛා සීමාව
- නදියා සීමාව
- සමුද්‍ර සීමාව
- ජාත්‍යන්තර සීමාව
- සීමාය සීමා සමමිද්‍රෙනන සීමාව
- සීමාය සීමා අපකේන්ද්‍රෙනන සීමාව

# පාරාජිකා

1) මුල් පාරාජිකා හතර පාලියෙන් ලියන්න.

## 1. මෙථුනධම්ම පාරාජිකා

යෝ පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නෝ සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මේථුනං ධම්මං පතිසේවෙය්‍ය අන්තමසෝ තිරච්ඡානගතාය'පි පාරාජිකෝ හෝති අසංවාසෝ.

*යම් භික්ෂුවක් භික්ෂු ආජීවයට පැමිණ ශික්ෂාවන් ප්‍රතික්ෂේප නොකොට දුර්වල බව ද නොකියා යටත් පිරිසෙයින් තිරිසන්ගතයකු සමග වුව ද මෛථුන් දම් සෙවීනම් පරිජි වෙයි. (පියවි මහණුන් සමග) සංවාසයට නුසුදුස්සෙක් ද වෙයි.*

## 2. අදින්නාදාන පාරාජිකා

යෝ පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියෙය්‍ය, යථාරූපේ අදින්නාදානේ රාජානෝ චෝරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා: චෝරෝ'සි, බාලෝ'සි, මූළ්හෝ'සි, ථේනෝ'සී'ති. තථාරූපං භික්ඛු අදින්නං ආදියමානෝ; අයම්පි පාරාජිකෝ හෝති අසංවාසෝ.

*යම් කිසි භික්ෂුවක් ගමින් හෝ ආරණ්‍යයෙන් (කැලෑවෙන්) හෝ නුදුන් වස්තුවක් සොරකම් කෙරේ ද එබඳු පැහැරගැනීමකදී රජවරු සොරුන් අල්වා මරත් ද සිර කරත් ද රටින් හෝ නෙරපා හරිත් ද තෝ සොරෙක බාලයෙක මෝඩයෙක සැඟවී සිටිය යුත්තෙකැයි නින්දා පරිභව කෙරෙත් එබඳු ආකාරයේ සොරකමක් කරන මහණතෙමේ පරිජිවූයේ වෙයි. (පියවි මහණුන් සමග) සංවාසයට නුසුදුස්සෙක් ද වේ.*

## 3. මනුස්ස විග්ගහ පාරාජිකා

යෝ පන භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වෝරෝපෙය්‍ය, සත්ථහාරකං වා'ස්ස පරියේසෙය්‍ය, මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය: අම්භෝ පුරිස! කිං තුය්හිමිනා පාපකේන දුජ්ජීවිතේන? මතන්තේ ජීවිතා සෙය්‍යෝ'ති. ඉති චිත්තමනෝ චිත්තසංකප්පෝ අනේකපරියායේන මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය; අයම්පි පාරාජිකෝ හෝති, අසංවාසෝ.

*යම් කිසි භික්ෂුවක් මනුෂ්‍ය ශරීරය ජීවිතේන්ද්‍රියයෙන් තොර කරයි, මරණය සඳහා ආයුධ හෝ පිළියෙල කොට තබයි, මරණයෙහි අනුසස් හෝ ප්‍රකාශ කරයි, ඔබට මේ පව්ටුවූ දුක්බර ජීවිතයෙන් කවර වැඩක් ද? ජිවත්වීමට වඩා ඔබේ මරණය උතුම්ය යි මරණු කැමති සිත් ඇතිව කල්පනා ඇතිව නොයෙක් අයුරින් මරණයෙහි ගුණ වනන්නාවූ ද මරණය පිණිස උත්සාහ ගන්වන්නාවූ ද මහණ තෙමේ පරිජි වූයේ වෙයි. (පියවි මහණුන් සමග) සංවාසයට නුසුදුස්සෙක් ද වෙයි.*

## 4. උත්තරිමනුස්සධම්ම පාරාජිකා

යෝ පන භික්ඛු අනභිජානං උත්තරිමනුස්සධම්මං අත්තූපනායිකං අලමරිය ඤාණදස්සනං සමුදාචරෙය්‍ය: 'ඉති ජානාමි, ඉති පස්සාමී'ති, තතෝ අපරේන සමයේන සමනුග්ගාහියමානෝ වා අසමනුග්ගාහියමානෝ වා ආපන්නෝ සුද්ධාපෙක්ඛෝ ඒවං වදෙය්‍ය: 'අජානමේවං ආවුසෝ අවචං ජානාමි, අපස්සං පස්සාමි' තුච්ඡං මුසාවිලපින්ති. අඤ්ඤත්‍ර අධිමානා: අයම්පි පාරාජිකෝ හෝති අසංවාසෝ

*යම් කිසි භික්ෂුවක් සිය සතන්හි නූපන්නාවූ (ආර්‍යමාර්ගඥානදර්ශනය ඇතිකරන සුළු) උත්තරිමනුෂ්‍යධර්ම තමා කෙරෙහි ඇතැයි ද එය මේ කාරණයෙන් දනිමි, මේ කාරණයෙන් දකිමියි ප්‍රකාශ කරයි එපමණකින් ආපත්තියට පැමිණියාවූ ඒ භික්ෂුව නැවත පිරිසිදුබව කැමතිව පසුකලෙක (අනෙකෙකු විසින්) විචාරණු ලැබුව ද නොලැබුව ද මම උතුරු මිනිස් දම් නොදැනම දනිමියි, නොදැකම දකිමියි , නිස්සාර බොරු කීම් යැයි කියා ද අධිමානයෙන් තොරව කියන්නාවූ ඒ මහණ පරිජිවූයේ වෙයි. (පියවි මහණුන් සමග) සංවාසයට නුසුදුස්සෙක් ද වෙයි.*

02 පළමු පාරාජිකාවේ සමතිස් මාර්ගය දක්වන්න

**සමතිස් මාර්ග**

| පුද්ගලයන් | මාර්ග | | | එකතුව | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| මනුෂ්‍ය ස්ත්‍රී | මුඛ මගග | වචච මගග | පසසාව මගග | | |
| අමනුෂ්‍ය ස්ත්‍රී | ” | ” | ” | | |
| තිරච්ඡාන ස්ත්‍රී | ” | ” | ” | | |
| මනුෂ්‍ය උභතෝබ්‍යංජනක ස්ත්‍රී | ” | ” | ” | | |
| අමනුෂ්‍ය උභතෝබ්‍යංජනක ස්ත්‍රී | ” | ” | ” | | |
| තිරච්ඡාන උභතෝබ්‍යංජනක ස්ත්‍රී | ” | ” | ” | 18 | |
| | | | | | |
| මනුෂ්‍ය පුරුෂ | මුඛ මගග | වචච මගග | | | |
| අමනුෂ්‍ය පුරුෂ | ” | ” | | | |
| තිරච්ඡාන පුරුෂ | ” | ” | | | |
| මනුෂ්‍ය පණ්ඩක පුරුෂ | ” | ” | | | |
| අමනුෂ්‍ය පණ්ඩක පුරුෂ | ” | ” | | | |
| තිරච්ඡාන පණ්ඩක පුරුෂ | ” | ” | | 12 | 30 |

03 උපසම්පදා භික්ෂුවකට තිබෙන පාරාජිකා සතර උපමා සහිතව ලියන්න.

මෙථුනධම්ම පාරාජිකා
සීසච්ඡින්නො පුරිසො — හිස සිඳුනු පුරුෂයෙක් මෙන් හිස සවිකර ජීවත් කරවිය නොහැක්කාක් මෙනි.

අදින්නාදාන පාරාජිකා
පණ්ඩුපලාසො — ගසකින් ඉදී වැටුන කොලයක් මෙන් හරිත් නොවන්නා සේය.

මනුස්ස විග්ගහ පාරාජිකා
ද්වෙධා භින්නා පුථු සිලා — දෙකඩ වූ පර්වතයක් මෙන් හා නොවන්නා සේ ය.

උත්තරි මනුස්සධම්ම පාරාජිකා
මත්ථකච්ඡින්නො තාලො — මුදුන සිඳුනු තල් ගසක් මෙනි.

04 සූවිසි පාරාජිකා නම් කරන්න.

| | |
|---|---|
| භික්ෂුන්ට හා භික්ෂුණීන්ට සාධාරණ | 04 |
| භික්ෂුණීන්ට අසාධාරණ | 04 |
| ඒකාදස අභව්‍ය පුද්ගලයන් | 11 |
| විබ්භන්තක | 01 |
| ලම්බී | 01 |
| මුදු පිට්ඨිකො | 01 |
| පරස්ස අංගජාතං මුඛෙන ගණ්හාති | 01 |
| පරස්ස අංගජාතෙ අභිනිසීදති | 01 |
| | 24 |

(05) පස්විසි අවහාරය නම් කරන්න.

නානාභාණ්ඩ පඤ්චකය

ආදියෙය්‍ය
හරෙය්‍ය
අවහරෙය්‍ය
ඉරියාපථං විකොපෙය්‍ය
ඨානා චාවෙය්‍ය

ඒකභාණ්ඩ පඤ්චකය

ආදියෙය්‍ය
හරෙය්‍ය
අවහරෙය්‍ය
ඉරියාපථං විකොපෙය්‍ය
ඨානා චාවෙය්‍ය

සාහත්ථික පඤ්චකය

සාහත්ථිකො
ආණත්තිකො
නිස්සග්ගියො
අත්ථසාධකො
ධුරනික්ඛෙපො

පුබ්බපයොග පඤ්චකය

පුබ්බපයොගො
සහපයොගො
සංවිදාවහාරො
සංකෙත කම්මං
නිමිත්ත කම්මං

ථෙය්‍යාවහාර පඤ්චකය

ථෙය්‍යාවහාරො

පසය්හාවහාරො

පරිකප්පාවහාරො

පටිච්ඡන්නාවහාරො

කුසාවහාරො

(06) භික්ෂුණීන්ට පමණක් සාධාරණ පාරාජිකා සතර ලියන්න.

උබ්භජානුමණ්ඩලිකා — කාය සංසග්ග රාගයෙන් යුත් භික්ෂුණියක සැලදුම කාය සංසග්ග රාගයෙන් යුත් පුරුෂයකු විසින් කරන අකු ඇටයෙන් යට දණ මඩලෙන් උඩ හා වැලමිටින් උඩ පෙදෙසෙහි කාය සංසර්ගය ඉවසීම.

වජ්ජපටිච්ඡාදිකා — අන්‍ය භික්ෂුණියකගේ පාරාජිකා ඇවැතක් දැන දැන සැඟවීම.

උක්ඛිත්තානුවත්තිකා — උක්ඛේපනීය කර්මය ලද භික්ෂුවකගේ පක්ෂය දැඩි වශයෙන් ගැනීම.

අට්ඨවත්ථුකා — කාය සංසර්ගයෙන් යුක්තව මිනිස් පිරිමියකුගේ අතගැනීම

සඟල සිවුරු කොනගැනීම

කාය සංසර්ගය පිණිස ආසන්නයෙහි සිටීම.

ආසන්නයෙහි සිට කතාව

පුරුෂයා කී තැනට යාම

පුරුෂයාගේ ආගමනය ඉවසීම

මුවා තැනකට පිවිසීම

කාය සංසර්ගය පිණිස කය ළං කිරීම.

යන අට කරුණින් අට කරුණක් පිළිපදීම.

07. සගර පරිජිවල සප්තදසාකාර වෙන වෙනම ලියන්න.

## 01. මෛථුනධම්ම පාරාජිකා

### සප්තදසාකාරය

| | | |
|---|---|---|
| නිදානං | :- | වෙසාලියයි |
| පුග්ගලො | :- | සුදින්න ස්ථවිරයන් වහන්සේ |
| වත්ථු | :- | මෛථුන ධර්ම ව්‍යතික්‍රමණය |
| පඤ්ඤත්තිය | :- | යො පන භික්ඛු -පෙ- පතිසෙවෙය්‍ය |
| | | සික්ඛා පච්චක්ඛාය යනුද , අන්තමසො තිරච්ඡානගතාය'පි යනුද |
| | | අනුප්‍රඥප්ති දෙකි |
| ආණත්තිය | :- | අනාණත්තික යි |
| ආපත්තිය | :- | පාරාජිකාපත්තිය යි |
| අනාපත්තිය | :- | අජානන්තස්ස, අසාදියන්තස්ස |
| | | උම්මත්තක, ඛිත්තචිත්ත, වේදනාට්ට, ආදිකම්මික |
| විපත්තිය | :- | ශීල විපත්තිය යි |
| අඞ්ගං | :- | සේවන චිත්තය, මාර්ගයෙන් මාර්ගය ප්‍රතිපාදනය |
| සමුට්ඨාන | :- | කාය චිත්ත සමුට්ඨානයි |
| කිරිය | :- | ක්‍රියා වශයෙනි |
| සඤ්ඤා | :- | සඤ්ඤා විමොක්ඛ යි |
| චිත්ත | :- | සචිත්තක යි |
| වජ්ජ | :- | ලෝකවජ්ජ යි |
| කම්ම | :- | කාය කර්මයි |
| කුසලත්තිකං | :- | අකුසල යි |
| වේදනාත්තිකං | :- | ද්වි වේදනා යි |

## 02. අදින්නාදාන පාරාජිකා

### සප්තදසාකාරය

| | | |
|---|---|---|
| නිදානං | :- | රජගහනුවර යි |
| පුග්ගලො | :- | ධනිය ස්ථවිරයන් වහන්සේ |
| වත්ථු | :- | රජුගේ දැවභාණ්ඩාගාරයෙහි සංඛ්‍යාත වස්තුව |
| පඤ්ඤත්තිය | :- | යො පන භික්ඛු -පෙ- අසංවාසො |
| | | ගාමාවා අරඤ්ඤාවා යනු අනුප්‍රඥප්ති යි |
| ආණත්තිය | :- | සාණත්තික යි |
| ආපත්තිය | :- | දුකුලා, තුල්‍යයි, පරිපි |
| අනාපත්තිය | :- | සකසඤ්ඤිස්ස, විස්සාසගාහෙ, තාවකාලිකෙ, |
| | | පෙතපරිග්ගහෙ, තිරච්ඡානගතපරිග්ගහෙ,පංසුකූලසඤ්ඤිස්ස |
| | | උම්මත්තක, ඛිත්තචිත්ත, වේදනාට්ට, ආදිකම්මික |
| විපත්තිය | :- | ශීල විපත්තිය යි |
| අඞ්ගං | :- | පරපරිග්ගහිතං , පරපරිග්ගහිත සඤ්ඤිතා, ගරුපරික්ඛාරො, |
| | | ථෙය්‍යචිත්තං, අවහරණං |
| සමුට්ඨාන | :- | අදින්නාදාන සමුට්ඨානයි |
| කිරිය | :- | ක්‍රියා වශයෙනි |
| සඤ්ඤා | :- | සඤ්ඤා විමොක්ඛ යි |
| චිත්ත | :- | සචිත්තක යි |
| වජ්ජ | :- | ලෝකවජ්ජ යි |
| කම්ම | :- | කාය වචී කර්මයි |
| කුසලත්තිකං | :- | අකුසල යි |
| වේදනාත්තිකං | :- | ත්‍රිවේදනා යි |

# 03. මනුස්ස විග්ගහ පාරාජිකා

## සප්තදසාකාරය

| | | | |
|---|---|---|---|
| නිදානය | :- | වෙසාලියයි | |
| පුග්ගල | :- | බොහෝ භික්ෂූන් | |
| වත්ථු | :- | කලකිරුණු භික්ෂූන් දිවිනසාගැනීම සංඝයාට වස්තුව | |
| පඤ්ඤත්ති | :- | යො පන භික්ඛු -පෙ- අසංවාසො | |
| | | මරණ වණ්ණනාව සංවණ්ණනය ද අනුප්‍රඥප්ති වේ | |
| ආණත්ති | :- | සාණත්තික යි | |
| ආපත්ති | :- | වළ කැණීම ආදිය | දුකුලා |
| | | මිනිස් දැයෙහි ඵලෙවකුට දුක් ඉපිදවීම ථුලසි | |
| | | තිරිසන් ගිය මරණය | පචිති |
| | | මිනිස් මරණය | පරිජි |
| අනාපත්ති | :- | අජානන්තස්ස, අසාදියන්තස්ස | |
| | | උම්මත්තක, ඛිත්තචිත්ත, වේදනාට්ට, ආදිකම්මික | |
| විපත්ති | :- | ශීල විපත්තිය යි | |
| අංග | :- | මනුෂ්‍ය ප්‍රාණියෙක් වීම, ප්‍රාණියෙක්ය යන හැඟීම, වධක චේතනාව, උපක්‍රමය, එයින් මැරීම | |
| සමුට්ඨාන | :- | අදින්නාදාන සමුට්ඨානයි | |
| කිරිය | :- | ක්‍රියා වශයෙනි | |
| සඤ්ඤා | :- | සඤ්ඤා විමොක්ඛ යි | |
| චිත්ත | :- | සචිත්තක යි | |
| වජ්ජ | :- | ලෝකවජ්ජ යි | |
| කම්ම | :- | කාය වචී කර්මයි | |
| කුසලත්තික | :- | අකුසල යි | |
| වේදනාත්තික | :- | දුක්ඛ වේදනා යි | |

# 04. උත්තරිමනුස්සධම්ම පාරාජිකා

## සප්තදසාකාරය

| | | | |
|---|---|---|---|
| නිදානය | :- | වෙසාලියයි | |
| පුග්ගල | :- | වග්ගුමුදාතීරිය භික්ෂූන් | |
| වත්ථු | :- | උත්තරිමනුස්සධම්මාරොචනයයි | |
| පඤ්ඤත්ති | :- | යො පන භික්ඛු -පෙ- අසංවාසො | |
| | | අඤ්ඤත්‍ර අධිමානා අනුප්‍රඥප්ති වේ | |
| ආණත්ති | :- | අනාණත්තික යි | |
| ආපත්ති | :- | "මම ප්‍රථම ධ්‍යානයට සමවදිමි" | |
| | | අසන්නා තේරුම් නොගතහොත් | ථුලැසි |
| | | අසන්නා තේරුම් ගතහොත් | පරිජි |
| අනාපත්ති | :- | අධිමානෙන ආරොචෙන්තස්ස, අනුල්ලපනාධිප්පායස්ස | |
| | | උම්මත්තක, ඛිත්තචිත්ත, වේදනාට්ට, ආදිකම්මික | |
| විපත්ති | :- | ශීල විපත්තිය යි | |
| අංග | :- | උතුරුමිනිස් දම් තමා තුල නැතිබව | |
| | | පාපිච්ඡාවෙන් ආරෝචනය | |
| | | වෙනින් හෝවින් නොව සෘජු ලෙස කීම | |
| | | අසන්නා මිනිසකු වීම | |
| | | පසුව නොව එකෙණෙහිම දැනගැනීම | |
| සමුට්ඨාන | :- | අදින්නාදාන සමුට්ඨානයි | |
| කිරිය | :- | ක්‍රියා වශයෙනි | |
| සඤ්ඤා | :- | සඤ්ඤා විමොක්ඛ යි | |
| චිත්ත | :- | සචිත්තක යි | |
| වජ්ජ | :- | ලෝකවජ්ජ යි | |
| කම්ම | :- | කාය වචී කර්මයි | |
| කුසලත්තික | :- | අකුසල යි | |
| වේදනාත්තික | :- | ත්‍රිවේදනා යි | |

08 සතර පාරාජිකාව, අංග වෙන වෙනම සඳහන් කරන්න.

මෛථුනධම්ම පාරාජිකා — සේවන චිත්තය
මාර්ගයෙන් මාර්ගය ප්‍රතිපාදනය

අදින්නාදාන පාරාජිකා — පරපරිග්ගහිතං - අන්‍ය සන්තකයක් වීම
පරපරිග්ගහිත සඤ්ඤිතා - අන්සතුය යන හැඟීම
ගරුපරික්ඛාරෝ - ගරු පරිෂ්කාරයක් වීම
ථෙය්‍යචිත්තං - සොරසිත
අවහරණං - පස්විසි අවහාරයින් එකක් අනුරකින් ගැනීම.

මනුස්ස විග්ගහ පාරාජිකා — මනුෂ්‍ය ප්‍රාණියෙක් වීම
ප්‍රාණියෙක්ය යන හැඟීම
වධක චේතනාව
උපක්‍රමය
එයින් මරණයට පත්වීම

උත්තරි මනුස්සධම්ම පාරාජිකා — උතුරු මිනිස්දම් තමා තුළ නැති බව
පාපිච්ඡතාවෙන් ආරෝචනය
වචින් හෝ කයින් හෝව සාදු ලෙස කීම
අසන්නා මිනිසෙකු වීම
පසුව හෝව ඔහු [illegible] අර්ථය දැනගැනීම.

09 ඒකාදශ අභව්‍ය පුද්ගලයන් නම් කරන්න.

පණ්ඩකෝ
ථෙය්‍යසංවාසකෝ
තිත්ථියපක්කන්තකෝ
උභතොබ්‍යඤ්ජනකෝ
මාතුඝාතකෝ
පිතුඝාතකෝ
අරහන්තඝාතකෝ
භික්ඛුනීදූසකෝ
ලෝහිතුප්පාදකෝ
තිරච්ඡානගතෝ

(10) භික්ෂු ප්‍රාතිමෝක්ෂය නම් කවරේද?

උපසම්පදාව 08හි විස්තර අඩංගු (උපසම්පදාව ප්‍රදානය කරන ආකාරය)

(11) සාමණේර සිල් කීයද? ඒ මොනවාද?

දිවි දෙන සත්තු දිවි නැසුව
දිවි දෙන දෙනා අයත් ද්‍රව්‍ය වලයකුදු සොරසිතින් ගත
දිවි දෙන ස්ත්‍රීයන් ගත ගමක් හා ද මෛථුන්දම සේවිය
දිවි දෙන සිහලුනු බසින්දු මුසවා කිව
දිවි දෙන සිහිබිඳුනු සාද රා මිහන් බීව
බුදුරුවන්හි අගුණ කිව
දම් රුවන්හි අගුණ කිව
සඟ රුවන්හි අගුණ කිව
භුවනත් මොහොත හා ද මෛථුන්දම සේවිය
නියත මිසදිටු ගත

(12) ධනිය නමැති භික්ෂුව සොරකම කළේය. එම භික්ෂුවට සිදුවූ ඇවත කුමක්ද?

අනාපත්ති(ආදිකම්මික)

(13) භික්ෂුවක් වැඳිරියක් සමග මෛථුන ධම්ම සේවුවේය. පාරාජිකා වූයේද? හේතු වූ කරුණු ලියන්න.

නැත.

(14) යම් භික්ෂුවක් තම ජීවිතයෙන් මරණයට පත්වීම තමා සිදුවන ඇවත කුමක්ද?

දුෂ්කට

(15) මෛථුන සේවන අදහසින් මනුෂ්‍ය ස්ත්‍රියක් ස්පර්ශ කරන භික්ෂුවට සිදුවන ඇවත කුමක්ද?

දුෂ්කට

(16) මනුස්ස විග්ගහ පාරාජිකාව වීමට ප්‍රයෝග සයකි. ඒ මොනවාද?

සාහත්ථික — සිය අතින්ම මැරීම

ආණත්තික — අණකර මැරීම

(වත්ථු - අසවල් පුද්ගලයා මරන්න)
(කාල - අසවල් කාලයේදී මරන්න)
(ඕකාස - අසවල් ස්ථානයේදී මරන්න)
(ආවුධ - අසවල් ආයුධයෙන් මරන්න)
(ඉරියාපථ - අසවල් ඉරියව්වේදී මරන්න)
(ක්‍රියා විශේෂ - අසවල් ආකාරයෙන් මරන්න)

නිස්සග්ගිය — වෙඩි තැබීම දුනු ඊතල ආදී විසිකරන දෙයකින් මැරීම

ථාවර — උගුල් ඇටවීම බොරු වළවල් වැනි ස්ථාවර දෙයකින් මැරීම

විජ්ජාමය — යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වැනි විජ්ජාමය බලපෑම්වලින් මැරීම.

ඉද්ධිමය — කර්ම සෘද්ධි හැකියාවලින් මැරීම.

(17) මිනිස් ඝාතන පරිදිට අනුව ථුල්ලච්ච, පාචිත්ති, දුක්කට ඇවැත් සිදුවන අවස්ථා පෙන්නුම් කරන්න.

වල කැපීම ආදිය — දුක්කට
තිරිසන් සත්ව මරණය — පාචිත්ති
මිනිස් උදරයේ වූවකුට දුක් දීම — ථුල්ලච්ච
(මිනිස් මරණය — පාරාජි)

(18) පාණො, පාණාතිපාතො, පාණාතිපාති, පාණාතිපාතස්ස පයොගො යන පද පහදන්න.

පාණො — සත්වයා හෙවත් ජීවිතේන්ද්‍රිය

පාණාතිපාතො — යම් චේතනාවකින් ජීවිතේන්ද්‍රියෝපච්ඡේදක ප්‍රයෝගයක් කෙරේ ද

පාණාතිපාති — උක්ත ප්‍රකාර වධක චේතනාවෙන් යුත් පුද්ගලයා

පාණාතිපාතස්ස පයොගො — සාහත්ථික, ආණත්තික, නිස්සග්ගිය, ථාවර, විජ්ජාමය, ඉද්ධිමය යන සයාකාර ප්‍රයෝග.

(19) යම් භික්ෂුවක් අන්යෙ දෙයක් පැහැර ගන්නේය. එහෙත් කිසිම ඇවතක් නොවී ථුලැසි ඇවතක් වේය. හේතුව පහදා දෙන්න.

පාරාජිකා වීම සඳහා පාදයක් හෙවත් මසු පහක් හෝ ඊට වඩා වැඩි වටිනාකමකින් යුත් දෙයක් සොරාගත යුතු අතර මසු පහට අඩු වූත් මස්සට වඩා වැඩි වූත් යමක් සොරාගතහොත් ථුලැසි වේ.

(20) උතුරු මිනිස් දම් මොනවාද?

ඣාන
විමොක්ඛ
සමාධි
සමාපත්ති
ඤාණ දස්සන
මග්ග භාවනා
ඵල සච්ඡිකිරියා
කිලෙසප්පහාන
විනීවරණතා චිත්තස්ස

(21) අන්තර භික්ෂුවක් උතුරු මිනිස් දම් ප්‍රකාශ කරයි. එහෙත් කිසිදු ආපත්තියක් සිදු නොවෙයි. හේතුව පහදන්න.

උතුරු මිනිස් දම් ප්‍රකාශකිරීමේදී අධිමානයෙන් ප්‍රකාශ කලේ නම් ඇවැත් සිදු නොවේ. එමෙන්ම හුවාදැක්වීමේ අදහසකින් තොරවද, උමතු වූවන්, යක්ෂාවේශයෙන් පෙළෙන්නන්, වේදනාවලින් පෙළෙන්නන් සදහාද ඇවැත් සිදුනොවේ. මෙය මිනිසකුටම පැවසිය යුතු අතර තිරිසන් ආදීන්ට පැවසීමෙන්ද ඇවැත් නොවේ.

22) ඇත්තා වූ උතුරු මිනිස් දම් උපසම්පන්නයෙකුට හා අනුපසම්පන්නයෙකුට කීමෙන් ඇවැත්වලට හැම්බේද ? සඳහන්න.

ඇත්තා වූ උතුරු මිනිස් දම් අවශ්‍ය වූ විටෙක පමණක් උපසම්පන්නයකුට පැවසිය හැකි නමුදු අනුපසම්පන්නයකුට පැවසීමෙන් පචිති ඇවැතක් සිදු වේ.

23) සියලුම ආපත්තීන් කිරිය අකිරිය වශයෙන් පංචවිධ වන අයුරු දක්වන්න.

කිරියතො
නොකල යුතු දේ කයින් හෝ වචනයෙන් කිරීමෙන්
(උදා:- මුසාවාද)

අකිරියතො
කල යුතු දේ කයින් හෝ වචනයෙන් නොකිරීමෙන්
(උදා:- චීවර අධිෂ්ඨානය)

කිරියා'කිරියතො
නොකල යුතු දේ කිරීමෙන්ද, කල යුතු දේ නොකිරීමෙන්ද
(උදා:- චීවර පටිග්ගහණ ශික්ෂාපදය = නොනෑද භික්ෂුණියකගෙන් චීවරයක් පිළිගැනීම හා කිසිවක් නොදීම)

සියා කිරියතො සියා'කිරියතො
ඇතැම්විට කිරීමෙන්ද ඇතැම්විට නොකිරීමෙන්ද
(උදා:- රූපිය පටිග්ගහණ ශික්ෂාපදය)

සියා කරියෙනො සියා කරියො' කරියෙනො
ඇතැම්විට කරීමෙන්ද, ඇතැම්විට කරීමෙන්ද නොකිරීමෙන්ද
( උදා:- කුම්භකාර සික්ඛාපදය )

(24) පහත පද අර්ථ දක්වන්න.

| | |
|---|---|
| සික්ඛං අපච්චක්ඛාය | අධිශීල සංඛ්‍යාත ශික්ෂාව විශේෂයෙන්ම ප්‍රත්‍යාඛ්‍යාන නොකර |
| මෙථුනං ධම්මං | කාමාශාවෙන් මැඩුනු සමානච්ඡන්දයෙන් යුත් ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ ලාමක ධර්මය හෙවත් රහස් කර්මය |
| අන්තමසො | යටත් පිරිසෙයින් |
| පාරාජිකො හොති | පරාජයට පමුණුවන ලද්දෙක් වෙයි |
| අසංවාසො | ඒකකම්ම, ඒකුද්දෙස, සමසික්ඛතා යන නම් කරුණෙන් ලද්ධි සිද්ධ ඒකකම්මාදියෙහි එක්ව විසීම සංවාස යැයිද පිරිසි ආවාස් පුද්ගල සමග ඒසේ නොමැත්තේ අසංවාස නම් වේ. |
| ගාමා වා අරඤ්ඤා වා | පිටත ප්‍රාකාරයෙකින් හෝ අන්තිම පරිච්ඡේදයෙන් කටු අතු වැටකින් හෝ පිරිකෙවු කළාවූද නොකළාවූද, මනුෂ්‍යවාස වූයේ හෝ නොවූයේ හෝ ඒකකුටිකාදි භේදවූ ප්‍රදේශය 'ග්‍රාමය' නම් වේ. තවද ගමක කෙලවරම ඇති නිවසේ උපචාරයේ සිට (ද්වාරයෙහි සිටි මාගමක් බඳුන් දෝනා ජලය විසිකළවිට පතිතවන ස්ථානය) මැදුම් පුරුෂයකු විසින් අධික ශක්තියෙන් විසිකරනලද ගලක් පතිත වැටුන තැන් මෙතෙක් 'ග්‍රාමය' නම් වේ. ග්‍රාමාන්තයෙහි සිට උත්කෘෂ්ටකාරයෝ දැමූ ගල වැටෙන තැන 'ග්‍රාමෝපචාරය' නම් වේ. ග්‍රාමයත් ග්‍රාමෝපචාරයත් හැර ඉන් පිට 'අරණ්‍ය' වෙයි. එසේ වූ ගමෙන් හෝ අරණ්‍යයෙන් |

අදින්නං — හිමියා විසින් කයින් හෝ වචනින් ස්වකීය ස්වාමිත්වය සහිත නොදෙන ලද්දක්

ආදියෙය්‍ය — පස්විසි අවහාරයන් අතුරෙන් සුදුසුකර අවහාරයකින් සොරසිතින් අයිතියට ගැනීම

ථෙය්‍යසංඛාතං

සඤ්චිච්ච

මනුස්ස විග්ගහං — සිඳුම් වූ පළමු කලල රූපයේ පටන් ජීවිතාන්තය තෙක් සිරුරක්

ජීවිතා වොරොපෙය්‍ය — කලල් අවස්ථාවෙහි හෝ ඊට පසු කාලයේදී උපක්‍රම-යකින් දිවි තොරකිරීම

සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය — ජීවිතෙන්ද්‍රියට හානියට සුදුසු වූ අසි සැත් ආදි අවි යම් සේ ගතහැකි වෙයි නම් එසේ තැබීම

මරණ වණ්ණං වා සංවණ්ණෙය්‍ය — වචනින් හෝ හැල්ලක් කරමින් ආදීනවය ලියා හෝ මරණයේ ගුණ ප්‍රකාශ කිරීම

අනෙක පරියායෙන — කුදුමහත් උපායවලින්

අනභිජානං — සිය සන්තානයෙහි උපදවා නොගත් ගුණ බව දැන

උත්තරිමනුස්ස ධම්මං — ප්‍රකෘති මනුෂ්‍යයන්ට වඩා අතිශයින් උත්කෘෂ්ට වූ ආර්යයන්ගේ ගුණධර්ම වූ ධ්‍යාන විමොක්ෂාදි ධර්ම

අනනුජානියතං — උතුරු මිනිස් දම් තමා කෙරෙහි විද්‍යමාන යැයි ආරෝචනය කොටගැනීම

අලමරියඤාණදස්සනං — කෙලෙස් විධ්වංසනයට සමර්ථ වූ ආර්‍යයන්ගේ ඥාණදර්ශනය

විසුද්ධාපෙක්ඛො — පාරාජිකාවට පැමිණියාවූ ගිහිබව විසුද්ධිය හෝවත් ධ්‍යාන විසුද්ධිය බලාපොරොත්තු වූයේ

අඤ්ඤත්‍ර අධිමානා — සම්ප්‍රාප්තයෙහි උත්පත්ති වශයෙන් නොපැමිණි ධ්‍යානාදියෙහි මානය නැතිව හෙවත් අධිමානයෙන් තොරව

# සංඝාදිසේස

01 සංඝාදිසේස යන්හි අර්ථ දක්වන්න.

'සංඝො ආදිම්හි චෙව සෙසෙච ඉච්ඡිතබ්බො අස්සාති; සංඝාදිසෙසො' යනුවෙන් සඳහන් වේ. මේ ඇවැත් සමූහයෙන් පිරිසිදු වීම සඳහා මුලදී පිරිවෙස් දීමටත් මැද දී මානත්වීම හා මූලාය පටිකස්සනය කිරීමට සුදුසුවන්ට ද සඳහාත් අග දී අබ්භාන කර්මයටත් සංඝයා ලැබිය යුතු බැවින් "සංඝාදිසේස" නම් වේ.

02 සංඝාදිසේස කොපමණද ? නාමයන් වශයෙන් ලියා දක්වන්න.

13 කි.

සුක්ක විස්සට්ඨි ශික්ෂාපදය
කාය සංසග්ග ශික්ෂාපදය
දුට්ඨුල්ලවාචා ශික්ෂාපදය
අත්තකාම පාරිචරිය ශික්ෂාපදය
සඤ්චරිත්ත ශික්ෂාපදය
කුටිකාර ශික්ෂාපදය
විහාරකාර ශික්ෂාපදය
පඨම දුට්ඨදෝස ශික්ෂාපදය
දුතිය දුට්ඨදෝස ශික්ෂාපදය
පඨම සංඝභේදක ශික්ෂාපදය
දුතිය සංඝභේදක ශික්ෂාපදය
දුබ්බච ශික්ෂාපදය
කුලදූසක ශික්ෂාපදය.

03 තිරිසන්ගත මාතෙමක් ස්පර්ශ කරන භික්ෂුවට කුමන ඇවැතක් වේද?

මෛථුන රාගයෙන් -දුෂ්කට

කාය සංසග්ග රාගයෙන් -දුෂ්කට

(04) සංඝාදිසේස ඇතුළත් පඨමාපත්තික යාවතතියක වශයෙන් බෙදා දක්වන්න

පඨමාපත්තික

සුක්ක විස්සට්ඨි සික්ඛාපදය
කාය සංසග්ග සික්ඛාපදය
දුට්ඨුල්ලවාචා සික්ඛාපදය
අත්තකාම පාරිචරිය සික්ඛාපදය
සඤ්චරිත්ත සික්ඛාපදය
කුටිකාර සික්ඛාපදය
විහාරකාර සික්ඛාපදය
පඨම දුට්ඨදෝස සික්ඛාපදය
දුතිය දුට්ඨදෝස සික්ඛාපදය

යාවතතියක

පඨම සංඝභේදක සික්ඛාපදය
දුතිය සංඝභේදක සික්ඛාපදය
දුබ්බච සික්ඛාපදය
කුලදූසක සික්ඛාපදය

(05) චත්තාරෝ යාවතතියකා මෙම සංඝාදිසේස සතර පැනවීමට හේතු වූයේ කවර භික්ෂූන් වහන්සේලාද?

| | |
|---|---|
| පඨම සංඝභේදක සික්ඛාපදය | දේවදත්ත ස්ථවිරයන් වහන්සේට |
| දුතිය සංඝභේදක සික්ඛාපදය | දේවදත්ත ස්ථවිරයන් වහන්සේට පක්ෂව කටයුතු කල භික්ෂූන් වහන්සේලා උදෙසා |
| දුබ්බච සික්ඛාපදය | ඡන්න තෙරුන් වහන්සේට |
| කුලදූසක සික්ඛාපදය | අස්සජි පුනබ්බසුක භික්ෂූන් උදෙසා |

(26) පරිවාස, මානත්ත, මූලාය පටිකස්සනය, අබ්භානය යන්න හඳුන්වා දෙන්න.

මානත්ත

යම් භික්ෂුවක් සංඝාදිසේසයකට පත්වී එය පටිච්ඡන්න වූයේ නම් ඔහු පිරිසිදු වීම සඳහා පිරිවෙස් පිරූ භික්ෂුව මෙන්ම, පටිච්ඡන්න නොවූ ආපත්ති වූ භික්ෂුවද යන දෙදෙනාම තම ආපත්තියෙන් නැගී සිටීම සඳහා සරැයක් සංඝයාට ගරු වශයෙන් පුරනු ලබන වත මානත්තයයි. මෙය පටිච්ඡන්න මානත්ත හා අපටිච්ඡන්න මානත්ත යනුවෙන් දෙයාකාර වේ.

පිරිවෙස

සංඝාදිසේසයට පත් වූ භික්ෂුවක් අරුණක් ඉක්මවෙන්නට මත්තෙන් එය සමාන සංවාස භික්ෂුවකට ආරෝචනය කල යුතුය. එසේ හැකියාවද තිබියදී ආරෝචනය නොකිරීමෙන් ආපත්ති පටිච්ඡාදනය වේ. එසේ පටිච්ඡන්න වූ ආපත්තියෙන් පිරිසිදු වීම සඳහා පුරනු ලබන වත පිරිවෙසයි. එය පටිච්ඡන්න පිරිවෙස, සුද්ධන්ත පිරිවෙස හා සමෝධාන පිරිවෙස නමින් තුන් ආකාර වේ.

අබ්භාන

සංඝාදිසේසයට පත්වී එයින් පිරිසිදු වීම සඳහා පිරිවෙස් හා මානත් පිරූ භික්ෂුව පිරිසිදු පකතත්ත භික්ෂුවක් වශයෙන් නැවත සංඝයා හා සංවාස වීම සඳහා සිදුකරනු ලබන විනය කර්මය අබ්භාන විනය කර්මයයි. මේ සඳහා අඩුතරම වශයෙන් විසි වර්ගික සංඝයා රැස්විය යුතුය.

මූලාය පටිකස්සන

සංඝාදිසේසයට පත්වී පටිච්ඡන්න වී එයින් පිරිසිදු වීම සඳහා පිරිවෙස් පුරමින් සිටින කාලය අතරතුර නැවත් සංඝාදිසේසයට පත්වී පටිච්ඡන්න කලේ නම් පිරිවෙස් විසූ කාලය මකා දමා නැවත මුලට ඇද පිරිවෙස් පිරීම මූලාය පටිකස්සනය නම් වේ.

07) සංඝාදිසේස ඇවතක් ප්‍රතිච්ඡන්නය වීම කෙරෙහි බලපාන කරුණු ලියා දක්වන්න.

ආපත්ති ච හොති ආපත්ති සඤ්ඤී ච
ආපත්තියකට පත්වීම හා ඒ බව දැනීම

පකතත්තො ච හොති පකතත්ත සඤ්ඤී ච
ප්‍රකෘති භික්ෂුවක් වීම හා ඒ බව දැනීම

අනන්තරායිකො ච හොති අනන්තරායික සඤ්ඤී ච
අන්තරායික කරුණු නැතිවීම හා ඒ බව දැනීම

පහු ච හොති පහු සඤ්ඤී ච
සමාන සංවාසික භික්ෂුවක් සිටීම හා ඒ බව දැනීම.

මෙම කරුණු සතර තිබියදී සඟවන කැමැත්ත ඇතිව සැඟවීම ආපත්ති ප්‍රතිච්ඡන්නයයි. (ඡාදෙතු කාමො ච හොති ඡාදෙති ච)

08) උපෝසථ අන්තරායකර ධර්ම නම් කරන්න.

රාජ
චෝර
අග්ගි
උදක
මනුස්ස
අමනුස්ස
වාළ
සිරිංසප
ජීවිත
බ්‍රහ්මචරිය

(9) භික්ෂුවක් සංඝාදිශේෂ ඇවතකට පත්වී දින 05 ක් යනතුරු ආරෝචනය කර නැත. එම් වූ භික්ෂුවක් පිරිසිදු වීම සඳහා උපදෙස් පියවරෙන් පියවර ලියා දක්වන්න.

අවම වශයෙන් චාතුර්වර්ගික සංඝයා පිරිසිදු සීමාවකට රැස් කරවා සංඝයාට ආරාධනා කර වන්දනා කිරීමෙන් අනතුරුව අත්වැඩ සිට පිරිවෙස ඉල්ලා සිටිය යුතුය. සංඝයා විසින් කර්ම වාක්‍ය කියා සුද්ධ පිරිවෙසක් ලබාදුන් පසු 'පරිවාසං සමාදියාමි වත්තං සමාදියාමි' යනුවෙන් තෙවරක් කියා පිරිවෙස සමාදන් විය යුතුය. ඉන්පසු ගත් පිරිවෙස ආරෝචනය කළ යුතුය. පිරිවෙස පුරන්නේ වෙනත් සෙනසුනක නම් 'පරිවාසං නික්ඛිපාමි වත්තං නික්ඛිපාමි' යනුවෙන් තෙවරක් කියා පිරිවෙස නික්ෂේප කර එම පුරන සෙනසුනට ගොස් භික්ෂූන් ඉදිරියේ නැවත පිරිවෙස සමාදන් විය යුතුය. එම් භික්ෂුවක් සිටින සෙනසුනක උවද පිරිවෙස පිරිය හැකි නමුදු බොහෝ භික්ෂූහු වේ නම් ඔවුන් හැමටමත් අමතන ආගන්තුක භික්ෂූන් හැමටමත් ආරෝචනය කළ යුතුය. පිළිවෙදිය යුතු විනය නීති නොකඩා වත සම්පූර්ණ කළපසු පිරිසිදු සීමාවකට සංඝයා රැස්කරවා සිය ආරෝචනය කර මානත යාඥා කල යුතුය.

සංඝයා විසින් මානත ලබාදුන් පසු 'මානත්තං සමාදියාමි වත්තං සමාදියාමි' ලෙස තෙවරක් කියා මානත සමාදන්ව සංඝයාට ආරෝචනය කල යුතුය. මානත පුරන්නේ වෙනත් සෙනසුනක නම් 'මානත්තං නික්ඛිපාමි වත්තං නික්ඛිපාමි' ලෙස තෙවරක් කියා මානත නික්ෂේප කර අවම වශයෙන් සංඝයා සතර නමක් හෝ පෙරසන සුදුසු සෙනසුනකට ගොස් සංඝයා ඉදිරියේ මානත සමාදන්ව සරයක් නොකඩ කොට පිරිය යුතුය. දිනපතා සංඝයාට ආරෝචනය කළ යුතු මෙන්ම අමතන ආගන්-තුක භික්ෂූන් වේ නම් ඔවුන්ටද ආරෝචනය කළ යුතුය. පිරිසිදුව වත පුරා සම්පූ-ර්ණ කළපසු පිරිසිදු සීමාවකට විංශතිවර්ගික සංඝයා රැස් කරවා මානත ආරෝචනය කර එම ඇවතින් සම්පූර්ණ පිරිසිදුවීම සඳහා අබ්භානය යාචනය කළ යුතුය. සංඝයා විසින් අබ්භාන විනය කර්මය සිදුකල පසු එම ඇවතට සිදුකල පිළියම සූතින් අවසන් වේ.

(10) ඇවැත්වලට පත්විය හැකි හේතු මොනවාද?

| | |
|---|---|
| අඤ්ඤාණතා | නුවණ මදකම |
| අලජ්ජිතා | ලැජ්ජා නැති බව |
| විනයෙ අවිනය සඤ්ඤිතා | විනයෙහි විනය නොවේය යන හැඟීම |
| අවිනයෙ විනය සඤ්ඤිතා | විනය නොවරදෙහි විනය යන හැඟීම |
| කුක්කුච්ච පකතතා | කුකුස් කිරීම |
| සති සම්මෝසා | සිහිමුළා බව |

(11) උපසපන් භික්ෂුවකට කළ හැකි චෝදනා සතර ආකාර මො. පහදන්න.

වත්ථු සන්දස්සනා
ආපත්තියකට අදාළ වස්තුවෙන් චෝදනා කිරීම.

ආපත්ති සන්දස්සනා
ආපත්තියෙන් චෝදනා කිරීම.

සංවාස පටික්ඛෙපො
'ඔබ වහන්සේ සමඟ සංඝකර්ම නොකරමි' යි යනාදී ලෙස සංවාසය ප්‍රතික්ෂේප කිරීම

සාමීචි පටික්ඛෙපො
ආසනයෙන් නැගිටීම ආදී සාමීචි කර්ම නොකිරීම.

සංඝභේදයට හේතුවන්නා වූ අටලොස් භේදකර වස්තු නම් කරන්න.

අධර්මය ධර්මය යැයි කීම.
ධර්මය අධර්මය යැයි කීම.
අවිනය විනය යැයි කීම
විනය අවිනය යැයි කීම.
තථාගතයන් වහන්සේ දේශනා නොකළ දේ, දේශනා කළැයි කීම.
" " " කළ දේ, දේශනා නොකළැයි කීම.
තථාගතයන් වහන්සේ පුරුදු නොකළ දේ, පුරුදු කළැයි කීම.
" " " කළ දේ, පුරුදු නොකළැයි කීම.
තථාගතයන් වහන්සේ නොපැනවූ දේ, පැනවූ බව කීම.
" " පැනවූ දේ, නොපැනවූ බව කීම.
අනාපත්ති ආපත්ති යැයි කීම.
ආපත්ති අනාපත්ති යැයි කීම.
ලඝු ඇවැත් ගරු ඇවැත් යැයි කීම.
ගරු ඇවැත් ලඝු ඇවැත් යැයි කීම.
සාවශේෂ ආපත්ති අනවශේෂ ආපත්ති යැයි කීම.
අනවශේෂ ආපත්ති සාවශේෂ ආපත්ති යැයි කීම.
දුට්ඨුල්ලාපත්ති අදුට්ඨුල්ලාපත්ති යැයි කීම
අදුට්ඨුල්ලාපත්ති දුට්ඨුල්ලාපත්ති යැයි කීම.

(3) ලෝකවර්ජ පඤ්ඤත්ති වර්ජ යනු කුම ?

ලෝකවර්ජ — යම් ආපත්තියක් සචිත්තකව සිදුවන විට ඇතිවන්නේ අකුසල් සිතක් නම් ලෝකවර්ජ වේ.

පඤ්ඤත්ති වර්ජ — යම් ආපත්තියක් සචිත්තක හෝ අචිත්තක වෙමා ලෝකයාගේ දොස් නැගවීම නිසා පැනවූ ශික්ෂා පඤ්ඤත්තිවර්ජ වේ.

(14) ප්‍රථම සංඝාදිසේසයේ සත්ත්‍ව ප්‍රකාරය දක්වන්න.

| | |
|---|---|
| නිදානය | සැවැත්නුවර |
| පුද්ගලයා | සෙය්‍යසක භික්ෂු |
| වස්තුව | උපක්‍රම කොට ශුක්‍ර මෝචනය |
| ප්‍රඥප්තිය | සංචේතනිකා සුක්කවිස්සට්ඨි සංඝාදිසේසෝ' යනු |
| | අඤ්ඤත්‍ර සුපිනන්තා' යනු අනුප්‍රඥප්තිය යි |
| ආණත්තිය | අනාණත්තික යි |
| ආපත්ති | සංඝාදිසේස ථුල්ලච්චය |
| අනාපත්ති | අනුපක්කමන්තස්ස, අමොචනාධිප්පායස්ස, සුපිනන්තේන පස්සන්තස්ස, උම්මත්තක / ඛිත්තචිත්ත / වේදනාට්ට / ආදිකම්මික |
| විපත්තිය | සීල විපත්තිය |
| අංග | චේතනා උපක්කමෝ මුච්චනං |
| සමුට්ඨාන | කාය චිත්ත සමුට්ඨාන |
| ක්‍රියා | ක්‍රියා වශයෙනි |
| සංඥා | සංඥා විමොක්ඛ යි |
| චිත්තය | සචිත්තක යි |
| වජ්ජ | ලෝක වජ්ජ යි |

කම්මය — කාය කම්මයි.
කුසලත්තිකය — අකුසල විපාක යි
වේදනාත්තිකය — දුක්ඛවේදනා යි

(15) ප්‍රථම සංඝාදිසේසයේ අංග හා ආපත්ති අනාපත්ති වාර හැඳින්වීම් කරන්න.

| | | | |
|---|---|---|---|
| චේතේති | උපක්කමති | මුච්චති | සංඝාදිසේසය |
| චේතේති | උපක්කමති | න මුච්චති | ථුල්ලච්චය |
| චේතේති | න උපක්කමති | මුච්චති | අනාපත්ති |
| න චේතේති | උපක්කමති | න මුච්චති | අනාපත්ති |
| චේතේති | න උපක්කමති | න මුච්චති | අනාපත්ති. |

අනාපත්ති

| | |
|---|---|
| අනුපක්කමන්තස්ස | අංගජාතයේ උපක්‍රම නොකොට |
| අමොචනාධිප්පායස්ස | මෝචනාස්වාද අදහසක් නැතුව |
| සුපිනං පස්සන්තස්ස | සිහිනවලදී |
| | උම්මත්තක / ඛිත්තචිත්ත / වේදනාට්ට / ආදිකම්මික |

(16) ප්‍රථම සංඝාදිසේසය කෙටියෙන් විස්තර කරන්න.

(17) යම් භික්ෂුවකට ශුක්‍ර ධාතුව මිදේ, සුපිනෙන් ආපත්ති සිදු නොවේ. නිදානයට අනුව හේතු දෙන්න.

නිදානයට අනුව උපවාස කාලයේදී භික්ෂූන් දත් වළදා සැතපෙති. අවසන්දේ පසුවන භික්ෂුවකට සිහින හොතා ආකාර හරින් කුමන හෝ ආකාරයකින් සිහිනයක් දැකීමෙන් ශුක්‍ර මෝචනයක් සිදුවිය හැකිය. මේ ආකාරයට සිදු වූ අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේගෙන් කරුණු විමසා ලද කල්හි සලකර සිහිනේ 'ඇවැත්ති! ආනාපත්ති' වශයෙනි.

(18) කාය සංසර්ගයෙන් වරදට පත්වීමෙහි සම්පූර්ණවිය යුතු අංග කීයද? ඒ මොනවාද?

05 කි.

මිනිස් ස්ත්‍රියක් වීම
ස්ත්‍රියක් ය යන හැඟීම
ශරීර ඇල්මන රාගය
එම රාගයෙන් වෑයම් කිරීම
අත් ආදිය ඇල්ලීම

(19) භික්ෂු ප්‍රාතිමෝක්ෂයට අයත් ඇවැත් ඡේජගාමිනී, උට්ඨානගාමිනී, දේශනා ගාමිනී වශයෙන් බෙදා දක්වන්න.

| | |
|---|---|
| ඡෙජජගාමිණී | පාරාජිකා |
| | (අනියත-පරිජි ඇවතකින් ප්‍රතිඥා කලේ නම්) |
| උටඨානගාමිණී | සංඝාදිසේස |
| | (අනියත-සඝවෙසෙස් ඇවතකින් ප්‍රතිඥා කලේ නම්) |
| දේශනාගාමිණී | ථුල්ලච්චය |
| | පාචිත්තිය |
| | (අනියත-පචිති ඇවතකින් ප්‍රතිඥා කලේ නම්) |
| | පාටිදේශනීය |
| | දුක්කට |
| | දුබ්භාෂිත |

(20) තමා උදෙසා කරන කුටියේ ඇතුළත දිග පළල කොපමණද?

| | | | |
|---|---|---|---|
| උපරිම ප්‍රමාණය | දිග | සුගත් වියත් | 12 |
| | පළල | සුගත් වියත් | 07 |
| අවම ප්‍රමාණය | දිග | සුගත් වියත් | 12 |
| | පළල | සුගත් වියත් | 04 |

(සුගත් වියත - මධ්‍යම පුරුෂයාගේ අතින් වියත් 03

(21) සිහින පෙනෙන ක්‍රම කීයද? ඒ මොනවාද? 04 යි.

| | |
|---|---|
| ධාතුක්ෂෝභ | වා පිත් සෙම් ආදී දොෂ කිපීමෙන් සිහින පෙනීම. |
| අනුභූත පූර්වකෙන | තමා පෙර දකින ලද, කරන ලද, කියන ලද, දෙයක් සිහිනයෙන් පෙනීම |
| දේවතෝපසංහාර | දේවතාවෝ හිත කැමැත්තෝ අකැමැත්තෝ හෝ ඉෂ්ටානිෂ්ට අරමුණු පෙන්වීම |
| පූර්වනිමිත්ත | මතු සිදුවිය හැකි යහපතක් හෝ අයහපතක් සිහිනයෙන් පෙනීම. |

(22) මහා සුද්ධාන්ත පරිවාසය සමාදන් විය යුත්තේ කෙබඳු භික්ෂුවක් ද?

උපසම්පදා වූ දිනයේ සිට පිරිසිදු කාලයක් සිහිනොකල නොහැකි භික්ෂුවට උපසම්පදා වූ කාලයම සලකා මෙම පිරිවෙස ලබාදේ.

(23) සංඝාදිසේස සමුට්ඨානය සප්තදශකාරයට අනුව විස්තර කරන්න.

24) පහත පදවල අර්ථ ලියන්න.

සඤ්චෙතනිකා — මෝචනාස්වාද චේතනා සහගතව

සුක්ක විස්සට්ඨි — අංගජාතය මෝචන කැමැත්තෙන් වූ කල්හි අධ්‍යාත්මික රූපාදිය විෂය නොවෙන ආරෝග්‍යාදි, යම් අභිප්‍රායක් මුදුන්පමුණුවා ගැනීම පිණිස මෝචනාස්වාද චේතනා සහගත ශුක්‍රයාගේ විසර්ජනය

ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන — කාය සංසර්ග රාගයා විසින් බැඳ ගන්නා ලද, ප්‍රකෘතියෙන් විරූපව පෙරළුනාවූ සිතින්

මාතුගාමෙන සද්ධිං — යටත් පිරිසෙයින් ඒ දවසෙහි උපන්නා වූ ජීවමාන මනුෂ්‍ය ස්ත්‍රිය

කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය — හස්ත ග්‍රහණාදී කාය මිශ්‍ර භාවයට පැමිණියේ

හත්ථග්ගාහං වා — යම් මිනිසෙක් මාතෘගාමයාගේ දෙවෙනි මහාසන්ධියේ සිට නිය අග දක්වා ඇති හස්තය කොතැනකින් හෝ අල්ලීම

වේණිග්ගාහං වා — ගොතා හෝ නොගොතා ගත් අනුපිළිවෙළ කල කොණ්ඩය ගැනීම

දුට්ඨුල්ලාහි වාචාහි — අසභ්‍ය වචන ( අසභ්‍ය )

මාතුගාමං — සුභාෂිත දුර්භාෂිත වදන් තේරුම් කලහැකි ස්ත්‍රියක්

ඔභාසෙය්‍ය — මාර්ග දෙක පිළිබඳ වර්ණනා අවර්ණනා වශයෙන් කථාකිරීම

අත්තකාම පාරිචරියා — තමාට මෛථුන ධර්මයෙන් උවටැන් කිරීම සඳහා

සඤ්චරිත්තං — ආවාහ විවාහ වැනි කටයුතු ස්ත්‍රී පුරුෂයන්ගේ ලියුම් පණිවුඩ පාවාරු කිරීම

සඤ්ඤාචිකාය — තමන් ඉල්ලාගත් දෑ නොවේ ආදියෝ

සපරික්කමනං — උපචාර සහිත බව ගවත් ගොන් දෙදෙනෙකු යොදා ලද ගැලක් කුටිය වටා ගමන් කරවන්නට හැකිවීම

දුට්ඨො දොසො — දුෂ්ට පුද්ගලයකුගේ ආකාර හැසිරීමය

අමූලකෙන පාරාජිකෙන ධම්මෙන — දිට්ඨ, සුත, පරිසංකිත සංඛ්‍යාත මුල් නැති බැවින් අමූලික පරිදි ඇවැතකින් ශුද්ධ භික්ෂුවට චෝදනා කිරීම

අනුද්ධංසෙය්‍ය — චෝදනා කිරීම හෝ මරණ ලබා කරවීම.

කිඤ්චි දෙසං ලෙසමත්තං උපාදාය — දශප්‍රකාර ලේශයන්ගෙන් එකක් හෝ ඇතිවන් පිළිවෙත්කොට ගෙන

අධිකරණං — සිව් අධිකරණයන්ගෙන් (විවාදාධිකරණය, අනුවාදාධිකරණය ආපත්තාධිකරණය, කිච්චාධිකරණය) ආපත්තාධිකරණ ගැනයි

සමග්ගස්ස සංඝස්ස — කයින් හා සිතින් එක්සත් වූ සමගි සංඝයාගේ

වග්ගවාදකො — සංඝයා කොටසක් වී කලහ කරන්නා වූ අසාධූජීය; භික්ෂූන්ගේ වචන අසන්නා වූ

දුබ්බචජාතිකො — දුර්වච ස්වභාවය හෙවත් අවවාද වශයෙන් යමක් කියනු ලබන කල්හි නොඉවසන ගතිය

කුලදූසකො — ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර වූ ප්‍රධාන කුල හතරක් වන අතර කුලසංග්‍රහය සඳහා ආරාමයෙහි ඇති මල්, ගෙඩි ආදිය දීමෙන් හා දූතකම වලින් ඒ ඒ කුලවල ශ්‍රද්ධාව විනාශ කිරීම (සාංඝික හෝ පෞද්ගලික දේපලවලින් වූ සුණු, හිඟු, ඵල, දර, මැටි දීමෙන්ද, වෙදහෙදකම් කිරීමෙද, දූත මෙහෙවර කිරීමෙන්ද, කුලවල ශ්‍රද්ධාව බිඳීමේ)

පාපසමාචාරො — කුල සංග්‍රහය සඳහා කැප හෝ නොකැප සැලසීමෙහි මල්පැළ රෝපණය කිරීම කරවීම නැත් ඉසීම ඉස්සවීම, මල් නෙළීම නෙලවීම මල්දම් ගෙතීම ගෙතවීමාදිය

# අනියත

(01) අනියත සික්ඛාපද කොපමණ ද?

02 යි.

(02) අනියත යන්න කුමන අර්ථයක් ගෙන දෙයි ද?

අනියත යනු අවිනිශ්චිතය යන්නයි. බුද්ධ සිසුව පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය යන උක්ත ඇවැතින් කුමකට ද යන්න නොකළහොත් අනියතව නිශ්චය කොට හැකි බැවින් ද උක්ත ඇවැත් තුන අතුරෙන් යමක් දැයි කෙරේ නම් ඒ ඇවැත්නුවේ වශයෙන් නිශ්චය කළයුතු බැවින් ද 'අනියත' යැයි කියනු ලැබේ.

(03) අනියත සික්ඛාපදෙහි අන්‍යොන්‍ය ඇති වෙනස පහදන්න.

| පළමු අනියත සික්ඛාපදය | දුතිය අනියත සික්ඛාපදය |
| --- | --- |
| පටිච්ඡන්න ආසනය | අපටිච්ඡන්න ආසනය |
| ඇවැත් තුනකින් චෝදනා කළ හැකිය. | ඇවැත් දෙකකින් චෝදනා කළ හැකිය |
| මෛථුන කර්මය සඳහා සුදුසු ස්ථානයකි. | මෛථුන කර්මය සඳහා සුදුසු නොවූ ස්ථානයකි. |

(04) පළමු අනියත සික්ඛාපදය කවුරුන් උදෙසා කවර ස්ථානයක දී පනවන ලද්දේ ද?

උදායි තෙරුන් වහන්සේ උදෙසා - සැවැත්නුවරදී

(05) පහත පද පහදන්න.

මාතුගාමො — අන්තිම පරිච්ඡේදයෙන් එදවස උපන් දැරිය ළදැරිය පවා මනුෂ්‍ය ස්ත්‍රිය

රහො — රහසිගතව

අනියතො — අවිනිශ්චිතය

තමාට නො ඇත පරිත්‍යාගං ආසනං ගොත්

සමකින් ආවරණය නොවූ අපෙහෙකින්ම මෛවුන්දම් සේවිමට අපේක්ෂා ශ්‍රී අනූන

සුදෙවගෙයවසා උපාසිකා

විශ්වාස කටයුතු වනා ඇති සෝවාන් ඵලයට පැමිණි ආර්ය ශ්‍රාවිකාවක්

# නිසැඟි පච්ති

## චීවර වර්ගය.

01. නිස්සග්ගි පාචිත්ති කීයද?

30 යි.

02. නිස්සග්ගි පාචිත්ති වර්ග කීයද? ඒ මොනවාද?

03 යි.

චීවර වර්ගය, කෝසිය වර්ගය, පාත්‍ර වර්ගය.

03. චීවර වර්ගයට අයත් පළමු සික්ඛාපදය පාලියෙන් ලියන්න.

'නිට්ඨිත චීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ දසාහපරමං අතිරෙක චීවරං ධාරෙතබ්බං තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං'

04. නිස්සග්ගිය යන්නෙහි කෙටි තේරුම ලියන්න.

තම අයිතිය අතහැර වෙනත් අයකුට පැවරීම.

05. අධිෂ්ඨාන කළයුතු තුන් සිවුරේ ප්‍රමාණ දක්වන්න.

| | | |
|---|---|---|
| සංඝාටිය | දිග | මුට්ඨි පඤ්චකය |
| | පළල | මුට්ඨි ත්‍රිකය |
| උත්තරාසංග | දිග | මුට්ඨි පඤ්චකය |
| | පළල | මුට්ඨි ත්‍රිකය |
| අඳනය | දිග | මුට්ඨි පඤ්චකය |
| | පළල | දෙරියන |

(06) චීවරයට අනුදැන වදාළ නූල් හා ඊට අනුලෝම වන නූල් දක්වන්න.

| නූල් වර්ග | අනුලෝම නූල් වර්ග |
|---|---|
| ඛෝම | දුකූල |
| කප්පාසික | පත්තුණ්ණ |
| කොසෙය්‍ය | චීන පට |
| කම්බල | සෝමාර පට |
| සාණ | ඉද්ධිමය |
| භංග | දේවදින්න |

(07) තුන්සිවුරු අධිෂ්ඨානයට පෙර කල යුතු කරුණු ලියන්න.

කඩ කපා කැප නූල් වර්ග හා රෙදි වලින් මසා ගන්නා ලද සිවුර රංගෙයය, ග්‍රීවෙයය, ගණ්ඨි, පාස සම්පූර්ණ කොට පඬු පොවාගත යුතුය. ඉන්පසු නිල්, කළු හෝ මඩ පාටින් කප් බිංදුව නූමාගේ සිට සතරැඟුලක් පමණ ඇතුලට වන්නට කොන් සතරේම හෝ තුනක, දෙකක හෝ එකක 'ඉමං කප්ප බින්දුං කරෝමි' කියා මොනර ඇසක් පමණ ප්‍රමාණයට තැබිය යුතුය. දැන් මෙම සිවුර අධිෂ්ඨානයට සුදුසු සිවුරකි.

කඩ කැපීම
සිවුරු මැසීම කැප නූල් සහ රෙදි වර්ගවලින්
රංගෙයය ග්‍රීවෙයය ඇල්ලීම
ගණ්ඨි පාස ඇල්ලීම
පඬු පෙවීම
කප් බිංදු තැබීම.

(08) නිසැඟි වූ තුන් සිවුර යළි දෙන ආකාරය ලියන්න.

<u>දසාහාතික්කන්ත චීවර නිස්සජ්ජීම</u> (පළමු කඨින සික්ඛාපදය)

<u>තුන් සිවුරක්</u>

'ඉදං මෙ ආවුසො චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි'

'ඉමං චීවරං ආයස්මතො දම්මි' (එසේ, පිළිගත් භික්ෂුව නැවත චීවරය දිය යුතුය.)

<u>සිවුරු බොහෝ නම්</u>

'ඉමානි මෙ ආවුසො චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි ඉමානහං ආයස්මතො නිස්සජ්ජාමි'

'ඉමානි චීවරානි ආයස්මතො දම්මි'

<u>රත්තිවිප්පවුත්ථ නිසැඟි චීවර නිස්සජ්ජීම</u> (දුතිය කඨින සික්ඛාපදය)

<u>තුන් සිවුරක්</u>

'ඉදං මෙ භන්තෙ චීවරං රත්තිවිප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං, ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි'

'ඉමං චීවරං ආයස්මතො දම්මි' (එසේ පිළිගත් භික්ෂුව නැවත චීවරය දිය යුතුය.)

<u>සිවුරු බොහෝ නම්.</u>

'ඉමානි මෙ භන්තෙ චීවරානි රත්තිවිප්පවුත්ථානි අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියානි ඉමානහං ආයස්මතො නිස්සජ්ජාමි'

'ඉමානි චීවරානි ආයස්මතො දම්මි'

(ශ) තුන් සිවුරු අධිෂ්ඨාන කරන්නේ කෙසේද?

කඩ කපා කැප පුළු වර්ගවලින් සහ රෙදිවර්ගවලින් මසන්නා ලද ~~සිවුරු~~ චීවරයෙහි ත්‍රිවෙසය සංස්ථ භාග සම්පූර්ණ කොට නමා සකසාගත යුතුය. ඉන්පසු වළේ නල හෝ මඩ නාටින් නුවාගේ සිට සාරගලක් පමණ අඳෙලට වන්නට කොට් සකරම ඊට දෙපස හෝ සුකාකා ඉමං කප්ප බිංදුං කරෝමි කියා මොනර ඇසක් පමණ ප්‍රමාණයට කප් බිංදුව තැබිය යුතුය. අධිෂ්ඨානට සුදුසු සිවුරක් වෙය.

<u>තුන් සිවුරු සමීපයේ ඇතිවිට</u>

ඉමං සංඝාටිං අධිට්ඨාමි
ඉමං උත්තරාසංගං අධිට්ඨාමි
ඉමං අන්තරවාසකං අධිට්ඨාමි

යනුවෙන් සිතින් සිතමින් අතින් ස්පර්ශ කරමින් හෝ වචනයෙන් තුන් වතාව කියමින් කෙරෙනවිට අධිෂ්ඨානය සිදුවේ

<u>තුන් සිවුරු සමීපයේ නැතිවිට</u> (තිබෙන තැන සලකා)

එතං සංඝාටිං අධිට්ඨාමි
එතං උත්තරාසංගං අධිට්ඨාමි
එතං අන්තරවාසකං අධිට්ඨාමි

යනුවෙන් අධිෂ්ඨාන කළ යුතුය.

(10) අන්තිම සිවුර හැර භික්ෂුවකට තවත් කැප සිවුරු කොපමණද? ඒ මොනවාද?

6 කි.

වස්සික සාටිකය
නිසීදනය
පච්චත්ථරණය
කණ්ඩු පටිච්ඡාදනය
මුඛ පුඤ්ඡනචෝලය
පරික්ඛාර චෝලය

(11) සිවුරු විකප්පනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

චීවර විකප්පනය යනු තමා අයත් චීවර අන්කෙනෙකුට දීමකි. එහෙත් එය සම්පූර්ණ අයිතියට දීමක් නොව විනය කර්මයකි.

(12) විකප්පනය කළයුතු චීවර මොනවාද?

අන්තිම සිවුරු ආදී ලෙස අධිෂ්ඨාන නොකළ සිවුරු

(13) සිවුරු දෙකක් සීමිත කාලයක් අධිෂ්ඨාන කළ යුතුද, නැවත විකප්පනය කළ යුතුද වේ. ඒ මොනවාද?

වස්සික සාටිකය
කණ්ඩු පටිච්ඡාදනය

(14) භික්ෂුවගේ සියලු සිවුරු පැහැරගන්නා ලද්දේ හෝ. නැසුණා හෝ ඉල්ලා ගතයුතු සිවුරු කෙසේද?

අඳනය හා උත්තරාසංගය පමණක් හෝ ඊට සරිලන රෙදි පමණක් ඉවසිය යුතුය.

(15) භික්ෂුවගේ සිවුරු නැසුණා වේ. ඒ පිළිබඳ සිකපද දෙකක් ඇත. ඒවායේ පිළිවෙලිය සුදුසු පැහැදිලි කරන්න.

අඤ්ඤාතක විඤ්ඤත්ති ශික්ෂාපදය.

භික්ෂුවකට කිනම් අවස්ථාවක වුවද නෑයන්ගෙන් හා පැවරූ දායක-යන්ගෙන් ඉල්ලීමට සුදුසුය. සොර සතුරන් විසින් පැහැරගත් විටෙක හෝ ගිනි දිය සුළං ආදියෙන් හෝ සතුන් කෑමෙන් හෝ සිවුරු නැසීමටම පත් වූ විටෙක පමණක් නොනෑ නොපැවරූ අයගෙන්ද සිවුරු ඉල්ලිය හැකිය. එහැර නොනෑ නොපැවරූ අයගෙන් යටත් පිරිසෙයින් වියතක් දිග වියතක් පළල රෙදි කඩක් වුවද ඉල්වා ගතහොත් නිසැගි පචිති වේ.

තතුත්තරි ශික්ෂාපදය.

සිවුරු නැසුණා වූ භික්ෂුව නොනෑ නොපැවරූවන්ගෙන් සිවුරු ඉල්ලූ විට ඔබ වහන්සේට අවශ්‍ය තරම් ගන්න යැයි සිවුරු රෙදි කමුල ගෙනයිද අපේ ගබඩාවෙන් ගන්න යැයි හෝ කීයේ ද, එවිට සිවුරු සියල්ලම නැසුනේ නම් අඳනයත් උත්තරාසංගයත් පමණක් හෝ ඊට සරිලන රෙදි පමණක් ඉවසිය යුතුය. සිවුරු දෙකක් නැසුනේ නම් එක් සිවුරක් හෝ ඊට සරිලන රෙදි ගත යුතුය. ප්‍රමාණය ඉක්මවා ගත්තේ නම් නිසැගි පචිති වේ.

(15) සිවුරු විකප්පනය කරන ආකාරය පහදන්න.

තුන් සිවුරු අධිෂ්ඨාන කල භික්ෂුවට අතිරේක චීවරයක් දින දහයකට වඩා කාලයක් තම සන්තකයෙහි තබා ගත හොත් නිස්සග්ගිය පාචිත්තිය. එසේ නමුත් අධිෂ්ඨාන නොකර අතිරේක චීවරයක් තබාගැනීමට අවශ්‍ය වන්නේ නම් එය විකප්පනය කල යුතුය. විකප්පනය යනු තමා අයත් චීවර අන් අයකුට දීමකි. එහෙත් එය සම්පූර්ණ අයිතියට දීමක් හෝ පූජා කිරීමක් හෝ නොව විනය කර්මයකි. එය සම්මුඛ විකප්පන, පරම්මුඛ විකප්පන ලෙසින් දෙආකාරය.

මෙහිදී සිවුර ඒකාංශ කොට පොරවා තමන් භික්ෂුවක් ඉදිරියේ උක්කුටිකයෙන් හිඳ විකප්පනය කරන චීවරය අතින් ගෙන

'ඉමං චීවරං තුය්හං / ආයස්මතො විකප්පේමි' කියාද

සිවුරු බොහෝ නම්

'ඉමානි චීවරානි තුය්හං / ආයස්මතො විකප්පේමි' කියාද, තුන්වර බැගින් කියා සිවුරු දුන් විට විකප්පනය සිදුවේ.

විකප්පනය කරන ලද සිවුරු ලබාගෙන පැවිද්දන් තර තැබීමට වටී. නිස්සග්ගි නොවේ. එහෙත් එය පරිභෝජනයට ගැනීමට නොහැකිය. එසේ පරිභෝජනය කිරීමට නම් පච්චුද්ධාරය අනුදන්න.

මෙහිදී චීවර විකප්පනය ලැබූ භික්ෂුව විසින් තම අතට එම සිවුර ගෙන

'ඉමං චීවරං මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජේහි වා යථා පච්චයං කරෝහි / කරොථ' කියාද

බොහෝ සිවුරු නම්

'ඉමානි චීවරානි මය්හං සන්තකානි පරිභුඤ්ජථ වා විස්සජ්ජේථ වා යථා පච්චයං කරෝහි / කරොථ' කියාද තුන්වර බැගින් කියා සිවුරු ආපසු භාර දිය යුතුය.

(17) යම් භික්ෂුවක් අධිෂ්ඨාන කරන ලද තුන් සිවුරෙන් එකක් අරුණ නැගෙනවිට අත්හැර නොසිටීමෙන් සඟළ සිවුර කෙසේ මුක්ත නොවෙති. හේතු දක්වන්න.

යම් භික්ෂුවකට කඨිනානිසංස ඇතිවිට කඨිනානිසංස කාලය තුළ තුන් සිවුරෙන් වෙන්ව විසුවද නිසැගි නොවේ. අනෙක්ම සංඝ සම්මුතියකින් අවසර ලත් භික්ෂුවටද තුන් සිවුරෙන් වෙන්ව විසීමෙහි ඇවැත් සිදු නොවේ. තවද සම්මත කරන ලද තිචීවර අවිප්පවාස සීමාවක් තුළ තුන් සිවුරෙන් වෙන්ව අරුණ නැගීම හැකි අතර ඇවැත්නොවේද වේ.

(18) අලුත් සිවුරක් පරවන භික්ෂුව ඒ සඳහා කළු සුදු කබුල් වර්ණ වූ අල්ලෙම් යොදාගත යුත්තේ කවර අනුපාතයකටද?

| කළු පාට | සුදුපාට | කබුල් පාට |
|---|---|---|
| 2 | 1 | 1 |

(19) වැසි සළුවට අදාළ දිග පළල කොපමණද?

| | | | |
|---|---|---|---|
| අවමය | දිග | 6 | සුගත් වියත් |
| | උස | 2 ½ | " |
| උපරිමය | දිග | 8 | සුගත් වියත් |
| | උස | 4 | " |

කඨිනාස්තාරය යනු කුමක් ද ?

තුන් සිවුරු ඉටා පරිභෝග කරන්නා වූ භික්ෂුවට එක් රාත්‍රියක දු තුන් සිවුරෙන් වෙන්ව විසුව හොත් නිස්සග්ගි පාචිත්ති වේ. එබැවින් එසේ තුන් සිවුරු පරිභෝග කරන භික්ෂුවට යා යා තැන තුන් සිවුරු ගෙන යා යුතුය. මෙහි තරමක අපහසුතාවයක් වූ කාලයක් භාග්‍යවතුන් වහන්සේ තරමක පහසුවක් ඇතිකර දෙනුවස් භික්ෂුවට පහසුකමක් ලැබෙන්නා වූ කඨිනාස්තාර විනය කර්මය අනුදැන වදාළහ.

යම් සැදැහැවතෙකු විසින් කඨිනාස්තාරයට නියමිත කාලය තුළදී පෙරවස් වැස පවාරණය කළ භික්ෂූන් විෂයෙහි '<u>ඉමං කඨින චීවරං සංඝස්ස දෙම</u>' චීවරයක් සඟ සතු කොට පිදූ කල්හි ඔහු සංඝයා වහන්සේ විසින් එය ගෙන සීමාවට රැස්ව කඨිනාස්තාර විනය කර්මය කරනු පිණිස එය ලබන්නට <u>සුදුසු</u> භික්ෂුවක් තෝරා ඥප්ති ද්විතීය කර්ම වාචාව කියා කඨින වස්ත්‍රය එම භික්ෂුවට ප්‍රදානය කළ යුතුය.

එසේ දෙන ලද කඨින වස්ත්‍රය ලද භික්ෂුව එදිනම කපා මසා නිමකොට අධිෂ්ඨානයට සුදුසු පරිදි පිළියෙල කරගෙන ලද්දක් නම් වස් වැසූ සීමාව තුළ සිට, පසු කප්බිඳු තබා එය සංඝාටියක් නම් තමාගේ පරණ සංඝාටිය පච්චුද්ධරණය කොට '<u>ඉමං සංඝාටිං අධිට්ඨාමි</u>' යි තුන්වරක් කියා එය ඉටා ගත යුතුය. එය උතුරුසළුවක් වී නම් පරණ උත්තරාසංගය පච්චුද්ධරණය කොට '<u>ඉමං උත්තරාසංගං අධිට්ඨාමි</u>' ලෙස තෙවරක් කියා ද ලැබුණේ අඳනයක් නම් පරණ අන්තරවාසකය පච්චුද්ධරණය කොට '<u>ඉමං අන්තරවාසකං අධිට්ඨාමි</u>' යි තුන්වරක් කියා ද ඉටා ගත යුතුය.

ඉන්පසු එම චීවරය අතට ගෙන සංඝාටිය නම් '<u>ඉමාය සංඝාටියා කඨිනං අත්ථරාමි</u>' යි ද උත්තරාසංගය නම් '<u>ඉමිනා උත්තරාසංගේන කඨිනං අත්ථරාමි</u>' යි ද අන්තරවාසකය නම් '<u>ඉමිනා අන්තරවාසකේන කඨිනං අත්ථරාමි</u>' යි ද යනුවෙන් තුන්වරක් කිය යුතුය.
එසේ කිරීම 'කඨිනාස්තාර විනය කර්මය' වන අතර මේ සඳහා අවම පස් නමකින් යුත් භික්ෂු සංඝයා සිටිය යුතුය.

(21) කඨිනයක් අතුරන භික්ෂුවගේ සුදුසුකම් අට මොනවාද?

පුබ්බකරණං ඤාණං
කඨින වස්ත්‍රය සේදීම මිනුම් ගැනීම මැසීම ආදී පූර්වකෘත්‍යය දැනීම.

පච්චුද්ධාරං ඤාණං
පරණ සිවුර පච්චුද්ධරණය කිරීම දැනීම.

අධිට්ඨානං ඤාණං
නව සිවුර අධිෂ්ඨාන කිරීම දැනීම

අත්ථාරං ඤාණං
කඨිනය ඇතිරීම දැනීම

මාතිකං ඤාණං
කඨින උද්ධාර කරුණු අට දැනීම

පලිබොධං ඤාණං
කඨිනය සහ ඇලෙවන ආවාස චීවර පළිබෝධ දැනීම.

උද්ධාරං ඤාණං
කඨිනය උදුරන අයුරු දැනීම

ආනිසංසං ඤාණං
කඨිනානිසංස දැනීම.

(22) කඨිනානිසංස පහ ලියන්න.

අනාමන්තචාරය

කඨිනය ඇතිරීමෙන් පසු භික්ෂූන්ගෙන් නොවිචාරා කුලවල හැසිරිය හැකිය.

අසමාදානචාරය

අධිෂ්ඨාන කළ තුන් සිවුරෙන් වෙන්ව ඇති දොළොස් ගතකළේ ඇවැත් නොවේ.

ගණභෝජනය

අකැප ව්‍යවහාරයෙන් ලද දානයක් වැළඳීමෙන් ඇවැත් නොවේ.

යාවදත්ථ චීවර

උපදිනතාක් එකා කාලයක් අතිරේක චීවර තබාගැනීමෙන් ඇවැත් නොවේ.

යො ච තත්ථ චීවරුප්පාදො

කඨිනය අතුරන ලද වස් සීමාව තුළදී ලැබෙන සෑම සෑම සිවුරු සියල්ලම කඨිනය ඇතිරූ භික්ෂුවටම අයිති වේ.

(23) උපසපන් භික්ෂුවකට සංඝ සම්මතයෙන් තුන් සිවුරෙන් වෙන්ව සිටිය හැකිය. අදාළ කර්ම වාක්‍යයේ නම ලියන්න.

ඤත්ති දුතිය කර්ම වාක්‍යය.

(24) වැසි සළුවක් සොයාගැනීම සඳහා උත්සාහවත් විය යුතු මාසය කුමක්ද?

චීවර මාසය වස් පවාරණයෙන් පසු ඇති මාසය.

(25) කඨිනාස්තරණ විනය කර්මය සඳහා භික්ෂූන් පස් නමක් අවශ්‍ය වන්නේ ඇයි ?

කඨින චීවරය ලබන ප්‍රතිග්‍රාහක භික්ෂුවට කඨිනාස්තරණ විනය කර්මය සඳහා චීවරය ලබාදිය යුත්තේ ඤත්ති දුතිය කර්ම වාක්‍යය මගිනි. ඒ සඳහා සංඝයා ලෙස අවම වශයෙන් භික්ෂූන් වහන්සේලා සතර නමක් සිටිය යුතු වේ. එබැවින් කඨිනාස්තරණ විනය කර්මය සඳහා ප්‍රතිග්‍රාහක භික්ෂුව හා නිර්නාමන සංඝයා වශයෙන් අවම ලෙස පස් නමක් අවශ්‍ය වේ.

(26) නිසැගි පචිතිවල චීවර වග්ගයේ 1 2 3 සික්ඛාපදවල ප්‍රකාශනයට ඇති වෙනස පහදා ලියන්න.

පළමු සිකපදයෙන් කියැවෙන්නේ අතිරේක චීවරයක් සම්බන්ධවයි. ඒ අනුව අතිරේක චීවරයක් දසදින ඉක්මවීමෙන් නිසැගි පචිති වේ. කඨින ආනිසංස නැති කාලය තුළ මෙය බලපැවැත්වේ.
දෙවැනි සිකපදයෙන් කියැවෙන්නේ තුන්සිවුර සම්බන්ධවයි. එයට අනුව තුන් සිවුර අරුණෝද්ගමනයට පෙර ආසන්නයේ නොතිබීමෙන් නිසැගි පචිති වේ. මෙහි කඨිනානිසංස ඇති කල්හි හා සංඝ සම්මුතියකින් අවසර ලත් භික්ෂුවට ඇවැත් සිදු නොවේ.

තුන්වන සිකපදය අකාලයේ ලැබෙන චීවර සම්බන්ධවයි. ඒ අනුව අකාලික චීවරයක් ලැබුණොත් වහා සිවුරක් කළ යුතුය. සිවුරකට නොසෑහේ නම් අඩුව සම්පූර්ණ කරගනු පිණිස නොඉක්මවා උපරිම වශයෙන් මසක කාලයක් තැන්පත් කර තැබිය හැකිය. බලාපොරොත්තුව ඇතද ඉන් මත්තෙහි තබාගන්නා හට නිසැගි පචිති වේ. මෙහිද කඨිනානිසංස ඇති කල්හි ඇවැත් නොවේ.

(27) සිවුරුවල අධිෂ්ඨානය සිඳෙන ආකාර අතුරින් තුන් සිවුරට පමණක් ආවේණික ක්‍රමය කුමක්ද ?

සුළැඟිලි නියපිට ප්‍රමාණයේ සිදුරක් සෑදීමෙන් අධිෂ්ඨානය බිඳේ..

(28) දසදිනකට අතිරේක සිවුරක් අනුදැන වදාල පසුබිම ලියන්න.

භාගයවතුන් වහන්සේ විශාලා මහනුවරදී භික්ෂූන්ට තුන්සිවුරු අනුදැන වදාල සේක. එකල්හි ඡබ්බග්ගිය භික්ෂූහු වෙන වෙන තුන්සිවුරු වලින් ගම්වැදීමාදිය කෙරෙති.

අල්පේච්ඡ භික්ෂූහු මෙය දැකී නොකළ අතර භාගයවතුන් වහන්සේටද සැල කළේය. එකල්හි භාගයවතුන් වහන්සේ යෝ පන භික්ඛු අතිරේක චීවරං ධාරෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං අනුදැන වදාල සේක.

එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට අතිරේක සිවුරක් උපන. උන්වහන්සේ එය ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට දෙනු කැමති වූහ. එහෙත් උන්වහන්සේ ඒ කාලයෙහි සාකේතයෙහි වෙසෙති.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙහිදී කෙසේ පිළිපැදිය යුතුදැයි සිතා භාගයවතුන් වහන්සේට මෙය සැල කළේය. භාගයවතුන් වහන්සේ 'සාරිපුත්‍රයන් කොතෙක් කලකින් මෙහි පැමිණෙන්දැයි' ඇසූහ. නව දවසකින් හෝ දස දවසකින් බැව් කී කල්හි අනුජානාමි භික්ඛවේ දසාහපරමං අතිරේක චීවරං ධාරේතුං යි වදාරා පළමු ශික්ෂාපදය අනුප්‍රඥප්තියක් ප්‍රකාශ කළේය.

(29) කුටියක් පරිභෝජනය අභිනිර්මාණයට යෝග්‍ය ප්‍රමාණ දක්වන්න.

| | | | |
|---|---|---|---|
| උපරිම | දිග | 8 | සුගත් වියත් |
| | උස | 4 | " |
| අවම | දිග | 4 | සුගත් වියත් |
| | උස | 2 | " |

(30) රජෙකු හෝ වෙනත් කිසියම් කෙනෙක් සිවුරක් ගෙනයෑමට කියා දූතයෙකු අත යම්කිසි මුදලක් යැවූයේ නම් භික්ෂුව විසින් පිළිපැදිය යුතු ආකාරය සිවර වර්ගයේ දැක්වෙන ශික්ෂාපදයට අනුව පහදන්න.

රජ, රජ ඇමති, බමුණු, ගොවි යනාදී යමෙක් හෝ කෙනෙක් 'මේ මුදලින් සිවුරක් මිලදී ගෙන අසවල් භික්ෂුවට දෙව' යි කියා දූතයෙකු අත සිවුරු මිලක් යවයි. දූතයා භික්ෂුව වෙත පැමිණ 'වහන්ස! ඔබ උදෙසා මේ සිවුරු මිල ගෙන එන ලදී, එය පිළිගනු මැනව' යි කියයි. එවිට ඒ භික්ෂුව 'මිත්‍රය අපි සිවුරු මිල පිළි නොගනිමු, අවශ්‍ය විටෙක සිවුරක් පිළිගන්නෙමු' යි කිව යුතුය. ඉදින් දූතයා කැපකරුවෙකු විමසුවේ නම් ඉන් ප්‍රයෝජන ඇති භික්ෂුව ආරාමිකයෙකු හෝ උපාසකයෙකු 'මොහු අපේ කැපකරු' යයි පෙන්විය හැක. දූතයා ද කැපකරු හමුවී භික්ෂුව වෙත ගොස් 'වහන්ස! කැපකරු සිවුරු දෙන ලෙසට හඳුන්වා ගන්නා ලදී, අවශ්‍ය විටෙක ළඟ යනු මැනව! ඔහු සිවුරු ගෙනදේවි' යැයි කියයි. ඉන් ප්‍රයෝජන ඇති භික්ෂුව කැපකරු වෙත ගොස් දෙතුන් වරක් ඉල්ලිය හැකිය. නොලැබේ නම් සයවතාවක් වර දක්වා ගොස් නිශ්ශබ්දව සිටිය හැක. ඉන් නොලැබේ නම් සත්වතාවක් වර වෑයම් කොට ලබා සිවුර සෙවිය යුත්තේ ය. සිවුර නොලැබුණු භික්ෂුව සිවුරුමිල එවූ අය වෙත ගොස් හෝ දූතයෙකු යවා 'ඔබ අප වෙත එවූ සිවුරු මිලයෙන් ප්‍රයෝජනයක් නොවීය; එය නොනස්වා ගනිත්වා!' යැයි දැන්විය යුත්තේය.

(31) හත්ථපාසය හෙවත් අත්පස වෙන වෙනම දක්වන්න.

බෝජන පිළිගැන්වීමේදී රියන් 2 ½

විනය කර්මවලදී රියන් 1 ½

(32) සාංඝික වස්තු හා පුද්ගලික වස්තු මොනවාද?

අකැප වස්තු

- සාංඝික වස්තු
  - රන් රිදී
  - මසු කහවනු (මුදල්)
- පුද්ගලික වස්තු
  - උළුවිට රත්නයන්
  - සප්ත ධාන්‍ය
  - දාස දාසීන්
  - ආයුධ කෝප්ව
  - තූර්ය භාණ්ඩ
  - එළුවන් ගවයන්
  - මාගමුන්ගේ ඇඳුම් පැළඳුම්
  - සත්ත්ව ප්‍රතිමා (ලෝහ/ලී)

(33) සප්ත ධාන්‍ය මොනවාද?

| | |
|---|---|
| සාලි | ඇල් වී |
| වීහි | වී |
| යව | බාර්ලි |
| ගෝධුම | තිරිඟු |
| කංගු | තණහාල් |
| වරක | වරක නම් ධාන්‍ය |
| කුද්‍රූසක | කුරක්කන් |

(34) පංච භේෂජ්ජ නම් කරන්න.

| | |
|---|---|
| සප්පි | ගිතෙල් (එළු ගිතෙල්, ගව ගිතෙල්, මී ගිතෙල්) |
| නවනීත | වෙඬරු = බටර් (අමු මසට කැප සත්ත්වයන්ගේ වෙඬරු) |
| තේල | තලතෙල් |
| මධු | මී පැණි |
| ඵාණිත | උක් පැණි |

(35) දුතිය කඨින සික්ඛාපදයේ ආපත්තිවාරය පැහැදිලි කරන්න.

| | |
|---|---|
| නොවෙන්ව විසීමෙහි වෙන්ව විසුවෙමියි සිතන්නහුට | දුක්කට |
| " " " " විමති ඇත්තහුට | දුක්කට |
| වෙන්ව විසීමෙහි වෙන්ව නොවිසුවෙමියි සිතන්නහුට | නිස්සග්ගි පචිත්ති |
| " " " " විමති ඇත්තහුට | නිස්සග්ගි පචිත්ති |
| වෙන්ව විසීමෙහි | නිස්සග්ගි පචිත්ති |
| නිස්සග්ගි සිවුර පාවිච්චියේ දී | දුක්කට |

## කෝසිය වර්ගය.

(36) ජාතරූප සික්ඛාපදය අයත් වන්නේ කවර වර්ගයටද?

කෝසිය වර්ගයට

(37) ජාතරූප රජත සික්ඛාපදය අයිති වර්ගය හා කීවැනි සික්ඛාපදය දැයි ලියා ඊට සිංහල තේරුම ලියන්න.

කෝසිය වර්ගය
8 වැනි සික්ඛාපදය

යම් භික්ෂුවක් රන් රිදී ගනී ද, අනිකෙකු ලවා ගන්වා ද, තොපයින් තබන ලද්දක් හෝ සිතින් ඉවසා ද (ඔහු හට) නිස්සග්ගි පචිත්ති වේ.

(38) යම් භික්ෂුවක් සිවුරු පිරිකර වෙනත් අයකුට දී නැවත ආපසු කරන කෝපයෙන් ගෙන්වා ගන්නේ නම් කවර ඇවතකට පත්වන්නේද?

නිස්සග්ගි පචිත්ති
පංච සහධාර්මිකයන් සමග ආපත්ති.

39 නිසැගි පචිතිවල කෝසිය වග්ගයේ දේශිත රන්රිදී වස්තු මුදල් වස්තු පිළිගැනීමද, ගනුදෙනු කිරීමද, චීවරාදි කැපදේ නුසුදුසු පුද්ගලයන් සමඟ ගනුදෙනු කිරීමද වළක්වාලමින් වදාළ ශික්ෂාපද වෙන වෙනම ලියන්න.

රන්රිදී වස්තු හා මුදල් වස්තු පිළිගැනීම. - රූපිය ශික්ෂාපදය.

යෝ පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

ගනුදෙනු කිරීම - රූපිය සංවෝහාර ශික්ෂාපදය.

යෝ පන භික්ඛු නානප්පකාරකං රූපිය සංවෝහාරං සමාපජ්ජෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං

චීවරාදි කැපදේ නුසුදුසු පුද්ගලයන් සමඟ ගනුදෙනු කිරීම. - කය වික්කය ශික්ෂාපදය

යෝ පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං

40 යෝ පන භික්ඛු නානප්පකාරකං කය වික්කයං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං යන ශික්ෂාපදයේ තේරුම ලියා භික්ෂුවකට ගනුදෙනු කළ හැකි අය නම් කරන්න.

යම් භික්ෂුවක් නානප්පකාර වූ කැප භාණ්ඩ හුවමාරුවට පැමිණියේ (කය වික්කයට) නිසැගි පචිති වේ.

සාමණේර
සාමණේරි
සික්ඛමානා
භික්ෂුණී
භික්ෂු

(41) ක්‍රය වික්‍රය යනු කුමක්දැයි හඳුන්වන්න.

මේ බඩුව ගෙන මේ බඩුව දෙව යි අනුන්ගේ බඩුවක් ගැනීම ක්‍රය නම් වේ. තමන්ගේ බඩුව දීම වික්‍රය නම් වේ. මෙසේ තමාගේ බඩුවක් දී අනුන්ගේ බඩුවක් ගැනීම හෝ අනුන්ගේ බඩුවක් ගෙන තමන්ගේ බඩුවක් දීම හෝ ක්‍රය වික්‍රය නම් වේ. පංච සහධාර්මිකයන් හැර සෙසුන් සමඟ කළ විනිමයකාර ගනුදෙනු කිරීම මීට ඇතුළත් වේ.

(42) විදුශෝර ශික්ෂාපදයකට උපමා කළ මුදල් පරිහරණය භික්ෂුවට තහනම් කළ හේතුව කෙටියෙන් ලියන්න.

උපනන්ද ශාක්‍යපුත්‍රයන් වහන්සේ ඇසුරුකළ කුලයක් සමඟ යහළු විය. එකුලෙහි ඛාද්‍යභෝජ්‍යාදී යමක් සම්පාදිත වී නම් උපනන්ද තෙරුණුවන්ටද කොටස අයිති වේ.

දිනක් දවසක් සවස් භාගයෙහි එකුලෙහි මාංසයක් සැදූහ. එයින් කොටසක් කුලූපග භික්ෂූන් වහන්සේට තැබූ නමුත් පසුදා ප්‍රත්‍යූෂ කාලයෙහි අවදිව ලමෝ එය අනුභව කළාහුය. පසුව ඇවිද තෙරුණුවන්ට මෙය කියා 'කහවණුවකින් නුඹ වහන්සේට කොටස් මාංසයක් ගෙනෙන්නම්' දැයි ඇසීය. එවිට ඒ කහවණුව ඉල්ලා ගත්තේය. එයට නොපහන් ගැහැවිය නුගුණ කියන්නට විය. මෙකරුණ බුදුන් වහන්සේට සැල කළ කල්හි 'රූපිය ශික්ෂාපදය' අනුදැන වදාරන ලදි.

(43) 'උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය' යන පදය හඳුන්වන්න.

සම්මුඛයෙහි තබා හෝ නොහමුවෙහි වූ රන් රිදී මුදලක් හෝ මොහු විසින් වචනයෙන් හෝ හස්ත මුද්‍රාවෙන් හෝ පරිත්‍යාග කරන කල්හි කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂේප නොකොට සිතින් ඉවසීමයි.

(44) යම් භික්ෂුවක් මුදල් භාර ගත්තේ නම් එම ජීවිතය වළාකුළින් වැසීගිය සඳ මඬලක් මෙන් තමාටවත් ලෝකයාටවත් ආලෝකය දීමට සමත් නොවේ. එබැවින් මුදල් පිළිගත් භික්ෂුව නිවිය හැකි අන්තරායිකකරුණු මොනවාද?

ආණාවීතික්‍රම අන්තරාය. ශික්ෂා ව්‍යතික්‍රමණය කිරීම

<u>අනෙක් අන්තරායන්.</u>

උපවාද අන්තරාය - ආර්යෝපවාද
ක්ලේශ අන්තරාය - මිථ්‍යා දෘෂ්ටි
කම්ම අන්තරාය - ආනන්තරිය පාප කර්ම
විපාක අන්තරාය - අහේතුක ද්විහේතුක උපප්පත්ති

පාත්‍ර වර්ගය.

(45) අලුත් පාත්‍රයක් බලාපොරොත්තු වන භික්ෂුව පරණ පාත්‍රයට බන්ධන කීයක් තිබුනු පසු පාත්‍රය ලබාගත යුතුද?

05 කි

(46) අතිරේක පාත්‍රයක් දරන්නාවූ භික්ෂුව දින කීයක් තබා ගෙන එය දැරිය යුතුද?

දස දිනක්

(47) පාත්‍ර වර්ග නවයෙකි. ඉන් අධිෂ්ඨාන නොකළ හැකි පාත්‍ර වර්ග කීයද? ඒ මොනවාද?

02 කි.

උක්කට්ඨ උක්කට්ඨ
ඕමක ඕමක

(48) පාත්‍ර ජාති වශයෙන් ප්‍රමාණ වශයෙන් වර්ග කර දක්වන්න.

යකඩ පාත්‍රය
මැටි පාත්‍රය.

උක්කට්ඨ උක්කට්ඨ
උක්කට්ඨ
උක්කට්ඨ ඕමක

මජ්ඣිම උක්කට්ඨ
මජ්ඣිම
මජ්ඣිම ඕමක

ඕමක උක්කට්ඨ
ඕමක
ඕමක ඕමක

(49) පහත සඳහන් සිදුවීම් වලදී භාවිතා කරන විනය කර්ම වාක්‍යය ලියන්න.

තුන් සිවුරු අධිෂ්ඨානය ☑

තුන් සිවුරු පච්චුද්ධරණය

<u>සමීපයේ අත්හැරීම</u>

ඉමං සංඝාටිං පච්චුද්ධරාමි
ඉමං උත්තරාසංගං පච්චුද්ධරාමි
ඉමං අන්තරවාසකං පච්චුද්ධරාමි

යනුවෙන් සිතින් සිතමින් අතකින් ස්පර්ශ කරමින් මේ වචනයේ උච්චාරණය කරමින් කියන විට පච්චුද්ධරණය සිදුවේ.

## සමීපයේ නැති විට

ඒතං සංඝාටිං පච්චුද්ධරාමි
ඒතං උත්තරාසංගං පච්චුද්ධරාමි
ඒතං අන්තරවාසකං පච්චුද්ධරාමි

ඉහතින් තිබෙන ආකාර සලකා සිතින් හෝ වචනයෙන් ප්‍රකාශනය කිරීමෙන් කියා එම පච්චුද්ධරණය වේ.

චීවර විකප්පනය. ☑

උපාධ්‍යායකයාණන් සඳහා චීවර නය දෙසීම ☑

රෝගීව්පසු කලං සඳහා චීවර නය දෙසීම. ☑

පාත්‍ර අධිෂ්ඨානය

සමීපයේ ඇති විට — ඉමං පත්තං අධිට්ඨාමි
සමීපයේ නැති විට — ඒතං පත්තං අධිට්ඨාමි

තෙවරක් කියා අදිටන් කළ යුතුය

පාත්‍ර පච්චුද්ධරණය

සමීපයේ ඇති විට — ඉමං පත්තං පච්චුද්ධරාමි
සමීපයේ නැති විට — ඒතං පත්තං පච්චුද්ධරාමි

තෙවරක් කියා පච්චුද්ධරණය කළ යුතුය.

උද්ඝාටිතඥාන පුද්ගලයා සඳහා දෙසීම

'අයං මෙ ආවුසො සත්තො උද්ඝාටිතඥානෙන නිස්සරණියො ඉමෙසං ආයතනෙන නිස්සරාමි'

සියා සඳදෙසා ආසන්න දේශනා කරගත පුද්ගලයා.

පරිවර්තනය
'ඉමං නාමං ආයතනෙ දමමි'

ඡන්දය දීම

සභාසභා ඉදිරියේ

ඡන්දං දමමි ඡන්දං මෙ ආරොචෙමි

භික්ෂුවක් අත යැවීමට

ඡන්දං දමමි ඡන්දං මෙ හර / හරථ ඡන්දං මෙ ආරොචෙහි/ආරොචෙථ

ඡන්දය හා පිරිසිදු බව

සභාසභා ඉදිරියේ

ඡන්ද පාරිසුද්ධිං දමමි ඡන්ද පාරිසුද්ධිං මෙ ආරොචෙමි

භික්ෂුවක් අත යැවීමට

ඡන්ද පාරිසුද්ධිං දමමි , ඡන්ද පාරිසුද්ධිං මෙ හර/හරථ , ඡන්ද පාරිසුද්ධිං මෙ ආරොචෙහි / ආරොචෙථ

වස් සමාදානය

'ඉමස්මිං විහාරේ ඉමං තේමාසං වස්සං උපෙමි, ඉධ වස්සං උපෙමි'
තෙවරක් කිව යුතුය.

වස් පවාරණය

පූර්ව කෘත්‍යය නිමවා

සංඝ පවාරණා ඤත්ති

'සුණාතු මෙ භන්තෙ! සංඝො අජ්ජ පවාරණා පන්නරසී යදි සංඝස්ස පත්තකල්ලං සංඝො පවාරෙය්‍ය'

වැඩිහිටි භික්ෂූන් වහන්සේ විසින් උක්කුටිකයෙන් හිඳ, අංජලිකර්මයෙන් නමස්කාරය තෙවරක් ප්‍රකාශ කොට

සංඝං ආවුසො! පවාරෙමි, දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය, පස්සන්තො පටිකරිස්සාමි.

දුතියම්පි ආවුසො! - පෙ -
තතියම්පි ආවුසො! - පෙ -

නවකෝන

සංඝං භන්තෙ! පවාරෙමි, දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය, පස්සන්තො පටිකරිස්සාමි.

දුතියම්පි භන්තෙ! - පෙ -
තතියම්පි භන්තෙ! - පෙ -

# ආපත්ති දේශනා කිරීම.

**දේශක** ඔකාස අහං භන්තෙ! සබ්බා ආපත්තියො ආරොචෙමි
දුතියම්පි...
තතියම්පි...

**පටිගාහක** සාධු! සාධු!!

**දේශක** ඔකාස අහං භන්තෙ! සම්බහුලා නානා වත්ථුකා ආපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමි

**පටිගාහක** පස්සසි ආවුසො! තා ආපත්තියො

**දේශක** ආම භන්තෙ! පස්සාමි

**පටිගාහක** ආයතිං ආවුසො! සංවරෙය්‍යාසි

**දේශක** සාධු, සුට්ඨු අහං භන්තෙ! ආයතිං සංවරිස්සාමි.
දුතියම්පි...
තතියම්පි...

**පටිගාහක** සාධු! සාධු!!

**දේශක** ඔකාස අහං භන්තෙ! සබ්බා තා ආපත්තියො ආවිකරොමි
දුතියම්පි ...
තතියම්පි ...

**පටිගාහක** සාධු! සාධු!!

උපාධ්‍යායගෘහණය.

සාමණේර — උපජ්ඣායො මෙ භන්තෙ හොහි

උපාධ්‍යාය — පතිරූපං

සාමණේර — සාධු ! ඔකාස සම්පටිච්ඡාමි. (තෙවරක්)

ආචාර්යගෘහණය

අන්තෙවාසික — ආචරියො මෙ භන්තෙ හොහි ආයස්මතො නිස්සාය වච්ඡාමි

ආචාර්ය — පතිරූපං

අන්තෙවාසික — සාධු ඔකාස සම්පටිච්ඡාමි (තෙවරක්)

හිසකෙස් රැවුල් බෑමට නිය කැපීමට සිවුරු සේදීමට

ඔකාස අහං භන්තෙ
කෙසමස්සු ඔහාරණත්ථාය නඛච්ඡෙදනත්ථාය චීවර ධොවනත්ථාය ආපුච්ඡාමි

තෙවරක් කිව යුතුය.

# පාචිත්තිය

# මුසාවාද වර්ගය

(01) පචිති ශික්ෂාපද කොපමණ ද?

92 යි.

(02) දෙයානූවක් පචිති ආපත්තීන්ගේ වර්ග කොපමණද? ඒ මොනවාද?

09 යි.

මුසාවාද වග්ග
භූතගාම වග්ග
භික්ඛුනොවාද වග්ග
භොජන වග්ග
අචේලක වග්ග
සුරාපාන වග්ග
සප්පාණක වග්ග
සහධම්මික වග්ග
රාජ වග්ග

(03) මුසාවාද වග්ගයෙහි මුල් ශික්ෂාපදය පාලියෙන් ලියා එහි භාවාර්ථය ලියන්න.

'සම්පජාන මුසාවාදෙ පාචිත්තියං'

දැන දැන බොරු කීමෙහි පචිති වේ.

(04) සම්පජාන මුසාවාදෙ පාචිත්තියං මෙහි ඇතුළත් ප්‍රභේදය දක්වන්න.

| | |
|---|---|
| නැති උතුරු මිනිස් දම් ප්‍රකාශ කර අසත්‍ය දැනගත්තේ නම් | පාරාජිකා |
| අමූලක පාරාජිකාවකින් චෝදනා කිරීම | සංඝාදිසේස |
| නැති උතුරු මිනිස් දම් ප්‍රකාශ කර අසත්‍ය තේරුම් නොගත්තේ | ථුල්ලච් |
| අමූලක සංඝාදිසේසයකින් චෝදනා කිරීම | පචිති |
| දැන දැන බොරු කීමෙහි | පචිති |
| උපෝසථාගාරයෙහි පිරිසිදු බව අසාවිට අපිරිසිදුව සිට නිහඬව සිටීම | දුක්කට |
| ආචාර විපත්තියෙන් අනුද්ධංසනය කිරීම | දුක්කට |
| තිරිසනාගෙන් නැති උතුරු මිනිස් දම් ආරෝචනය | ථුල්ලච් |

(05) සම්පජාන මුසාවාද ශික්ෂාපදයෙහි නිදානය, පුද්ගලයා, වස්තුව ලියන්න.

| | |
|---|---|
| නිදානය | සැවැත් නුවර |
| පුද්ගලයා | හත්ථක ශාක්‍ය පුත්‍රයා |
| වස්තුව | අවජානනය කොට පටිජානනාදිය කිරීම වස්තුව. |

(06) දසවිධ ඔමසවාද මොනවාද?

ජාති
නාම
ගොත්‍ර
කර්ම
ශිල්ප
ආබාධ
ලිංග
කෙලෙස
ආපත්ති
ආක්‍රොශ

(07) පදසොධම්ම ශික්ෂාපදය පාලියෙන් ලියා භාවාර්ථයද ලියන්න.

'යො පන භික්ඛු අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙය්‍ය පාචිත්තියං'

යම් මහණෙක් අනුපසම්පන්නයකු හට පාලිධර්මය පදයෙන් පදය උගැන්වා (කියවා ද) පචිති වේ.

(08) 'යො පන භික්ඛු අනුපසම්පන්නෙන උත්තරිං දිරත්තං තිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං'

මෙම ශික්ෂාපදය පාචිත්තිය කොටසේ කුමන වර්ගයට අයත් ද? කීවැනිද?

මුසාවාද වර්ගය
පස්වැනි ශික්ෂාපදය.

(09) සහසෙය්‍ය ශික්ෂාපදයෙහි 'අනුපසම්පන්නෙන උත්තරිං දිරත්තං තිරත්තං සහසෙය්‍යං' යන්න විස්තර කරන්න.

උපසපන් භික්ෂූහු හැර යටත් පිරිසෙයින් තිරිසන් ගණයකු සමඟ වුව ද උත්තරිං වශයෙන් දෙ තුන් රැයකට වඩා කය දිගු හැරීම සංඛ්‍යාත සයනයද, යම් සේනාසන සංඛ්‍යාත ගෘහයක සිටීමද යන දෙවිධ අර්ථයෙන් සැලකිය යුතු.

(10) අනුපසම්පන්නයන් සමඟ රාත්‍රී තුනක් සයනය කිරීමට අවසර දුන් හේතුව කුමක්ද?

බුදුරදුන් වහන්සේ ආලවියෙහි අග්ගාලව වෙහෙරෙහි වැඩ වසන සමයෙහි උපාසකයෝ බණ ඇසීමට වෙහෙරට යෙති. බණ හමාර කළ කල්හි ස්ථවිර භික්ෂූහු ත් ත් වෙහෙරට යෙති. නවක භික්ෂූහු උපස්ථාන ශාලාවෙහිම උපාසකයන් සමඟ ගොරවමින් කසමින් නග්නව මුළා වූ සිහි ඇතිව සයනය කෙරෙති. උපාසකයෝ උජ්ඣායනය කරත්ම බුහ. ඒ හේතු කොට ගෙන 'යො පන භික්ඛු අනුපසම්පන්නෙන සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං' යි අනුදත්හ.

ඇත් දවසක් කොසඹෑ නුවරදී භික්ෂූහු ආයුෂ්මත් රාහුලයන්

වහන්සේට මෙසේ කීහ. 'ඇවැත්නි! රාහුලය භාග්‍යවතුන් වහන්සේ විසින් අනුපසම්පන්නයන් සමඟ ශයනය නොකට යුතු යයි ශික්ෂාවක් පනවන ලදි. ඒ නිසා ශයනයක් සොයාගනුව' යි කියාහ.

උන් වහන්සේ බුදුන් වැසිකිළියෙහි ශයනය කළේය. භාග්‍යවතුන් වහන්සේ පසුදා රෑ අලුයම් කාලයෙහි නැගිට වැසිකිළියට වඩින සේක් දොර ළඟදී කැස්සහ. රාහුල තෙරේ ද කැස්සහ. කවරෙක් දැයි? ඇසූ කල්හි රාහුල තෙම කරුණු සැල කළේය. ඒ හේතු කොට ගෙන 'යො - පෙ - උත්තරිං දිරත්තං තිරත්තං සහසෙය්‍යං පාචිත්තියං' යි අනුදැන වදාළ සේක.

(11) භික්ෂුවක් මාගමක් සමඟ එක් වහලක් යට ශයනය කරන භික්ෂුවට සිදුවන ඇවැත කුමක්ද?

දුතිය සහසෙය්‍ය සික්ඛාපදයට අනුව 'දුක්කට' වේ.

(12) පුරුෂයෙක් නැති තැන මාගමකට දහම් දෙසීමේදී පවතින ඇවැතට අංග කීයද? ඒ මොනවාද?

05 යි.

වුත්තලක්ඛණස්ස ධම්මස්ස පදානං වාචානං උද්දෙසනා
වුත්තලක්ඛණො මාතුගාමො
ඉරියාපථ පරිවත්තනා'භාවො
කප්පිය කාරකස්ස අභාවො
අපඤ්හ විස්සජ්ජනාති

(13) 'පස්විං ශබ්දය වර්' මෙහි පැළවියේ ප්‍රභේද දක්වන්න.

පැළවි

ජාන පැළවි
(ජීවී නොහොව)

↓

ශුද්ධ පැළවි
(තනිකරම එක් ජිවිතී නොහොව)

මිශ්‍රක පැළවි
(මිශ්‍ර නමුදු වැඩිපුර එක් ජිවිතී නොහොව)

ප්‍රභේද පැළවි
(කැඩූ එක් හෝ මුල් නොමැති සාර ගැසකට පසු)

අජාන පැළවි
(නොජිවිතී නොහොව)

↓

තනිකරම ගල් බොරළු සහිත නොහොව

වැඩිපුර ගල් බොරළු සහිත නොහොව

පිළිස්සීමෙන් පසු නොහොව

කැඩූ එක් හෝ මුල් නොමැති නම් සාරයක් නොමැතිනම් පෙර නොහොව

ශාකගාම වර්ගය.

(14) 'ශාකගාම භූතවර්ගය තාවිනාසියට' යන්නෙහි තේරුම ලියන්න.

වැසුළමා දී, ශාකයෙහි හාටගත් ශාක සමූහයා විනාශ කිරීමෙන් පවිත වේ.

(15) බීජගාම භූතවර්ගයට අයත් වන්නේ මොනවාද?

මූල බීජ - මුල් වලින් පැළවෙන (කහ ඉඟුරු)
ඛන්ධ බීජ - අතුවලින් පැළවෙන (මඤ්ඤොක්කා)
ඵලු බීජ - පුරුක්වලින් පැළවෙන (උණ උක්)
අග්ග බීජ - ගසේ අගින් පැළවෙන (මුහුවල ඉරිවෝරිය කදුනලා)
බීජ බීජ - බීජ වලින් පැළවෙන (වී මුං කව්පි)

(16) බීජගාම සිඳීමෙන් වන ඇවත කුමක්ද?

දුෂ්කට

(17) බීජගාම - භූතගාම යන මෙහි අර්ථ ලියා ආපත්ති අනාපත්ති වාර දක්වන්න.

භූතගාම — වැඩෙන ගස්වැල් තණ වනස්පති ආදියයි.

බීජගාම — මූලබීජ, ඛන්ධබීජ, ඵළුබීජ, අග්ගබීජ, බීජබීජ ආදියයි.

| | | | | |
|---|---|---|---|---|
| | භූතගාම | භූතගාම | සඤ්ඤී | පාචිත්ති |
| ආපත්ති | අභූතගාම | භූතගාම | සඤ්ඤී | දුක්කට |
| | භූතගාම | භූතගාම | විමතී | දුක්කට |
| | අභූතගාම | භූතගාම | විමතී | දුක්කට |

අනාපත්ති —
ඉමං දෙහි
ඉමං ආහර
ඉමිනා අත්ථො
ඉමං ජාන
ඉමං කප්පියං කරොහි යනාදීන් කියන්නාට

නොදැනීමෙන් අසිහියෙන් ඡේදනය කරන්නාට
උම්මත්තක / ඛිත්තචිත්ත / වේදනාට්ට / ආදි කම්මික

(18) බීජගාම දේවල් කප්පියං නොකර වළඳීමෙන් සිදුවන ආපත්තිය කුමක්ද? කැපකර ගන්නා ක්‍රම මොනවාද?

ගින්නෙන් ස්වල්පයක් පිළිස්සීම, නියෙන් ස්වල්පයක් කැපීම
ආයුධයකින් ස්වල්පයක් කැපීම යන ක්‍රමවලින් කැපකරවාගෙන ලබා ආහාරට ගත යුතුය.

(19) ප්‍රාණීන් රහිත ජලය පානය කරන භික්ෂුවට ඇවැතක් විය හැකිද?

ඔව්.
ප්‍රාණීන් රහිත ජලය වුවද විමති ඇතියෙකුට 'දුක්කට' වේ.

## භික්ඛුනෝවාද වර්ගය.

(20) භික්ෂුණීන් ගරුකොට පිළිගත යුතු අෂ්ට ගරු ධර්ම මොනවාද?

අද දවස උපසපන් වූ භික්ෂුවට වස් සියයක් වියද භික්ෂුණිය වැඳ ගරු බුහුමන් කළ යුතු.
භික්ෂුණිය භික්ෂූන් නැති ගමෙක ආරාමයෙක නොවිසිය යුතු.
භික්ෂූන්ගෙන් අඩමසකට වරක් පොහොය විචාරීම අවවාද ලබාගැනීම කළ යුතු.
වස් විසීමෙන් අනතුරුව උභය සංඝයා ඉදිරියේ පවාරණය කළ යුතු.
උභතෝ සංඝයා කෙරෙහි පක් මානත් පිරිසිදිය යුතු.
ශික්ෂමානාවක් ලෙස දෙ අවුරුද්දක් උපසපන් වීමට පෙර විසිය යුතු.
භික්ෂුණිය කිසිසේත් මහණ නම හට ආක්‍රෝශ නොකළ යුතු.
භික්ෂූන්ට අවවාද අනුශාසනා නොකළ යුතු.

(21) 'නොනෑ භික්ෂුණිය' යන පදය පැහැදිලි කරන්න.

සත්මුතු පරම්පරාවේ සිට මවුපසින් හෝ පියපසින් නොනෑ වූ උපසපන් භික්ෂුණිය.

## භෝජන වර්ගය.

(22) භෝජන වගයේ ඇති ශික්ෂාපද දහය අනුපිළිවෙලින් නම් කරන්න.

ආවසථ පිණ්ඩ ශික්ෂාපදය
ගණභෝජන ශික්ෂාපදය
පරම්පරභෝජන ශික්ෂාපදය
කාණමාතු ශික්ෂාපදය
පඨම පවාරණා ශික්ෂාපදය
දුතිය පවාරණා ශික්ෂාපදය
විකාලභෝජන ශික්ෂාපදය
සන්නිධිකාරක ශික්ෂාපදය
පණීතභෝජන ශික්ෂාපදය
දන්තපොන ශික්ෂාපදය

(23) 'යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භෝජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං'

මෙම ශික්ෂාපදය පචිති ඇවැත් කොටසේ කුමන වර්ගයට අයත් ශික්ෂා පදයක්ද? කී වැනිද?

භෝජන වර්ගය
පස් වැනිය

(24) 'භුත්තාවී' යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ලියා දක්වන්න.

කරන ලද බත්කිස ඇත්තෙක් යන්නයි. එනම් යම්කිසි භික්ෂුවක් විසින් ඔදන කුම්මාස සත්තු මච්ඡ මංස යන පස්වැදෑරුම් භෝජනයන් අතුරෙන් ස්වල්ප වූ ද භෝජනයක් විකා හෝ නොවිකා හෝ ගිලිනා ලද නම් ඒ භික්ෂුව භුත්තාවී හෝ භුත්තාවා හෝ කියා කිව හැකිය.

(15) ආහාරයට ගෙනෙන භෝජන වර්ග හා ආහාරය සම්පූර්ණ වීමට අවශ්‍ය අංග ලියන්න.

<u>ආහාරයට ගෙනෙන භෝජන වර්ග.</u>

ඔදන - බත් කැඳ වැනි සහිත ධාන්‍යයෙන් පිසින ලද ආහාර

කුම්මාස - තලප පිට්ටු වැනි යව හෙවත් බාර්ලි වලින් සකස් කරන ලද ආහාර

සත්තු - අග්ගලා අලුවා වැනි ඇඹ කරන ලද බුදි ඇඹ නොකරන ලද බුදි සහිත ධාන්‍යයන් බැද කුඩු කර සකස්කරගන්නා ලද ද්‍රව්‍ය ආහාර

මච්ඡ - සියළුම මත්ස්‍ය මාංශ

මංසං - කැල සතුන්ගේ මාංශ

<u>ආහාරය සම්පූර්ණවීමට අවශ්‍ය අංග.</u>

අසනං සඤ්ඤායකා - පසු භෝජනයෙන් කවරියක් හෝ වළඳා තිබෙන බව

භෝජනං සඤ්ඤායකා - පසු භෝජනයන්ගෙන් කවරියක් හෝ පාත්‍රයේ ඇතිබව

හත්ථපාසෙ ඨිතො - පසු භෝජනයක් ගෙන අයකු වළඳනා භික්ෂුවගේ අත්පසට ඇතුළත ඇතිබව

අභිහාරො - භික්ෂුවට බෙදීම පිණිස යෝග්‍ය වූ භෝජන ඇතුරෙන් යමක් කයින් අභිහාරණය කිරීම.

පටික්ඛෙපො සඤ්ඤායකා - ළඟට ගෙනෙන ලද භෝජනය කයින් හෝ වචනයෙන් ප්‍රතික්ෂේප කිරීම.

(26) ආදේශය වා ආක්ෂේපය වා යන්නෙහි වෙනස පහදන්න.

(27) චෝදනා පවාරණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

යම් භික්ෂුවක් වැඩසිටියේ අවසරව ලද චෝදනාය ප්‍රතික්ෂේප කරන මේදී ද පවාරණය වූයේ වෙයි. සුවිට අතික්ත වූ චෝදනයක් හැර සැද සුත දෙයක් හෝ අනුසාව කළයුතු දෙයක් හෝ කා නම් හෝ අනුසාව කරයි නම් පවිති වේ. පවාරණය සම්පූර්ණ වීම සඳහා පස් අංගයක් තිබිය යුතුය.

අකතං පඤ්ඤායති — තමා චෝදනයක් ඇතිව යමක් සිවල්‍යක් හෝ වරද්‍ය කිරීම

නොවිනං පඤ්ඤායති — තමා චෝදනයෙන් සිවල්‍යක් හෝ හැදුයේ කිරීම.

පාරාජිකසෙ යිනො — තමා චෝදනයේ රැගෙන සෙතු අතිසට තැබීම කිරීම

අධිකරණ — තමා චෝදනා ඇතිව යමක් බෙදන්නට සැරසීම.

පටිකොටෙහි පඤ්ඤායති — කයින් හෝ වචනයෙන් සුදය ප්‍රතික්ෂේප කරයි.

මෙකරුණු පිරුණු කල්හි පවාරණය වූයේ වෙයි.

(28) අතිරිත්ත භෝජනය හා ගිලාන අතිරිත්තය යනු කුමක්ද?

| | |
|---|---|
| අතිරිත්ත භෝජනය | වැඩි වූ ආහාර හෙවත් 'කප්පියං කතං' යනාදි වූ සම්ප්‍රදායානුකූල වූ විනය කර්මාකාර වලින් කැප කරන ලද භෝජනයක් යම් භෝජනයක් ගිලානාතිරිත්ත නම් සැයත් යන ද්විප්‍රකාර භෝජනයම අතිරිත්ත භෝජන නම් වේ. |
| ගිලාන අතිරිත්තය | ගිලන් භික්ෂුව අනුභව කොට ඉතිරි වූ යම් භෝජනයක් වේ නම් සැයත් ගිලන් භික්ෂුව සඳහාම 'කැමති දවසක කැමති විටෙක අනුභව කෙරේවායි ගෙනවා තබන ලද යම් ආහාරයක් වේ නම් සැයත් ගිලානාති-රිත්ත භෝජනය නම් වේ. |

(29) පවාරණ සික්ඛාපදයෙහි අංග කීයද? ඒ මොනවාද? (භෝජන පවාරණ)

03 යි.

| | |
|---|---|
| පවාරිත භාවො | පවාරණය කරඇති බව |
| ආමිසස්ස අනතිරිත්තතා | ඉතිරි නොකළ ආහාරයක් වීම. |
| කාලෙන අජ්ඣොහරණන් | පවාරණය වූ දිනයෙහි පෙරවරුවෙහි වැළඳීම |

(30) භෝජන පවාරණ සික්ඛාපදයෙහි ආපත්ති අනාපත්ති කරුණු පැහැදිලි කරන්න.

ආපත්ති

කෑ යුතු වැළඳිය යුතු දෙයක් කන්නෙමි' යි වළඳන්නෙමි' යි කියා පිළිගැනීමෙන් දුක්කට

වළඳනා පිඩක් පාසා පචිති

අනතිරිත්ත භෝජනය ගැන 1. අනතිරිත්තය යැයි හැඟීමෙන්
2. සැකයෙන්
3. අතිරිත්තය යැයි හැඟීමෙන්
කා නම් හෝ වළඳයි නම් පචිති

අනාපත්ති

පවාරිත ආහාරය අතිරිත්ත කරවාගෙන වැළඳීමෙන්
අතිරිත්ත කරවාගෙන වළඳන්නෙමි' යි කියා පිළිගැනීමෙන්
පවාරිත භික්ෂුව හෝ භික්ෂුවකට ආහාර ගෙනයාමෙන්
ගිලන් භික්ෂුව වළඳා ඉතිරිය වැළඳීමෙන්
යාමකාලික, සත්තාහකාලික, යාවජීවික ප්‍රත්‍යයක් ඇතිවිට වැළඳීමෙන්
උම්මත්තක / ඛිත්තචිත්ත / වේදනාට්ට / ආදිකම්මික

(31) පවාරණය වූ භෝජනය කැපකරගන්නා ආකාරය දක්වන්න.

පවාරිත භික්ෂුව කැපකරන භික්ෂුවට 'භන්තෙ අතිරිත්තං කරොථ' කියා භාජනය දිය යුතුය. කැපකරන භික්ෂුව ඉන් කොටසක් වළඳා 'අලමෙතං සබ්බං' කියා නැවත භාජනය දිය යුතුය.

(22) විකාලභෝජන ශික්ෂාපදයෙහි සඳහන් ඛාදනීය භෝජනීය විකාලෙ යන පද පහදන්න.

ඛාදනීය — පංච භෝජන, සත්තාහකාලික, යාමකාලික, යාවජීවික හැර ඉතිරි සියල්ල ඛාදනීය වේ.

භෝජනීය — පංච භෝජන

විකාලෙ — මධ්‍යාහ්නය ඉක්මගියාට පටන් අරුණ උදාවන තෙක් කාලය.

(23) විකාලභෝජන ශික්ෂාපදයෙහි ආපත්ති අනාපත්ති වාරය පැහැදිලි කරන්න.

ආපත්ති

මෙහිදී විකාලත්‍රිකයෙහි
1. විකාලය යන හැඟීමෙන්
2. විකාලය යන සැකයෙන්
3. කාලය යන හැඟීමෙන් — පචිති

යාමකාලික සත්තාහකාලික යාවජීවික දෙයක් ආහාර පිණිස පිළිගැනීම — දුකුළා
ගිලීම වාරයක් පාසා — දුකුළා
කාලයෙහි විකාලය යන හැඟීමෙන් — දුකුළා
කාලයෙහි විකාලය යන සැකයෙන් — දුකුළා

(84) කාලික සතර හැඳින්වීම කරන්න.

යාවකාලික — අරුණ නැගී තැන් පටන් හිරු මුදුන් වනතෙක් ගතයුතු ආහාර

* ඒ ඒ ප්‍රදේශවල ආහාර සම්මත දේ
* සියළු ධාන්‍ය වර්ග
* නව මහා ඵල

[තල්, පොල්, කොස්, දෙල්, ලබු, කොමඩු, පුස්සවල, පුහුල්, කැකිරි]

යාමකාලික — හිරු මුදුන් වී පැසීම ඇරඹි තැන් පටන් පසුදින අරුණ නැගීම තෙක් කාලය තුල ගතයුතු ආහාර

අෂ්ටපාන හා රස අනුරූප දේ

[අඹ, දඹ, ඇටිකෙසෙල්, කෙසෙල්, මී පැණි, මිදි, මානෙල් අල, උගුරැස්ස]

සත්තාහකාලික — සත්දිනක් තබාගෙන වළඳිය හැකි පස් බෙහෙත්.

| | |
|---|---|
| සර්පි | ගිතෙල් |
| නවනීත | බටර් වෙඬරු |
| තේල | තලතෙල් |
| මධු | මී පැණි |
| ඵාණිත | උක් පැණි |

යාවජීවික — දිවි ඇති තෙක් තබාගෙන වළඳිය හැකි මුල් කාලික තුන අයත් නොවූ සියල්ල හා ඇත් ද බෙහෙත්ද මීට අයත්ය.

(35) පහත සඳහන් දෑ තුළින් කාලිකයන්ට අයත් දැයි සඳහන් කරන්න.

උක්පැණි , උක් හකුරු , උක්දඬු , ලුණු , ගිතෙල් , අඹ , අරළු , මී පැණි , අඹවා
දැහැත් , ඉඟුරු , හාබෝල

| යාවකාලික | යාමකාලික | සත්තාහකාලික | යාවජීවික |
|---|---|---|---|
| අඹවා | | උක්පැණි | ලුණු |
| උක්දඬු | | උක් හකුරු | අරළු |
| | | ගිතෙල් | හාබෝල |
| | | මී පැණි | දැහැත් |
| | | | ඉඟුරු |
| | | | අඹ |

(36) උදක දන්තපොන සික්ඛාපදයෙහි පැවත කතාව කෙටියෙන් ලියන්න.

එක්තරා මහණෙක් සර්ව පාංශුකූලික වූයේ සොහොනෙහි වෙසෙයි. හෙතෙම මිනිසුන් දෙනු ලබන්නක් පිළිගන්නට කැමති නොවේ. සොහොනෙහිද රුක්මුල් ආදියෙහිද තබන ලද ආහාර නොවම ගෙන අනුභව කරයි. සෑමවිට කලුරිය කල පියවරුන් සඳහා තබන ලද ඛාද්‍ය භෝජනයන් ගෙන වළඳයි. සාරකා මිනිසුන් නොපැහැදී දොස් කීහ. ඒ බැව් දත් බුදුහු "යො පන භික්ඛු - අ- පාචිත්තියං" යි ශික්ෂාව අනුදත්හ.

පසුකලෙක භික්ෂූන් පැන් දැහැටි ආදියද නොපිළිගෙන පරිභෝග කරන්ට අනුදුනු යැයි කුකුස් කළාහුය. පසුකලෙක භාග්‍යවතුන් වහන්සේ "අනුජානාමි භික්ඛවෙ අත්තනා උදක දන්තපොනං සාමං ගහෙත්වා පරිභුඤ්ජිතුං" යි වදාරා 'අඤ්ඤත්‍ර උදක දන්තපොනා' යන අනුප්‍රඥප්තියක් පළමු ශික්ෂාවට ඇතුළත් කොට වදාළ සේක.

(37) උපසම්පන් භික්ෂුවකට යමක් නොපිළිගෙන වැළඳීම වරදෙකි. එහෙත් මෙහි සාමණේර දී විසින් නොපිළිගත්ත වැළඳිය හැකි දේ සහ අවස්ථා ඇත. ඒවා මෙසේ ය.

දැහැටි සහ පැන් පිළිනොගෙන වැළඳිය හැකිය.

සර්පයකු දෂ්ට කල කල්හි කැපකරුවකු ද නොවූයේ නම් මහාවිකටය පිළිනොගෙන වැළඳිය හැකිය.

(38) විනයකර්ම අත්පස ආහාර පිළිගැන්වීමේ අත්පස පංච භෝජනය ප්‍රණීත භෝජනය මහාවිකටය චාතුරංගනී සේනාව පැහැදිලි කරන්න.

| | |
|---|---|
| විනය කර්ම අත්පස | රියන් 1½ |
| ආහාර පිළිගැන්වීමේ අත්පස | රියන් 2½ |
| පංච භෝජනය | ඔදන, කුම්මාස, සත්තු, මච්ඡ, මංස |
| ප්‍රණීත භෝජනය | සප්පි, නවනීත, තෙල, මධු, ඵාණිත<br>මච්ඡ, මංස, ඛීර, දධි |
| මහාවිකටය | සර්පයකු දෂ්ට කලවිට වැළඳිය හැකි බෙහෙතකි. මෙය මළ, මූත්‍ර අළු මැටි දියකර පෙරා සාදාගනී. |
| චාතුරංගනී සේනාව | හස්ති සේනා<br>ඇත් ඇතකු සමඟ පුරුෂයන් 12 දෙනෙක්<br>අශ්ව සේනා<br>ඇස් අශ්වයකු සමඟ පුරුෂයන් 03 දෙනෙක්<br>රථ සේනා<br>ඇස් රථයක් සමඟ පුරුෂයන් 04 දෙනෙක්<br>පාබල සේනා<br>කඩුගත් පුරුෂයන් 04 දෙනෙක්. |

(39) දුක්කට වර්ග කීයද? ඒ මොනවාදැයි සඳහන් කරන්න.

08 කි.

පුබ්බපයෝග දුක්කට — සොරකමින් යමක් ගැනීමට දෙවෙනියකු සොයා යෑමද උදලු කුඩාදිය සොයාමද ඒ වෙනුවෙන් යෙදෙමිද මෙවැනි පූර්ව ක්‍රියාවලදී සිදුවන දුක්කටය'යි.

සහපයෝග දුක්කට — සොරබඩු ගැනීම පිණිස හටගත් අතු හෝ වැල්, ඉරුදැමිය සිඳීමේදී සිදුවන දුක්කටය'යි.

අනාමාස දුක්කට — උතුම් රුවන් සත්වැදෑරුම් ධාන්‍ය ආයුධ තූර්ය භාණ්ඩ ස්ත්‍රී රූප ස්පර්ශ කිරීමේදී සිදුවන දුක්කටය'යි.

දුරුපචිණ්ණ දුක්කට — නොපිළිගත් දෑ අල්ලීම කෙසෙල්, නැමිලි පොල් පුවක් අඹ ආදී ගස්වල හටගත් පල අල්ලීම ආදියේදී සිදුවන දුක්කටය'යි.

විනය දුක්කට — භික්ෂු පිණ්ඩය පැමිණෙන කල්හි පාත්‍රයෙහි දූවිලි රොඩු ආදිය වැටුණු විට පාත්‍රය නැවත පිළිගොත හෝ සෝදා හෝ ශුද්ධව පිළිනොගැනීමේදී සිදුවන දුක්කටය'යි.

ඤාත දුක්කට — කිසියම් භික්ෂුවකගේ වරදක් අසා දැය කළනොකිරීමේදී සිදුවන දුක්කටය'යි.

ඤත්ති දුක්කට — අනෙකෙකුගේ වැරදුම සමනුභාසන කර්මයන්හිදී ඤත්තිය තැබීමේදී වරදකරුට සිදුවන දුක්කටය'යි.

පටිස්සව දුක්කට — වස් වසන්නෙමි යි පොරොන්දු වී දැය කඩකිරීම වැනි දෙයින් සිදුවන දුක්කටය'යි.

අචේලක වර්ගය
සුරාපාන වර්ගය
සප්පාණක වර්ගය
සහධම්මික වර්ගය
රත්න වර්ගය.

(40) 'යො පන භික්ඛු ජානං යථාධම්මං නිහතාධිකරණං පුන කම්මාය උක්කොටෙය්‍ය පාචිත්තියං'

ඉහත සික්ඛාපදය පාචිත්තිය කොටසේ කුමන වර්ගයට අයත් සික්ඛාපදයද?

සප්පාණක වර්ගය
තුන් වැනිය.

(41) ඉහත සික්ඛාපදයෙහි යථාධම්මං, නිහතාධිකරණං, උක්කොටෙය්‍ය යන පද පහදන්න.

යථා ධම්මං — යම්කිසි අධිකරණයක් විසඳීමට දේශිත ධර්ම නීතිය

නිහතාධිකරණං — සමථක්ඛන්ධකයෙහි කියන ලද නිර්දේශිත විසඳුමෙන (සමථන) කරන ලද

උක්කොටෙය්‍ය — උච්චාලනය හෙවත් උලුප්පීම

(42) ඉහත සික්ඛාපදය කවුරුන් උදෙසා කොහිදී පනවන ලද්දේද?

ෂඩ්වර්ගීය භික්ෂූන් උදෙසා
සැවැත්නුවර දීය.

(43) 'යො පන භික්ඛු ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා ඛීයන ධම්මං පච්ඡා, ආපජ්ජෙය්‍ය පාචිත්තියං'

මෙම ශික්ෂාපදය පාචිත්තිය කොටසේ කුමන වර්ගයට අයත්ද? කීවැනිද? මෙහි දේශිත ධම්මිකානං කම්මානං යනුවෙන් අදහස් කරන විනය කර්ම කීයද? ඒ මොනවාද?

සහධම්මික වර්ගය
නම වැනිය.

සතරකි
අපලෝකන කර්මය, ඤත්ති කර්මය, ඤත්ති දුතිය කර්මය, ඤත්ති චතුත්ථ කර්මය

(44) ඡේදනකං, භේදනකං, උද්දාලනකං යන පද පැහැදිලි කර කවර ශික්ෂාවන්ට අයත්දැයි දක්වන්න.

ඡේදනකං — පළමු කොට කපා දමා පසුව ඇවැත් දේශනා කළ යුතුය.
මඤ්ච ශික්ෂාපදය
නිසීදන ශික්ෂාපදය
කණ්ඩුප්පටිච්ඡාදි ශික්ෂාපදය
වස්සික සාටික ශික්ෂාපදය
නන්දත්ථේර ශික්ෂාපදය.

භේදනකං — පළමු කොට බිඳ දමා පසුව ඇවැත් දේශනා කළ යුතුය.
සූචිඝර ශික්ෂාපදය

උද්දාලනකං — පළමු කොට උදුරා දමා පසුව ඇවැත් දේශනා කළ යුතුය.
තූලෝනද්ධ ශික්ෂාපදය.

(45) පංච ගරු භාණ්ඩ නම් කරන්න.

i ආරාම — මල්වතු (පලතුරු) උයන් වතු
ආරාම වත්‍තු — ආරාම සඳහා ඉඩම්

ii විහාර — ප්‍රාසාද ආදී විහාර
විහාර වත්‍තු — විහාර ඉඩම්

iii මඤ්ච පීඨ භිසි — ඇඳ පුටු මෙට්ට

iv ලෝහ හැලි, වෑ පොරෝ, උදලු, යකඩ ඉන්න ආදිය

v ලී බඩු, මැටි බඩු, උණගස්, තෘණ වර්ග ආදිය.

(46) සුගත චීවරය, වස්සික සාටිකය, නිසීදනය, කණ්ඩු පටිච්ඡාදනය යන ඒවා විස්තර කරන්න.

සුගත චීවරය

භාග්‍යවතුන් වහන්සේ උදෙසා වූ චීවරය සුගත චීවරයයි. මෙය දිගින් සුගත් වියත් නවයකුත් (9) පළලින් සුගත වියත් හයකුත් (6) වන අතර අනෙකුත් සියලුම චීවරයන් සුගත චීවරයට වඩා අඩු විය යුතුය.

වස්සික සාටිකය

වැසි සාර මාසය සඳහා අනුදත් චීවරයයි. මෙය දිගින් සුගත වියත් හයකුත් (6) පළලින් සුගත වියත් දෙකහමාරකුත් (2½) වශයෙන් විය යුතුය. වැසි සාර [illegible] පාවිච්චි කරන්නේ නම් විකප්පනය කල යුතුය.
(ලකුණු 8×4)

නිසීදනය

කාය ගුප්ති, චීවර ගුප්ති, සේනාසන ගුප්ති සඳහා අතුරා හිඳින්නට අනුදැන වදාළ සිවුරකි. මෙය දිගින් සුගත් වියත් (දෙකක්ද) ද පළලින් සුගත වියත් 1½ ක්ද සුගත වියතක දසාවලක්ද . මෙත්විනාව ප්‍රමාණයට කරවිය යුතුය.

කණ්ඩුපටිච්ඡාදනය

මෙය දද වැනි කුෂ්ට අතිසාර හටගත්දරා වැනි අබාධ ඇති භික්ෂූන් හට ඒවායින් වැගිරෙන දිය අ දියෙන් සිවුර අපවිත්‍ර වීම වැළැක්වීම සඳහා නැබින් යට දණින් උඩ හැඳගැනීමට අනුදත් සිවුරකි. මෙය දිගින් සුගත වියත් 4 කුත් පළලින් සුගත වියත් 2 කුත් වශයෙන් විය යුතුය (උ. 8X4)

(47) අකාල චීවර, පුරාණ චීවර, අච්ඡින්න චීවර, අච්චේක චීවර, අතිරේක චීවර පච්චේක චීවර යන මෙම චීවරයන්හි වචනාර්ථ දක්වන්න.

අකාල චීවර — කඨිනය නොඅතුළ කල්හි චීවර මාසය හැර සෙසු එකොළොස් මාසයෙහි අතුළ කල්හි චීවර මාසය හා හේමන්ත සතරවූ සාරමාසයන් හැර සෙසු සත්මාසයෙහි ලැබෙන සිවුරු.

පුරාණ චීවර — පමුණුවා කප් බිංදු තබා එක්වරක් නමුත් හඳින ලද්දා වූ හෝ පොරෝනා ලද්දා වූ හෝ සිවුරු.

අච්ඡින්න චීවර — සොරුන් විසින් පැහැරගන්නා ලද සිවුරු

අච්චේක චීවර — යුද්ධයකට යන්නකු, පිට පළාතකට යන කැමැත්තෙකු, ගිලානකු, ගර්භිණී මාතෘක හෝ හදිසියේ ශ්‍රද්ධාව ලත් අයකු විසින් චීවර කාලයට කලින් දූතයකු යවා හෝ තමොම ඇවිත් වස්සාවාසිකයක් දෙමි යි කියා දෙන ලද සිවුරු

අතිරේක චීවර — අධිෂ්ඨාන විකල්පන සිවුරු අතුරෙහි ඇතුලත් නොවූ හෙයින් අතිරේක වූ බොහෝ තන්තුකාරයන් හෝ ඥාතීන් හෝ අයුලෙහි ලුවකින් හෝ කරන ලද අන්‍යතර චීවර

පච්චෙක චීවර — වෙන් වෙන් වූ සිවුරු

(48) මාසො සෙසො ගිම්හානං, සන්නිධිකාරකං පරිභුඤ්ජනකො, අඤ්ඤාතිකාය භික්ඛුනියා, උදකෙ හසධම්මෙ, අකතුපසම්පන්නං උදක උණ්හොතො, අනාදරියෙ, පුරාණ චීවරං ධොවාපෙය්‍ය, සන්නිධිකාරකං, සමණෙන සංසෙන, නිසීදනං වම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය

යන දෙයාන්වල අර්ථ පහදන්න.

මාසො සෙසො ගිම්හානං — මැදින් මස කල පක්ෂයේ සිට ඇසල මස පුර පක්ෂය තෙක් ඇති කාලය ගිම්හානයයි. ගිම්හානයේ අන්තිම මස පැළුම් දවසේ පටන් හෙවත් පොසොන් මස කල පක්ෂයේ සිට ඇසළ මස පුර පක්ෂය තෙක් ඇති කාලය

සන්නිධිකාරකං පරිභුඤ්ජනකං — පෙරවරුයෙහි පිළිගන්නා ලද ගිතෙල් ආදිය සද්‍රව්‍ය පෙරවරුයෙහිම සාමිස පරිභෝගයද, පස්වරුයෙහි සිට ඒ පිළිගත් දිද ද, පස්වරුයෙහි පිළිගත් ගිතෙල් ආදිය සත්දවසක් සුරක්ෂිතකොට තබා අනුභව කළයුතුය.

අඤ්ඤාතිකාය භික්ඛුනියා — අඤ්ඤාතික භික්ෂුණිය හෙවත් සත්මුතු පරම්පරාවෙ සිට මවුපසින් හෝ පියපසින් නොනෑ වූ උපසම්පන් භික්ෂුණිය.

| | |
|---|---|
| උදකොහඤ්ඤ ඛමෙම | යම් භික්ෂුවක් ගොප්ඛකින් උඩ ජලයෙහි ක්‍රීඩා කිරීම ගැලීම නෑවීම පීනීම දිය යට්ට යෑමාදිය |
| අඟුලු උදක දානකෙනා | ජලේ දැහැමි හැර |
| අනාදරියෙ | සිකපදයේ අවවාද කළහුට හෝ ධම්යට ගැරහීම. මෙය පුද්ගල අනාදරිය හා ධම්මාදරිය වේ. |
| පුරාණ චීවරං ධොවාපෙය්‍ය | වරක් හෝ හැඳින ලද්දා වූ හෝ පොරෝනා ලද්දා වූ හෝ චීවරයක් නෑදෑ නොවූ මෙහෙණක් ලවා සේදවීම හෝ සේදවීම සඳහා වචනයෙන් කීම හෝ කයින් හැඟවීම |
| සමග්ගෙන සංඝෙන | සමාන සංවාස ඇති සමාන සීමාවක සිටින සමඟි සංඝයා සමග |
| සන්නිධිකාරකං | භික්ෂුවක් විසින් රැයක් ගත වූ කිසියම් ආහාරයක් |
| නිත්තං ධම්මානං අනුලොමගෙන වදෙය්‍ය | ත්‍රිවිධ ආපත්තීන් අතරෙන් හොඳම එකක්, සැකයෙන් පවිත ගත අප් ඇවැතින් අන්‍යතර ඇවැතකින් චෝදනා කරයි නම් |
| අට්ඨංගුලපාදකං | සුගත් අඟලෙන් අටඟුල් හා ඇරි |

# පාටිදේශනීය

(1) පාටිදේශනීය සික්ඛාපද කොතෙක් ද ?

සතරකි.

(2) ප්‍රථම පාටිදේශනීය සික්ඛාපදය කුමක් නිසා පනවන ලද්දේද?

එක්තරා භික්ෂුණියක් පිඬුසිඟා ගොස එන අතරමග යනවිට එක්තරා භික්ෂුවක් මගදී දැක ආර්යයෙනි ! අපේ නම් පිඬු ගන්නට යැයි කියාය. භගිනිය! යහපතැයි කියා තෘතයේ පිඬු සියල්ලම ගත්තේය. තවතත් පිඬු සිඟන්නට කල් මදි වූ හෙයින් ඇද ඇදීහ ක්ලාන්ත වූවාය. දෙවන තෙවන දවස් වලද එසේම වූවාය. මේ නුවන මග යන සිටු ගැහැණියට දැන්වූයෙන් ඇය භික්ෂුණිය ගෙට කැඳවා වළඳවා පසුව භික්ෂූන්ට චෝදනා කළාය. එකරුණෙන් මේ සිකපදය අනුදත් සේක.

(3) මෙකල සිදුවිය හැකි පාටිදේශනීය සික්ඛාපදය කුමක්ද ?

චතුර්ථ පාටිදේශනීය සික්ඛාපදය.

(4) පහත පද විස්තර කරන්න.

සේඛ සම්මතානි , ආරණ්‍යසේනාසන පච්චයිතය , සාසංක සම්මතානි , පුබ්බෙ අප්පටිසංවිදිතෙ

සේඛ සම්මතානි — යම්කිසි කුලයක් ශ්‍රද්ධාවෙන් දියුණු වෙයිද , ධනයෙන් පිරිහෙයිද එබඳු කුලයකට සංඝයා විසින් සේඛ සම්මුතිය ප්‍රදාන කෙරෙයි. ඤත්ති දුතිය කම් වාක්‍යයෙන් එවන් සම්මුතිය ලත් කුලයෝය.

ආරණ්‍යසේනාසන පච්චයිතය — විජිය විනිවිද නොගිය විජිය මං සන්ධිය ගාවය යැයි කියන්නා වූ ඇලුම්ගමට පිවිසියේ

පුබ්බෙ අප්පටිසංවිදිතෙ — සේඛ සම්මුතිය ලත් කුලයකට පෙර ආරාධනයක් නොලැබ

සාසංක සමාගාමී — යම් යොමුවක් සම්බන්ධව අරමුණ හෝ ප්‍රයෝජනයේ පිරිසිදු ආශාවක් ඉදිරිපත් කරමින් එය සඳහා කළ යුතු දේ පැවසීම ප්‍රකාශව යොමුව නම් අදාළ යොමුව සාසංක සම්මත වේ.

පුරක අපේක්ෂිත සංවිධානය — යම්කිසි ක්‍රියාවක් හෝ පුද්ගලයෙක් අරමුණ හෝ ආරාම උපකාරයට ඇමතීම 'ස්වාමීනි! අසවල් කුලයෙන් / කුලවලින් අසවල් වේලාවේ දානයක් ගෙනෙන්නෙමු' යි කියා නම් යොමුව කොරන්න කියා සාසංක සම්මතය නම් ඒ බැව් දැනිය යුතුය. 'අසවල් වේලා; අපි දානය ගෙනෙන්නෙමු' යි කියා යෝජනාව නැවත 'අසවල් වේලාවේ මිනිසුන් මෙන් හැකිරේන බැවින් ඉවත්ව යවු' යි කියා කොරන්නට ඇත කල යුත්තේය.

# සේඛියා

(01) සේඛියාශික්ෂා වර්ග නම ලියා දක්වන්න.

පරිමණ්ඩල වර්ගය
උජ්ජග්ඝික වර්ගය
ඛම්භකත වර්ගය
සක්කච්ච වර්ගය
කබළ වර්ගය
සුරු සුරු වර්ගය
පාදුකා වර්ගය

(02) පහත සිකපද කවර නගරයක දී කවුරුන් උදෙසා පනවන ලද්දේ දැයි දක්වන්න.

'න සුරු සුරු කාරකං භුඤ්ජිස්සාමි' - 'සුරු සුරු යන හඬ ඇතිවන සේ නොවළඳමි' යි
කොසඹෑ නුවර දී බොහෝ භික්ෂූන් අරභයා දේශිතය.

'න සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගහෙස්සාමී'ති' සික්ඛා කරණීයා
'ඉඳුල් සහිත අතින් පැන් භාජනය නොපිළිගනිමි' යි හික්මිය යුතුය.
'න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙස්සාමී'ති' සික්ඛා කරණීයා
බත්උලු සහිත පාත්‍රය සේදූ ජලය ඇතුල්ගමෙහි හෝ ඇතුල් ගෙහි නොදමමි යි හික්මිය
යුතුය.

භග්ග දනව්වෙහි දී බොහෝ භික්ෂූන් අරභයා, දේශිතය.

සෙසු සියලුම සේඛිය සිකපදයන්
සැවැත් නුවර දී ඡබ්බග්ගිය භික්ෂූන් අරභයා දේශිතය.

(03) සේඛිය සිකපද ව්‍යතික්‍රමණය කරන්නා වූ භික්ෂුවට සිදුවන ඇවැත කුමක්ද?

දුක්කට

(03) සේඛියා වල, පරිමණ්ඩල වර්ගයේ මුල් සිකපද දෙක හා පෙරළම ඉතා පරිමණ්ඩලං නිවාසෙස්සාමි යන්න අර්ථ දක්වන්න.

පරිමණ්ඩලං නිවාසෙස්සාමි ති සික්ඛා කරණීයා
හාත්පසින් වටකොට අඳනය අඳිමින් හික්මිය යුතුය.

පරිමණ්ඩලං පාරුපිස්සාමි ති සික්ඛා කරණීයා
හාත්පසින් වටකොට සිවුර පොරවමින් හික්මිය යුතුය.

පරිමණ්ඩලං නිවාසෙස්සාමි
අන්තරවාසකයේ නාභි මණ්ඩලය හා ජානු මණ්ඩලය යන දෙමුළු වසා හැඳීමය. මෙසේ හඳින්නනු පිසින් දිග මඩමින් ජංඝලට අඟලක් පමණ පල්ලෙහා පිටිදි හැන්ද යුතුය.

(04) සේඛියා තුළ ගම වැදීම, භෝජනය, දහම් දෙසීම යන ඒවා සඳහා සිකපද කොතෙක් තාවා ඇත්දැයි වෙන වෙනම ලියන්න.

| | |
|---|---|
| ගම වැදීම | 30 |
| භෝජනය | 29 |
| දහම් දෙසීම | 16 |

(05) ඌනය වැළඳීමේදී අතා වැළඳීම තහනම් කර ඇත්තේද? හේතු දක්වන්න.

06. සේඛියා මුල් වර්ගයේ ශික්ෂාපද දහය පාලියෙන් ලියන්න.

පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා
පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා
සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා
සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා
සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා
සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා
ඔක්ඛිත්ත චක්ඛු අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා
ඔක්ඛිත්ත චක්ඛු අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා
න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා
න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා

07. නොගිලන් භික්ෂුවක් තණකොළ මත හෝ පිරිසිදු ජලයෙහි වැසිකිළි කැසිකිළි කිරීම සහ කෙළ ගැසීමෙන් සිදුවන වරද දෙක ලියන්න.

08. නවක භික්ෂුවක් දෙවුර වසා අඳනය හැඳ සිටිනවා දක්නා වූ අනෙක් භික්ෂුවක් දුකුළා වෙත් චෝදනා කරයි. නවක භික්ෂුව අවසර ගෙන දුකුළා සිදු නොවූ බවට කරුණු දක්වයි. නවක භික්ෂුව දක්වන්නා වූ කරුණු මොනවාද?

නොදැනීමෙන් හෝ අමතකවීමෙන් අපරිමණ්ඩල කොට හඳින ලදි.
පරිමණ්ඩල නිවාසනය නොදැන සිටින ලදි.
ගිලන් බවකින් පෙළෙන්නේය.
ආපදා අවස්ථාවක් බැවින් අපරිමණ්ඩල කොට හඳින ලදි.
උම්මත්තක භාවයකින් පෙළෙන්නේය.
යක්ෂාවේශයකින් (ඛිත්තචිත්ත) සිත පෙළෙන්නේය
වේදනාවකින් (වෙදනාට්ට) පෙළෙන්නේය.

# අධිකරණ සමථ

07. සත් වූ අධිකරණ සමථයෝ ලියා දක්වන්න.

| | |
|---|---|
| සම්මුඛා විනය | සංඝ ධර්ම විනය පුද්ගල යන මොවුන්ගේ සම්මුඛත්වයෙන් අධිකරණයක් විසඳීම. |
| සති විනය | අමූලික වූ ශීල විපත්තියෙන් චෝදිත ක්ෂීණාශ්‍රවයන්ට දිය යුතු විනය. |
| අමූළ්හ විනය | උමතු වූ භික්ෂුවට දිය යුතු විනය. |
| පටිඤ්ඤාතකරණය | චෝදිත භික්ෂුවගේ ප්‍රතිඥාව කරණ කොටගෙන අධිකරණයක් සමථ කිරීම. |
| යේභුය්‍යසිකාව | ධර්මවාදී භික්ෂූන් වැඩිය සිට අධිකරණයක් විසඳීම. |
| තස්සපාපීයසිකා | පාපුස්සන්නතාවයෙන් යුත් භික්ෂුවක් පාපී සංඛ්‍යාතව වෙයෙහි නම් එබඳු භික්ෂුවකට දෙන විනය. |
| තිණවත්ථාරකය | යම්කිසි අධිකරණයක් මුල කාරණා සොයාගැනීමට යාමෙන් කුදර වෙයි නම් චෝදක චෝදිත පවතී නම් ඇති ගැටලුයක් තෘණ වසා දැමීම. |

08. සතර විපත්ති ලියා දක්වන්න.

ශීල විපත්ති
ආචාර විපත්ති
දෘෂ්ටි විපත්ති
ආජීව විපත්ති.

(03) සිවු අධිකරණයන් පැහැදිලි කරන්න.

විවාදාධිකරණය — මේ ධර්මය කියා හෝ මේ අධර්මය කියා හෝ ආදියෙන් භේදකර වශයෙන් විවාද කරන්නා භික්ෂූන්ගේ යම් විරුද්ධවාදයක් ඉපදීම.

අනුවාදාධිකරණය — ශීල ආචාර දෘෂ්ටි ආජීව විපත්වලින් චෝදනා කරන්නවුන්ගේ යම් යම් අනුවාද උපවාද චෝදනා හටගැනීම.

ආපත්තාධිකරණ — සප්තාපත්ති ස්කන්ධයෝ ය.

කිච්චාධිකරණ — අපලෝකනාදී සිව් වැදෑරුම් විනය කර්මයෝ.

(04) කවර කවර අධිකරණයන් විසඳීමට හැකි අධිකරණ සමථයන් වෙන වෙනම සඳහන් කරන්න.

විවාදාධිකරණය — සම්මුඛා විනයෙන් හා යේභුය්‍යසිකාවෙන් ද

අනුවාදාධිකරණය — සම්මුඛා විනය සති විනය අමූළ්හ විනය තස්සපාපීයසිකාව යන සතරෙන්ද

ආපත්තාධිකරණය — සම්මුඛා විනය පටිඤ්ඤාතකරණය තිණවත්ථාරකය යන තුනෙන්ද

කිච්චාධිකරණය — එකම සම්මුඛා විනයෙන්ද

වශයෙන් සමථය හෙවත් සංසිඳවීම කටයුතු ය.

(05) අධිකරණ සමථ යනු කුමක්ද?
විවාදාධිකරණාදී සිවු අධිකරණයන් සංසිඳුවීම සඳහා පනවා වදාළ ක්‍රම සතය.

# ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය

# සහ

# ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව

(01) ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය සමාරම්භක වර්ෂය කුමක්ද?

196

(02) ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ප්‍රථම මහානායක මාහිමියන් වහන්සේගේ නම කුමක් ද?

සාසනවංශ කවිරාජ සිරිසද්ධම්මාචරිය යන සංඥාත
අතිපූජනීය අඹගහවත්තේ ඉන්දාසභවරඤාණසාමි (සරණංකර) මාහිමිපාණන් වහන්සේ

(03) ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ප්‍රථම මහෝපාධ්‍යායන් වහන්සේගේ නම කුමක්ද?

අතිපූජනීය වරාපිටියේ සුමිත්ත මාහිමිපාණන් වහන්සේ

(04) ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ වර්තමාන මහා නායක මාහිමිපාණන් වහන්සේගේ නම සඳහන් කරන්න.

හිටපු මහා නායක මාහිමිපාණන් වහන්සේ
අතිපූජනීය වෙවැල්දෙණියේ මේධාලංකාර මහානායක මාහිමිපාණන් වහන්සේ

වර්තමාන මහානායක මාහිමිපාණන් වහන්සේ
අතිපූජනීය නාපානේ ප්‍රේමසිරි මහානායක මාහිමිපාණන් වහන්සේ.

(05) ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ වර්තමාන ලේඛක මාහිමියන් වහන්සේ-ගේ නම කුමක් ද?

අතිපූජනීය මකුලෑවේ විමල නායක මාහිමිපාණන් වහන්සේ.

(06) ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවනු ලැබුවේ කුමන වර්ෂයේද?

1951 - 06 - 18

දෙල්දූව විවේක සෙනසුනේදී පැවිදි පිංකමකින්

(07) ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ ප්‍රථම ප්‍රධාන සභාපති මාහිමි හා ප්‍රධානාචාර්ය මාහිමි දෙනම පිළිවෙළින්.

කඩවැද්දුවේ ජිනවංශ මාහිමිපාණන් වහන්සේ
මාතර ශ්‍රී ඥාණාරාම මාහිමිපාණන් වහන්සේ.

(08) ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රථම උපසම්පදාව සිදුකළේ කුමන වර්ෂයේද?

(09) ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ වර්තමාන අනුශාසක මාහිමිපාණන් වහන්සේ කවුරුන්ද?

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක මහෝපාධ්‍යාය සාසනධජ ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය නා උයනේ අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේ.

(10) ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ වර්තමාන සභාපති මාහිමිපාණන් වහන්සේ කවුරුන්ද?

අතිපූජ්‍ය පහලවිටියල ධම්මානන්ද මාහිමිපාණන් වහන්සේ.

(11) ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ වර්තමාන ලේඛකාධිකාරී මාහිමිපාණන් වහන්සේ කවුරුන්ද?

අතිපූජ්‍ය කහාටොල්ලේ සෝමවංශ ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ

(12) ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ වර්තමාන ලේකම් මාහිමිපාණන් වහන්සේ කවුරුන්ද?

අතිපූජනීය හැඩුන්හල්දෙණියේ ඥානවංශ ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

# විවිධ

(01) සෝණක, මොග්ගලිපුත්තතිස්ස ය, දාසක, උපාලි ය, සිග්ගව ය යන සංගීතිකාරක භික්ෂූන් වහන්සේලා අතුරින් තුන්වෙනි සංගායනාවට නායකත්වය ලබාදුන් භික්ෂූන්වහන්සේගේ නම ලියන්න.

(02) සතියේ දවස් නිසි ක්‍රමයට ලියන්න.

චන්ද්‍රවාර අඟහරුවාර බුධවාර ගුරුවාර

ශුක්‍රවාර සෝරවාර රවිවාර

(03) මාතිකට්ඨ කථාවෙහි පුද්ගල ප්‍රභේදයකට අයත් වචනයක් ඇත. ඒ නම කුමක්ද?

(04) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ජීවිත හැසිරීම් ඇතුළත් මොනවාද?

(05) උපසම්පදා වී අඩුම වශයෙන් වසර 05 ක්වත් ගුරු ඇසුරේ නොසිටින නවක භික්ෂුවට [illegible] සිදුවන ඇවත කුමක්ද?

(06) ආපත්තිකර භික්ෂුව ප්‍රධාන වශයෙන් අන්තරායික කරුණු දෙකකට ලක් වේ. ඒ මොනවාද?

(07) සියදිවි නසාගන්නා භික්ෂුවට සිදුවන ඇවත කුමක්ද?

(08) සියලුම භික්ෂූන් පැනවීමේදී නගරයක් හෝ ජනපදයක් මුල් කරගෙනම පනවා ඇත. පහත සඳහන් නගරයන් අතුරෙන් අදාළ නොවන නගරය තෝරා ලියන්න.

(වෙසාලි, රාජගහ, සාවත්, ආලවි, කොසම්බි, සක්ක, භග්ග, වෙරංජා)
වෙරංජා

(09) [illegible] දේශනයෙහි පනවන ලද [illegible] ලියා [illegible] කුමරුන් සඳහා පනවන ලද්දේ දැයි ලියන්න.

අනුපසම්පන්න සහසෙය්‍යා.

මහා ප්‍රජාපතී දේවියට.

(10) ආපත්තිස්කන්ධ කීයද? ඒ මොනවාද?

07 යි.

පාරාජිකා
සංඝාදිසේස
ථුල්ලච්චය
පාචිත්තිය
පාටිදේසනීය
දුක්කට
දුබ්භාසිත.

(11) විනය කර්මයන්හි දී සංඝයා පස්වැදෑරුම් වේ. ඒ අනුව ඒ ඒ සංඝ පිරිස්වලට කල හැකි නොකල හැකි විනය කර්මයන් ලියන්න.

- අතිරේකවීසති සංඝයාට අබ්භාන ආදී සියලු විනයකර්ම කල හැකිය.
- වීසති සංඝයාට අබ්භාන ආදී සියලු විනයකර්ම කල හැකිය.
- දසවාර්ගික සංඝයාට අබ්භාහන හැර මධ්‍යය දේශයේ උපසම්පදාව ආදී සියලු විනය කර්ම කල හැකිය.
- පංචවාර්ගික සංඝයාට අබ්භාහන හා මධ්‍යය දේශයේ උපසම්පදාව හැර ප්‍රත්‍යයාන්ත දේශවල සියලු විනයකර්ම කල හැකිය.
- චතුවාර්ගික සංඝයාට අබ්භාහන,මධ්‍යය දේශයේ උපසම්පදාව,ප්‍රත්‍යයාන්ත දේශවල උපසම්පදා පවාරණය හැර පිරිවෙස් දීම, මානත් දීම, උපෝසථ ආදී අනෙක් සියලු විනයකර්මකල හැකිය.

(12) ස්වර්ග මෝක්ෂ අන්තරාවන් ඇතිවන්නේ කවර භික්ෂුවට ද?

(13) ආචාර්යවරු පස්දෙනා නම් කරන්න

(14) 'කාලයට අනුව වරදක් නොවේ' යැයි සිතා ඇතැම් භික්ෂූන් මුදල් පිළිගැනීම, විකාල භෝජනය ආදිය කරති. විනය නීතියට අනුව පහදා දෙන්න.

(15) සංවාස නාසනය, ලිංග නාසනය, දණ්ඩ කම්ම නාසනය යන මේවා විස්තර කරන්න.

සංවාස නාසනය. ඇවැත් නොදැකීම් ආදිය නිසා උක්ඛේපනීය කර්මය කිරීම සංවාස නාසනයයි. එම කර්මයට ලක් වූ භික්ෂූන් සමඟ එකට විනය කර්ම කිරීම එකට භෝජනය කිරීම යන සංවාසයන් නැත.

ලිංග නාසන සිවුරු හරවා ගිහි බවට පත්කිරීම. මෙත්තියා භික්ෂුණියට මෙසේ කරන ලදි.

දණ්ඩ කම්ම නාසන සාමණේරය ඔබ අද පටන් භාග්‍යවතුන් වහන්සේ මගේ ශාස්තෘන් වහන්සේ යැයි නොකියවිය යුතුය. අන් සාමණේරයන් සමඟ දෙතුන් රැයක් එකට නිදාගැනීමද නැත. මෙසේ වරද කළ සාමණේරයාට නම් වසා නැගී ආචාර්ය උපාධ්‍යායයන් වසා නැගී විසීමට නොදීමය. සාහරමින් නෙරපාවක් යනුද මෙයමය.

(16) ආජීවය සම්බන්ධයෙන් පනවා වදාළ සයවැදෑරුම් සිකපද කවරේද?

උත්තරිමනුස්සධම්ම පාරාජිකාව
සඤ්චරිත්ත සංඝාදිසේසය
පණීත භෝජන පාචිත්තිය
සූප ඕදන විඤ්ඤත්ති සේඛියාව
පණීත භෝජන පාටිදේසනීය භික්ෂුණියට
ඔබේ විහාරයේ වසන භික්ෂුව රහත් යැයි දැනුම ඇති කෙනෙකුට කියමන් වන ථුල්ලච්චය.

(17) ඡබ්බග්ගිය භික්ෂූන් යුගල වශයෙන් නම් කරන්න.

| | | |
|---|---|---|
| පණ්ඩුක | මෙත්තිය | අස්සජි |
| ලෝහිතක | භූම්මජක | පුනබ්බසුක |
| (සැවැත්නුවර) | (රජගහනුවර) | (කීටාගිරියේ) |

(16) ප්‍රාතිමෝක්ෂයේ සිකපද සම්බන්ධකාරයෝ ඇති පඤ්ඤත්ති කීයද? මොනවාද?

| | |
|---|---|
| මූල පඤ්ඤත්ති | මුල්වරට පනවන ලද ශික්ෂාපදය යි. |
| අනු පඤ්ඤත්ති | මූල පඤ්ඤත්තියට පසුව සකස් කරන ලද කොටස හෝ කොටස් |
| අනුප්පන්න පඤ්ඤත්ති | වරදක් වීමට පෙර පනවන ලද විනය සිකපද ගොවේ. |
| සබ්බත්ථ පඤ්ඤත්ති | දඹදිව මධ්‍ය මණ්ඩලයට හා ප්‍රත්‍යන්ත ප්‍රදේශවලට බලපාන ශික්ෂාපද. |
| පදේස පඤ්ඤත්ති | මධ්‍ය මණ්ඩලයට හෝ ප්‍රත්‍යන්ත ප්‍රදේශවලට හෝ පමණක් සීමාවන ලෙස පනවන ලද ශික්ෂා |
| සාධාරණ පඤ්ඤත්ති | භික්ෂු භික්ෂුණී දෙපිරිසටම පොදු ශික්ෂාපද |
| අසාධාරණ පඤ්ඤත්ති | එක් පිරිසකට පමණක් සාධාරණ ශික්ෂාපද |
| ඒකතෝ පඤ්ඤත්ති | අසාධාරණ පඤ්ඤත්තියමය. |
| උභතෝ පඤ්ඤත්ති | සාධාරණ පඤ්ඤත්තියමය. |

(18) ශික්ෂාපද පැනවීමට හේතු වූ රහතන් වහන්සේලා නම් කරන්න.

අනුරුද්ධ මහ රහතන් වහන්සේ
චුල්ලපන්ථක මහ රහතන් වහන්සේ
බෙල්ලට්ඨසීස මහ රහතන් වහන්සේ
නන්ද මහ රහතන් වහන්සේ.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!.

"විනයො නාම සාසනස්ස ච ආයු"

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ උපසම්පදා විභාගය සඳහා පෙරහුරු පරීක්ෂණ මාලාව-වර්ෂ 2015

නා උයන වන සෙනසුන

පරීක්ෂණ අංක 01(ප්‍රාතිමෝක්ෂය, උපසම්පදාව, උපෝසථකරණය, සීමා, පාරාජිකා) කාලය පැය 03 යි.

---

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. ප්‍රශ්න අංකය සහා අත් අකුරු පැහැදිලි හා නිවැරදි විය යුතුයි.

1) අ). ප්‍රාතිමෝක්ෂය යනු කුමක්ද?.

ආ). ප්‍රධාන වශයෙන් ප්‍රාතිමෝක්ෂය කීවැදෑරුම්දැයි දක්වා පැහැදිලි කරන්න.

ඉ). ප්‍රාතිමෝක්ෂයේ උද්දෙස වෙන්වෙන් වශයෙන් දක්වන්න.

ඊ). සතර සංවර ශීලය කුමක්දැයි පැහැදිලි කරන්න.

උ). උභය ප්‍රාතිමෝක්ෂයේ ශික්ෂා කෙතෙක්දැයි වෙන්වෙන් වශයෙන් දක්වා භික්ෂු ප්‍රාතිමෝක්ෂයට අදාල ශික්ෂා වර්ග වශයෙන් හා ඇවැත් අනුව බෙදා දක්වන්න.

2) අ).උපසම්පදාව යනු කුමක්ද?.

ආ). උපසම්පදා ක්‍රම සියල්ලත් ඒවා කවුරුන් උදෙසා පැනවූයේ ද යන්නත් දක්වන්න.

ඉ). උපසම්පදාවට අභව්‍ය පුද්ගලයන් දක්වා, උපසම්පදාවීමට අවශ්‍ය සුදුසුකම් මොනවාදැයි සඳහන් කරන්න.

ඊ). ඤත්ති චතුත්ථ කම්ම උපසම්පදාව පැහැදිලි කරන්න.

උ). උපසම්පදාව ඉල්ලන අයුරු පැහැදිලිව සඳහන් කරන්න.

3) අ).උපෝසථය යන්න නව ආකාර ප්‍රභේද අනුසාරයෙන් පැහැදිලි කරන්න.

ආ).පුබ්බ කරණ, පුබ්බ කිච්ච, පත්ත කල්ල සඳහන් පාළි ගාථා ලියා එහි එන කරුණු වෙන් කර පෙන්වන්න.

ඉ).වසරේ පෝය සටහන වගු ගතකර දක්වන්න.

ඊ).එක්විසි වජ්ජනීය පුද්ගලයන් කවුරුන්ද?.

උ).ඕවාද දායකයෙකු සතුවිය යුතු ගුණාංග කවරේද?.

4) අ).සීමා රුක් සටහනක් අනුසාරයෙන් දක්වන්න.

ආ).සීමා සම්මතයේ එන ත්‍රිවිද සම්පත්ති දක්වා ඒකාදස විපත් සීමා ලියන්න.

ඉ).සංඝ කර්මයක් "අකෝප්‍ය" වේ පහදන්න.

ඊ).බද්ධ සීමා සම්මතයේදී භාවිතා කරන නිමිති කවරේද?.

උ).චීවර අවිප්පවාස සීමාවක ඇති ප්‍රයෝජනය කුමක්ද?.

5) අ).පළමු පාරාජිකාවට හේතුවන සමතිස් මාර්ග කවරේද?.

ආ).පාරාජිකා සතර උපමා සහිතව නම් කරන්න.

ඉ) සතර පාරාජිකා පාළියෙන් නිවැරදිව ලියන්න.

ඊ).පස්විසි අවහාරය ලියා මනුස්ස විග්ගහය සිදුවිය හැකි ආකාර පැහැදිලිකර උත්තරි මනුස්ස ධම්ම කවරේදැයි පෙන්වා දෙන්න.

උ).පහත පද අර්ථ දක්වන්න.

සික්ඛං අපච්චක්ඛාය, අන්තමංසො. පාරාජිකො හොති අසංවාසො. අදින්නං, ථෙය්‍ය සංඛාතං, සංචිච්චපාණං. ජීවිතා වොරො පෙය්‍ය,අලමරිය ඤාණ දස්සනං . විසුද්ධාපෙක්ඛො.අනභිජානං.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!.
"විනයො නාම සාසනස්ස ච ආයූ"

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ උපසම්පදා විභාගය සඳහා පෙරහුරු පරීක්ෂණ මාලාව-වර්ෂ 2015
නා උයන වන සෙනසුන

පරීක්ෂණ අංක 02(පාරාජිකා,සඞසාධිසෙස, අනියත, නිසැගි පචිති.) කාලය පැය 03 යි.

---

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. ප්‍රශ්න අංකය සහා අත් අකුරු පැහැදිළි හා නිවැරදි විය යුතුයි.

1) අ). සතර පාරාජිකා වල භාවර්ථය ලියන්න.
ආ). සුදින්න භික්ෂුව අරමුණු කොට පනවා වදාළ පාරාජිකාවෙ සප්ත දසාකාරය ලියන්න.
ඉ). ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය සම්පූර්ණ වීමට කරුණු කීයක් බලපානවාද? ඒවා කෙටියෙන් විස්තර කරන්න.
ඊ). සියලු ආපත්ති කිරියාකිරිය ආදී වශයෙන් පංචවිධ වන ආකාරය උදාහරණ සහිතව දක්වන්න.
උ). ප්‍රතිමොක්ෂයේ සියලු සිකපද වලට අදාල සප්ත දසාකාරයෙ නිදානය යනු කුමක්ද? ඒවා කොපමණද?ඒ මොනවාද?.

2) අ). දෙවන පාරාජිකාවේ සප්ත දසාකාරය ලියා දක්වන්න.
ආ). තුන්වන පාරාජිකාවේ නිධාන කථාව කෙටියෙන් විස්තර කරන්න.
ඉ). ප්‍රතිමොක්ෂයේ සිකපද වල සප්ත දසාකාරයට අදාල පඤ්ඤත්ති ආකාර කීයද? ඒ මොනවාද?අනුප්පන්න පඤ්ඤත්තිය යනු කුමක්ද?
ඊ). මනුස්සවිග්ගහ පාරාජිකාවට අදාලව පරිජි,ථුලසි,පචිති,දුකුලා ඇවැත් සිදුවන අවස්තා පෙන්වා දෙන්න.
උ). මනුස්සවිග්ගහ පාරාජිකාවෙ එන ආණත්ති ප්‍රයොගය සම්බන්ධව පස් ආකාර වූද සය ආකාර වූද නියමයක් දැක්වේ එ කවරෙදැයි වෙන වෙනම ලියා දක්වන්න.

3) අ). තුන්වන පාරාජිකාවේ සප්ත දසාකාරය ලියා දක්වන්න.
ආ). සතරවන පාරාජිකාවේ නිධාන කථාව කෙටියෙන් විස්තර කරන්න.
ඉ).බොරු කීම නිසා පරිජි,ථුලසි,පචිති,දුකුලා යන ඇවැත් සියල්ල සිදුවේ පැහැදිලි කරන්න.
ඊ).ආජීවය සම්බන්ධයෙන් පනවා වදාළ සය වැදෑරුම් සිකපද කවරේදැයි පැහැදිලි කරන්න.
උ).සුවිසි පරිජි සඳහන් කර සියලු ආපත්ති ඡෙජ්ජගාමිනී,උට්ඨාන ගාමිනී,දෙශනාගාමිනී වශයෙන් වෙන්කර දක්වන්න.

4) අ). සඞසාධිසේස ආපත්ති පඨමාපත්තික යාවතතියක වශයෙන් වෙන්වෙන් වශයෙන් නම්කර දක්වන්න.
ආ). සඞසාධිසේසආපත්ති පැනවීමටහේතුවූ පුද්ගලයන් දක්වන්න.
ඉ). සඞසාධිසේසආපත්ති ප්‍රතිච්ඡාදනය වීමකෙරෙහි බලපාන කරුණු ලියා පැහැදිලි කරන්න.
ඊ).පරිවාස,මානත මූලායපටිකස්සනය,අබ්භානය යන විනය කර්ම විස්තර කරන්න.
උ).සංඝ භෙදයට හේතු වන අටලොස් භෙදකර වස්තු ලියන්න.

5) අ).පළමු සඞසාධිසේසාපත්තියේ සප්ත දසාකාරය ලියා දක්වන්න.
ආ).උපසම්පදා භික්ෂුවකට කරන චෝදනාව සතර ආකාරයකට කලහැක ඒ කවරේදැයි දක්වා, ආපත්තියකට ලක්වියහැකි ආකාර ලියා දක්වන්න.
ඉ) සඞසාධිසේසාපත්තිවලට අදාල පහත සඳහන් පදයන්ගේ අර්ථය ලියා දක්වන්න.
1.අඤ්ඤත්‍ර සුපිනන්තා.2.විපරිනතෙන චිත්තෙන.3.හත්ථගාහං වා වෙණිගාහංවා.4.දුට්ඨුල්ලාහි වාචාහි.
5.ඔභාසෙය්‍ය.6.අත්තකාමපාරිචරියාය.7.තඩකණිකාය.8.සඤ්ඤාචිකාය.9.අනුද්ධංසෙය්‍ය.10.කුලදූසකො.
ඊ).අනියත යන්නෙහි අර්ථය දක්වා, අනියත සිකපද දෙකෙහි එකිනෙකට ඇති වෙනස්කම් පෙන්වාදෙන්න.
උ).පහත දැක්වෙන විනය කර්ම පාළියෙන් ලියාදක්වන්න.
1.තුන්සිවුරු හා පාත්‍රය අදිෂ්ඨානය සහ පච්චුද්ධරණය.
2.නිසැගි වූ තුන්සිවුරෙහි හා දස දිනක් ඉක්මීමෙන් නිසැගි වූ චීවරයෙහි නිස දෙසීම.
3.බොහො චීවර විකප්පනය හා නිසැගි වූ සත්තාහකාලිකයේ නිසදෙසීම.
4.වස් සමාදානය හා පවාරණය. 5.ආපත්ති දේශනය.

